NAOSL

# ප්‍රතිභා

විද්‍යුත් සඟරාව இ - சஞ்சிகை E - MAGAZINE

# 2024




**Prathibha Vol· 3 – 2024**
**ISSN 2961-5224**

**Hon. Chief Patron**
**Mr. W. P. C. Wickramaratne**
**Auditor General**

**Advisor**
**Mr. S. M. D. S. Sudeesh Rohitha**
**Deputy Auditor General**

**Editor**
**Mrs. M. K. G. Yanika Nandasena**

**<u>පුස්තකාල කමිටුව - 2024</u>**

**ගරු සභාපති**
එල් . එස්. අයි. ජයරත්න මිය

**ලේකම්**
**එම්. කේ. ජී. යානිකා නන්දසේන මිය**
**(පුස්තකාලයාධිපතිනී)**

**සාමාජිකයන්**

**එම්. එස්. නයනකුමාර මයා**

**ඩබ්. පී. ඒ. ෆොන්සේකා මිය**

**එච්. එම්. යූ. එස්. ඒ. විජේකෝන් මයා**

**කේ. එච්. යූ. ඩී. සරත් කුමාර මයා**

**එන්. එච්. ඒ. ආර්. කේ. ගුණරත්න මයා**

**ඊ. ඩී. ඒ. එල්. එදිරිසිංහ මිය**

**එම්. සී. වැලිවිටිගොඩ මෙවි**

**ආර්. පී. එස්. රාජපක්ෂ මයා**

**එස්. එච්.. එම්. අසංක මයා**

## Message of the Auditor General



It is my privilege to pen down the last message to the annual PRATHIBA magazine with immense pleasure. The PRATHIBA magazine is a platform for the officers of the National Audit Office (NAO) to bring-forth their creative mind and inventiveness.

The magazine provides an excellent opportunity to provide a glance of the multifarious all-round developmental activities of our Supreme Audit Institution. It is extremely heartening to note that the NAO in its dedicated quest for excellence and achievement is embracing progressive changes in all aspects of auditing, Literature, Aesthetic activities. The NAO provides a healthy environment in nurturing creativity, competitiveness and teamwork amongst its officers through this kind of magazine.

Fortunately, everyone has now come to realize the truth that auditing means much more than merely acquiring auditing knowledge. It is acquisition of knowledge & skills, building character and improving employability of our talent by sharing among others.

With a firm resolve of inculcating a balance of traditional values and modern dynamisms, the NAO has been successful in producing confident, open minded and responsible officers ready to take on the role of professionally productive auditor. This kind of magazine provides an ideal opportunity to the young prolific minds to put forth their creativity, aspirations and talent through worthy and enjoyable contributions. It also reflects the singular spirit and achievements in multitudinous areas.

I wish the PRATHIBA the very best in all its future endeavors and am certain that this magazine, will continue to achieve new milestones with dedication, perseverance and motivation. I also wish the organizing committee of prathiba , authors and its well-wishers a successful continued journey towards its desired destination.

## පුස්තකාල කමිටුවේ සභාපතිතුමියගේ පණිවිඩය



ලිවීම මානව වර්ගයාගේ වැදගත්ම සංස්කෘතික ජයග්‍රහණයන්ගෙන් එකකි .ශිෂ්ටාචාරය පැන නගින්නේ ලිවීමේ පැමිණීමත් සමඟ ය . ලිවීමකින් තොරව නූතන ලෝකය ප්‍රාථමිකයෙන් වෙන්කර හඳුනා ගන්නා විද්‍යාව, තාක්ෂණය සහ සංස්කෘතිය ජයග්‍රහණය කළ නොහැකි වනු ඇත . ලිවීමට පෙර මානව දැනුම පරම්පරාවෙන් පරම්පරාවට වාචිකව ලබා දෙන ලදී .එබැවින් මෙම දැනුම සමුච්චය කිරීම අතිශයින් මන්දගාමී විය .වාචික කථාව කාලය හා අවකාශය තුළ සීමිතය .කථා කරන දේ ඇසෙන්නේ කථන අවස්ථාවේදී පමණි .අපට කතා කළ හැක්කේ කෙටි දුරකින් පමණි . ලිවීම මෙම සීමාවන් ඉක්මවා යයි .ඊයේ හෝ අවුරුදු දහසකට පෙර ලියා ඇති දේ අපට කියවිය හැකිය.

මිනිසුන්ගේ ජීවිතයේ ලිවීමේ වැදගත්කම කෙතෙක් වීද යත් පුරාණ ජනයා ඊට දිව්‍යයමය සම්භවයක් ආරෝපණය කර ඇත .භාෂාව මෙන්ම ලිවීම ජාතියක බාහිර සංකේත වේ . ලිවීම මානව වර්ගයාගේ ශ්‍රේෂ්ඨතම නව නිපැයුමකි .ශබ්ද භාෂාවෙන් සන්නිවේදනය කළ නොහැකි හෝ දුෂ්කර අවස්ථාවන්හිදී සන්නිවේදනය කිරීමට මිනිසුන්ට ලිවීම උපකාරී වේ .ලිවීමට සංවර්ධනයේ දීර්ඝ ඉතිහාසයක් ඇත .එය ප්‍රාථමික භාවිතයේ සිට වඩාත් පරිපූර්ණ ග්‍රැෆික් සන්නිවේදන ආකාර භාවිතා කිරීම දක්වා දුෂ්කර මාවතකට ගොස් තිබේ .එබැවින් ලිවීම සන්නිවේදනයේ වැදගත්ම මාධ්‍යයක් බවට පත්ව ඇත එවන් පසුබිමක.ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගේ නිර්මාණශීලී ලිවීමේ හැකියාවට අගයක් දෙමින් ප්‍රකාශයට පත්වන ප්‍රතිරාව විද්‍යුත් සඟරාව ජාතික විගණන කාර්යාල පුස්තකාල කමිටුවේ තවත් එක් සුවිශේෂී සේවාවකි.

සාම්ප්‍රදායික පුස්තකාල ව්‍යුහයෙන් ඔබ්බට ගොස් සාහිත්‍යමය රසවින්දනයට, ගවේෂණයට මෙන්ම වෘත්තීය දැනුමෙන් පෝෂණය විය හැකි තෝතැන්නක් ලෙස ජාතික විගණන කාර්යාල පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීම හා පාඨක සේවා පුළුල් කිරීමේ අරමුණු පෙරදැරි කරගනිමින් ගරු විගණකාධිපතිතුමන් විසින් පුස්තකාල කමිටුවක් පත්කරනු ලැබීය.

විගණකාධිපතිතුමන්ගේ මග පෙන්වීම යටතේ නව පුස්තකාල කමිටුවේ පලමු කාර්ය වශයෙන් ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ තෙවන කලාපය මෙසේ ඔබ වෙත ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. මෙම විද්‍යුත් සඟරාව ඉදිරි වර්ෂවලදීද අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත හෙයින් ඒ සඳහා ඔබ සැමගේ සහයෝගය සහ නිර්මාණශීලී දායකත්වය ලැබෙනු ඇතැයි අපි උදක් ම විශ්වාසය පළ කරමු.

ප්‍රතිභා විද්‍යුත් සඟරාව සාර්ථක කර ගැනීමට අනුශාසක දායකත්වය දැක්වූ ගරු විගණකාධිපතිතුමාටද සිය වෘත්තීමය ප්‍රවීණත්වය හා කැපවීම තුළින් මෙම කාර්ය සාක්ෂාත් කර ගැනීමට මහඟු මෙහෙවරක් කළ පුස්තකාලයාධිපතිනියටද මෙම සඟරාව සඳහා නන් අයුරින් දායකත්වය සැපයූ සියලු පාර්ශවයන්ටද අප ප්‍රසාදය පල කරන අතර ජාතික විගණන කාර්යාල පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් ලෙස බලගැන්වීම සඳහා ඔබ සැමගේ අදහස් හා යෝජනා ලබා දෙන ලෙස ඉල්ලීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු.

ස්තූතියි!

**එල්.එස්. අයි. ජයරත්න**
**ජ්‍යෙෂ්ට නියෝජ්‍ය විගණකාධිපති**
**(සභාපති - පුස්තකාල කමිටුව)**

## සංස්කාරකගේ සටහන



මානව සමාජයේ වර්තමාන දියුණු තත්ත්වයට හේතු වී ඇත්තේ මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු එසේ නැතහොත් දැනුම පසු කාලීන පරපුරට භාවිතා කල හැකි අයුරින් වාර්තා ගත කිරීමට ඇති හැකියාවයි. මෙසේ වාර්තා ගතවන තොරතුරු සෙසු අයගේ දැනුම වැඩිකිරීමට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ලබා ගැනීම , සැකසුම, ගබඩා කිරීම, සමුද්ධරණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් වනුයේ පුස්තකාලයයි. අධ්‍යාපනය, පර්යේෂණය, ආර්ථික කටයුතු, දේශපාලන කටයුතු, සංස්කෘතික කටයුතු ආදී විවධ කාර්යයන් නිසා මානව දැනුමට එකතුවන තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත්ව තිබේ. භූගෝලීය, දේශපාලනික, සමාජීය හා සංස්කෘතිකමය කඩඉම් හරහා ගලන තොරතුරු ප්‍රවාහය මෙහෙවීම හා ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම සඳහා ඇති විඥාපන ආයතන අතර පුස්තකාලයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

දැනුම කේන්ද්‍රගත සමාජයක මානව සංහතියේ අභිවර්ධනයට අතිශයින්ම ඉවහල් වූ තාක්ෂණයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කැපී පෙනේ. එබැවින් නූතනයේ පුස්තකාලය හා තොරතුරු සේවා මධ්‍යස්ථානද මේ හා අත්වැල් බැඳගෙන ඇති අතර වර්තමාන පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථාන සම්ප්‍රදායික සේවාවන්ගෙන් ඔබ්බට ගොස් පාඨකයින්ගේ දැනුම හා කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනී. එවන් පසුබිමක ජාතික විගණන කාර්යාල පුස්තකාලය පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමේ යෝජනාවලිය යටතේ “ප්‍රතිභා” විද්‍යුත් සඟරාව ඔබ වෙත ගෙන එන්නේ ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීමේ මූලික පරමාර්ථයෙනි.

මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීමට මග පෙන්වූ ගරු විගණකාධිපතිතුමන්ටත්, උපදේශකත්වය ලබා දුන් පුස්තකාල කමිටුවේ සභාපතිතුමියටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි. එසේම “ප්‍රතිභා” විද්‍යුත් සඟරාව සඳහා නිර්මාණ දායකත්වය සැපයූ ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් පුස්තකාල කමිටුවේ ගෞරවනීය සාමාජිකයින්ටත් බෙහෙවින් කෘතඥ වෙමි. අවසාන වශයෙන් පූර්වයේ පුස්තකාලය භාරව සිටි විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපතිවරුන්ටත් වර්තමානයේ පුස්තකාලය භාර පාලන අංශයේ අධ්‍යක්ෂතුමන්ටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමි .

**එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන**
**වරලත් පුස්කාලයාධිපතිනී**
**(ලේකම් - පුස්තකාල කමිටුව)**

## පටුන


| | | |
|---|---|---|
| 01. | ලිපි | (9-80) |
| i. | නවීන විගණනයේදී උත්පාදක කෘත්‍රිම බුද්ධියෙහි (Generative AI) භූමිකාව: විගණනය සඳහා නව මානයක්. - මහාචාර්ය රුවන් ගමගේ මයා | (9-12) |
| ii. | AUDITORS' ROLE IN DIGITAL BANKING ENVIRONMENT By: Mr.D.M.C.K Jayathilaka | (13-31) |
| iii. | ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා - ජී.ඒ.එම් අයි. ගුණරත්න මයා | (32-37) |
| iv. | මානව අයිතිවාසිකම් වර්ධන ඉතිහාසය - කේ.එන්.එම්.කුමාරසිංහ මයා | (38-41) |
| v. | LKAS 08- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තුමේන්තු වෙනස් වීම් සහ වැරදි - එල්.කේ.ඉන්දික සමන්ත මයා | (42-51) |
| vi. | සියලු දෙනා දැන සිටිය යුතු ඔන්ලයින් නීතිය - වසන්න සිසිර කුමාර මයා | (52-56) |
| vii. | இலங்கையில் உள்ள உள்ளுராட்சி அதிகார சபைகள் கணக்கீட்டு மற்றும் கணக்காய்வு நடைமுறைகள் (Accounting and Auditing Procedure for the Local Authorities in Sri Lanka) By. Mr.A.M.Mahir | (57-71) |
| viii. | ශරීරියට දියවැඩියාව වගේම ආර්ථිකයට උද්ධමනය - එන්. එම්. එස්. ආනන්ද මයා | (72-73) |
| ix. | ඔබ නොයායුතු තැනකි, "බන්ධනාගාරය" - පසන් ලියනාරච්චි මයා | (74-76) |
| x. | නූතන ධනේශ්වර රාජ්‍යන්ගේ යුධමය හා ආර්ථිකමය ආක්‍රමණික ආකල්ප සහ තුන්වන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යන් - තුෂාරි සිංහපුරගේ මිය | (77-80) |
| XI. | දූෂණයෙන් තොර රටක් බිහි කරමු - බී. එන්. ප්‍රශාදිනී මිය | (81) |
| 02. | කෙටි කථාව පළමු පත්වීම - ගිවෝන් යානිකා නන්දසේන මිය | (82-86) |
| 03. | කවි සිතුවිලි | (87-129) |
| 04. | කාටූන් චිත්‍ර | (130-132) |

# ලිපි

**නවීන විගණනයේදී උත්පාදක කෘත්‍රිම බුද්ධියෙහි (Generative AI) භූමිකාව:**

## විගණනය සඳහා නව මානයක්


**මහාචාර්ය රුවන් ගමගේ**

**ජාතික පුස්තකාලය හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය**





ඩිජිටල් පරිවර්තනය ලොව පුරා කර්මාන්ත ප්‍රතිනිර්මාණය කරන යුගයක, විගණන ක්ෂේත්‍රය ද ඉන් බැහැර නොවේ. කෘත්‍රිම බුද්ධියේ (AI) අති නවීන, වේගයෙන් දියුණු වන සහ ජනප්‍රිය ම ප්‍රවර්ගය වන්නේ උත්පාදක කෘත්‍රිම බුද්ධිය (Generative AI - GAI) යි. එමගින් කාර්යාල ක්‍රියාවලීන් කාර්යක්ෂම කිරීම, ඵලදායී කිරීම මෙන් ම මින් පෙර එදිනෙදා පරිගණනයේ දී කළ නො හැකි වූ ප්‍රයෝජන රැසක් ගෙන දීමට සමත් වී තිබේ. එසේ ම එය විගණන කටයුතු විධිමත් කිරීමට මෙන, මූල්‍ය, මෙහෙයුම් සහ වත්කම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට විගණකවරුන්ට සහය වන ප්‍රබල මෙවලමක් ලෙස ද GAI ඉස්මතු වෙමින් තිබේ. විගණන කටයුතු සඳහා, GAI මගින් විප්ලවීය වෙනසක් සිදු කළ හැකි ය.

### 1. GAI යනු කුමක්ද?

GAI යනු පෙළ, රූප, ශ්‍රව්‍ය, බහුමාධ්‍ය මෙන් ම පරිගණක කේත ද ඇතුළුව නව අන්තර්ගතය හෝ දත්ත නිපදවිය හැකි යෙදුම් වර්ගයකි. මෙම පද්ධති පුහුණු කර ඇත්තේ, මාර්ගගතව ඇති දත්ත විශාල ප්‍රමාණයක් කැවීමෙනි. එහෙත් එම දත්තවලට සීමා නො වී, මිනිස් මොළය ක්‍රියා කරන ආකාරයට තරමක් සමාන ආකාරයකින්, පෙර දැනුම මත පදනම් වෙමින් නව දැනුමක් නිර්මාණය කිරීමට ඊට හැකි ය. දත්ත රටා සහ ප්‍රවණතා ඇසුරින් නව දැනුම හෝ නිර්දේශ ජනනය කිරීමට ඊට හැකියාව ඇත. ඒ අනුව, විවිධ වෘත්තීන්ට ගැලපෙන පරිදි විශේෂඥ දැනුමක් පවා නිර්මාණයට මෙයින් ඉඩ කඩ සැලසී තිබේ.

විගණකයින් සඳහා, GAI හි වැදගත්කම පවතින්නේ වාර්තා සැදීම ස්වයංක්‍රීය කිරීමට, වත්මන් දත්ත මත පදනම්ව විභව ප්‍රතිඵල අනුකරණය කිරීමට සහ සම්ප්‍රදායික විගණන ක්‍රම නොසලකා හැරිය හැකි විෂමතා හෝ රටා හඳුනා ගැනීමට ඇති හැකියාව තුළ ය.

GAI යෙදවුම්වල ප්‍රධාන කොටසක් වන්නේ තමන්ට අවශ්‍ය කාර්යය යෙදවුමට දැනුම් දීමට අවශ්‍ය වන දත්ත ආදාන උපක්‍රමය යි. බොහෝ විට මෙය පෙළ (text) ආදානය කිරීමට ඇති හිස් කොටුවකි. නැති නම් හඬ පටිගත කරන මයික්‍රෆෝන අයිකනයකි. නැති නම් ඡායා රූපයක් හෝ වෙනත් පරිගණක ගොණුවක් උඩු ගත කිරීමට අවශ්‍ය අයිකනයකි. මේ කුමන ක්‍රමයකින් හෝ දත්ත ආදානය හඳුන්වන්නේ පාඨ මෙහෙයවීම (prompt engineering) යනුවෙනි. එය සිතා මතා, හොඳින් දැනුවත්ව ආදානය කළ යුතු ය. මන්ද, යෙදවුම මගින් ලබා දෙන ප්‍රතිදානයේ (output) තත්ත්වය තීරණය වන්නේ ආදානයේ තත්ත්වය මත බැවිනි. මෙහි දී 'ඇතුළට කුණු දැමුවෝතින් එළියට එන්නේ ද කුණු ය' (garbage in – garbage out) යන ජනප්‍රිය කියමන සිහියට නැඟේ.

**තව ද, ආරම්භයේ දී ම සිහි තබා ගත යුතු කරුණක් වන්නේ GAI වැරදි තොරතුරු නිර්මාණය කළ හැකි බව යි. මේ වන විට GAI යෙදවුම්වල නිරවද්‍යතාවය ඉතා ඉහළ අගයක් ගන්නා නමුත් එමගින් විගණකවරයා ගේ කාර්යභාරය සම්පූර්ණයෙන් අත්පත් කර ගනු ඇතැයි සිතීම උගහට ය. සිදු වන්නේ විගණකවරයාට විශ්වාසදායී සහ අති කාර්යක්ෂම සහායකයකු ලැබීම යි.**

ChatGPT, Gemini වැනි උදාහරණ ඉතා ජනප්‍රිය සාමාන්‍ය භාවිතය සඳහා ඇති GAI යෙදවුම් ය.

## 2. විගණනයේදී GAI හි ප්‍රධාන යෙදුම්

### a. ස්වයංක්‍රීය වාර්තා උත්පාදනය

විගණනයේ වඩාත්ම කාලය ගත වන අංගයක් වන්නේ විස්තරාත්මක වාර්තා ජනනය කිරීමයි. දත්ත විශ්ලේෂණය කිරීමෙන් ඇති කරගත් අවබෝධය, අවදානම් මූල්‍ය කටයුතු හඳුනා ගැනීමට භාවිත කළ හැකි අතර, නිර්දේශ පැහැදිලිවත්, ව්‍යුහගතවත් පෙන්වන ලෙස වාර්තා නිෂ්පාදනය කිරීමට ඊට හැකි ය. අවශ්‍ය වන්නේ මූලික දත්ත ලබා දීම පමණි. මෙමගින් අත්හුරු ක්‍රමයට වඩා කාර්යක්ෂමව අදාළ වාර්තාව නිම කළ හැකි ය. එසේ ම අත්හුරු ක්‍රමයට සැකසූ දළ වාර්තාවක් සඳහා ඉහළ මට්ටමේ විශ්ලේෂණයක් ලබා දිය හැකි ය. එසේ ම විගණකවරයාට මඟ හැරුණු දත්තයක් හෝ තීරණයක් කෙරෙහි අවධානය යොමු කිරීමට GAI කටයුතු කරනු ඇත.

### b. දත්ත රටා හඳුනාගැනීම සහ විෂමතා හඳුනාගැනීම

විගණනයේ දී බොහෝ විට සිදු වන්නේ මූල්‍ය ගනුදෙනුවල සහ මෙහෙයුම් කටයුතුවල අක්‍රමිකතා සහ අකාර්යක්ෂමතා සමාලෝචනය කිරීම යි. එය එක් අතකින් ඉතා වෙහෙසකර කටයුත්තකි. කෙසේ නමුත්, ඉතිහාසගත විගණන දත්ත මත පුහුණු කරන ලද GAI පද්ධති මගින්, වංචනික ගනුදෙනු, අනුකූලතා කඩ කිරීම්, අකාර්යක්ෂමතා, අපේක්ෂිත සම්මතයන්ගෙන් බැහැර වන අවස්ථා සහ වෙනත් විෂමතා ස්වයංක්‍රීයව සලකුණු කළ හැක. මෙම ක්‍රියාකාරී ප්‍රවේශය මගින් ගැටලු ඉක්මනින් හඳුනා ගැනීමට හැකි අතර, අවදානම උත්සන්න වීමට පෙර ඒවා අවම කිරීමට උපකාරී වේ.

මේ වන විට Deloitte සහ PwC වැනි ප්‍රමුඛ පෙළේ ගිණුම්කරණ සමාගම්, දත්ත සැකසීම සහ තීරණ ගැනීම වැඩි දියුණු කරමින්, ඔවුන්ගේ විගණන ක්‍රියාවලීන්ට AI මෙවලම් ඒකාබද්ධ කර ඇත. AI මත පදනම් වූ විගණනය මඟින්, කනිෂ්ඨ ගණකාධිකාරීවරුන් විසින් සිදු කරන පුනරාවර්තී (repetitive) කාර්යයන් ඉටු කිරීමේ අවශ්‍යතාවය අඩු කර තිබේ. ඒ වෙනුවට ඉහළ වටිනාකමක් ඇති උපාය මාර්ගික ක්‍රියා කෙරෙහි ඔවුන් ගේ අවධානය යොමු කිරීමට එම සමාගම්වලට ඉඩ සැලසී ඇත.

### c. පුරෝකථන විශ්ලේෂණය සහ අවදානම් තක්සේරුව

GAI හි තවත් ප්‍රබල යෙදුමක් වන්නේ විභව අවදානම් අවස්ථා පිළිබඳ අනාවැකි කීමේ හැකියාවයි. ඓතිහාසික සහ වර්තමාන දත්ත විශ්ලේෂණය කිරීමෙන්, AI හට අනාගත අවදානම් තක්සේරු කිරීමට

විගණකවරුන්ට උපකාර විය හැකිය. දිගු කාලීන මූල්‍ය පුරෝකථනය කිරීම හෝ මෙහෙයුම් අනුකූලතාව සඳහා මෙවැනි විශ්ලේෂණ විශේෂයෙන් ප්‍රයෝජනවත් වන අතර, ප්‍රතිඵල පුරෝකථනය කිරීම මගින් උපායමාර්ගික තීරණ ගැනීමට අදාළ ආයතනයට උදව් විය හැකි ය.

**d. ලේඛන සාරාංශ කිරීම හෝ දිගු කිරීම**

මෙය GAI හි ඉතා ජනප්‍රිය භාවිතයකි. ඉතා විශාල දිගකින් යුතු ලේඛනයක්, අවශ්‍ය දිග ප්‍රමාණයේ සාරාංශයක් බවට පත් කිරීමට ඊට ගත වන්නේ තත්පර කිහිපයක් පමණි. මෙහි ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය ද ඉතා පහසුවෙන් කළ හැකි ය. එනම් කෙටි සාරාංශයක් ලබා දුන් විට අවශ්‍ය දිග ප්‍රමාණයට ලේඛනය දිග හැර ලිවීමට ද ඊට හැකියාව ඇත.

**3. විගණන කටයුතු සඳහා GAI භාවිතයේ වාසි**

**a. වැඩි දියුණු වන කාර්යක්ෂමතාව**

දත්ත එකතු කිරීම, වාර්තා ලිවීම සහ විෂමතා හඳුනා ගැනීම වැනි සාමාන්‍ය විගණන කාර්යයන් සඳහා වැය කරන කාලය සහ ශ්‍රමය සැලකිය යුතු ලෙස අඩු කිරීමට GAI හට හැකිය. මෙම ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම මගින්, විගණකවරුන්ට උපාය මාර්ගික සැලසුම්කරණය, ගැඹුරු විශ්ලේෂණය සහ සේවාදායක උපදේශනය වැනි ඉහළ වටිනාකම් සහිත ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ හැකිය.

**b. වැඩි දියුණු කළ නිරවද්‍යතාව**

AI මගින් ක්‍රියාත්මක වන විගණන මෙවලම් අතින් දත්ත විශ්ලේෂණයේ පොදු ගැටලුවක් වන මානව දෝෂ අවම කරයි. GAI සමඟින්, සෑම ගනුදෙනුවක් ම, සෑම දත්ත ලක්ෂ්‍යයක් ම නිරවද්‍ය ලෙස සකසනු ලබන අතර, වඩාත් නිවැරදි විගණන ප්‍රතිඵල සහ සොයා ගැනීම් ලබා දෙයි.

**c. අන්‍යෝන්‍ය කාර්යකාරිතාව (interoperability)**

බොහෝ විට විගණන දත්ත ප්‍රමාණයෙන් විශාල ය. ඒවා හැසිරවීමට ඉතා ඉහළ පරිගණන ධාරිතාවයක් අවශ්‍ය වේ. නමුත් GAI මගින් ඉතා විශාල දත්ත පරිමාවක් ඉතා කෙටි කාලයකින් (ඇතැම් විට විනාඩියකට අඩු කාලයකින්) පිරිසැකසුම් කර පිළිතුරු ලබා දෙයි. එනිසා, බහුවිධ ආයතන හෝ දෙපාර්තමේන්තුවලට අයත් දත්ත, ඉතා සුළු කාලයකින් සැකසීමට සහ විශ්ලේෂණය කිරීමට ඊට හැකි ය.

**4. ආචාර ධර්මීය අභියෝග (Ethical challenges)**

විගණනයේදී GAI හි ප්‍රතිලාභ සැලකිය ලෙස ඉහළ වන නමුත්, මෙම තාක්ෂණය භාවිතා කිරීමේ දී ආචාර ධර්මීය කරුණු කිහිපයක් පිළිබඳව ද ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය. විගණන ක්‍රියාවලිය යනු රහස්‍යභාවය ඉහළින් රැකිය යුතු ක්‍රියාවලියකි. එම යෙදවුම්වලට ඇතුළත් කරන පෞද්ගලික තොරතුරු අදාළ නිර්මාණය අයත් සමාගමටත්, වෙනත් පාර්ශ්වකරුවන්ටත් ලබා ගැනීමට හැකියාව ඇත. එය තොරතුරු පිරි සැකසීමේ විනිවිදභාවය පිළිබඳව ද ගැටලුවකි. අදාළ ආයතන තම යෙදවුම් වැඩි දියුණු කිරීම සඳහා පරිශීලකයන් විසින් ලබා දෙන ලද තොරතුරු සහ ඒවාට යෙදවුම ලබා දුන් පිළිතුරු අධ්‍යයනය කරන නිසාත්, ලබා දුන් තොරතුරු, අදාළ යෙදවුම පුහුණු කිරීම සඳහා නැවත යොදා ගත හැකි නිසාත්, ඒ පිළිබඳව පරිශීලකයන් සැලකිලිමත් විය යුතු ය. එසේ ම, අදාළ යෙදවුම් නව දැනුම නිර්මාණය කරන්නේ, යෙදවුම පුහුණු කිරීමට භාවිත කරන ලද තොරතුරු සහ යෙදවුම දියුණු කරන ලද මත පදනම්ව ය. එම දැනුම සහ ඇල්ගොරිදම පක්ෂග්‍රාහී විය හැකි ය. ආචාර ධර්මවලට අදාළ තවත් කරුණක් වන්නේ විගණනය සඳහා GAI භාවිතයට ප්‍රමාණවත් ලෙස විගණකවරුන් පුහුණු කර ඇති ද යන්න යි.

මේ අනුව GAI හට බොහෝ තාක්ෂණික කර්තව්‍යයන් හැසිරවිය හැකි නමුත්, සොයා ගැනීම් අර්ථ නිරූපණය කිරීමට, සදාචාරාත්මක විනිශ්චයන් කිරීමට සහ විගණන ප්‍රමිතීන් යෝග්‍ය ලෙස යෙදීමට මානව අධීක්ෂණය අත්‍යවශ්‍ය වේ.

## 5. අනාගතය

ඉහත කරුණු සැලකීමේ දී පැහැදිලි වන්නේ විගණන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම සහ නිරවද්‍ය ක්‍රියාවලියක් බවට පත් කිරීමට GAI මඟින් අනගි සහයක් ලබා දිය හැකි බව යි. එමගින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල පාලනයේ වගවීම, විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා GAIවල කාර්ය භාරය අතිමහත් ය.

කෙසේ නමුත් දැනට එහි වැඩි සාර්ථකත්වයක් ඇත්තේ ඉංග්‍රීසි වැනි ලෝකයේ වැඩි ජනගහනයක් භාවිත කරන ජාත්‍යන්තර භාෂා සමග වැඩ කිරීමට යි. නමුත් සිංහල, දමිළ වැනි දේශීය භාෂා සමග කටයුතු කිරීමට ඊට ඇති හැකියාව ද අවතක්සේරු කළ නො හැකි ය. ඉදිරියේ දී මේ තත්ත්වය තවත් දියුණු විය හැකි බවට පුරෝකථනය කෙරේ.

කෙසේ වෙතත්, සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා GAI හි බලය සහ සදාචාරාත්මක උපමාන අතර මනා සමතුලිතතාවයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම නැඟී එන තාක්ෂණය වැලඳ ගැනීමෙන්, ඩිජිටල් යුගය සඳහා විගණන භාවිතයන් නවීකරණය කිරීමට ජාතික විගණන ආයතනයට හැකියාව ඇත. මේ අනුව GAI යනු අනාගතය සඳහා මෙවලමක් පමණක් නොවේ; එය වඩාත් සුරක්ෂිත සහ විනිවිද භාවයෙන් යුත් හෙටක් සහතික කිරීම සඳහා විගණකවරුන්ට අද භාවිතා කළ හැකි සම්පතකි.



# AUDITORS' ROLE IN DIGITAL BANKING ENVIRONMENT

**By:** D.M.C.K Jayathilaka
Superintendent of audit.
HDFC bank

## OVERVIEW OF DIGITAL BANKING

Banks are fundamental component of an economy which underpin all other components of the economy. Banks play a vital role in an economy since it facilitates for capital inclusion to businesses and carry out transactions which are essential for efficiency of corporate sector. Moreover, banks provide liquidity to the entire economy. Due to adaptation of advanced information technologies, many industries have achieved various benefits in terms of financial and operational aspects. One such industry that has been enormously benefited is banking sector. Usage of digital channels to the banking operations has created dramatic changes in the industry. Results of a recent survey conducted in European region has established the importance of the digitalization of banking processes. Most of the banks viewed digitalization as an important strategy.




Figure :01

Source: survey results, The financial brand.com

Today digital banking has touched a new phase of competition because of its characteristics like speed, efficiency, decreasing the expenses and gaining benefit of the unique opportunities. Moreover, Rapid innovations implemented by leading global banks and changes in customer's lifestyle have necessitated the digital adoption into Sri Lankan banks. Covid 19 also stimulated and expedited digital transformation of banking industry in Sri Lanka. Some of the Sri Lankan banks have able to initiate quick steps to grab this opportunity by introducing online banking, mobile banking, digital wallets and digital payment systems.




Figure:02

Source: survey results, The financial brand .com

For instance, the commercial bank of Sri Lanka has digital offerings include revolutionary products like ComBank Digital, a fully integrated online banking platform, and ComBank e-Passbook, the first of its kind in South Asia. The bank offer ComBank Q+, the first QR code-based app certified by LANKAQR, catering to retail customers and merchants. Flash Digital Bank Account is certified by LANKAQR, ensuring integration with digital payment systems. The bank's recently issued Point-of-Sale (POS) machines are QR code compatible to enable digital payments.

## WHAT IS DIGITAL BANKING?

Digital banking is viewed as the process by which a customer carries out banking transactions electronically without going to a brick-and-mortar institution (Simpson, 2002). Digital banking implies provision of banking products and services through electronic delivery channels (Nitsure, 2003) According to a paper issued by Basel Committee on banking supervision, (2003) digital banking is defined as the provision of retail and small value banking products and services through electronic channels.

According to above definitions, digital banking encompasses many digitalized banking products and services. Such products and services can include deposit taking, lending, account management, the provision of financial advice, electronic bill payment, and the provision of other electronic payment products and services such as electronic money, digital wallet. Different authors have given different definitions of digital banking and the definitions being given depends on or varies amongst the researchers. Daniel (1999) digital banking also refers to online banking where person can do banking transactions while log in to web site. The term "electronic banking" or "Digital banking" covers mobile banking as well. Digital banking is broader in scope than online banking because it encompasses the border use of electronic methodologies including automated teller machines (ATM), mobile banking, internet banking, electronic fund transfer (EFT), point of sale (POS) etc.

## LEVEL OF DIGITAL BANKING OF SRI LANKA

In Sri Lanka, Digital banking was first introduced by the Sampath Bank in 1988. Since then, digital banking in Sri Lanka has improved a lot. According to the payment bulleting report of the central bank of Sri Lanka, at the end of year 2022,

4026 number of ATM machines operating in Sri Lanka and total value of financial transaction conducted through the ATM was Rs 5721.8 billion. Further, report emphasize that at the end of 2022 year, 103434 number of Point of sales (POS) terminals was operating in Sri Lanka and total value of POS transactions was Rs 1001.4 billion. When it is come to mobile banking 27,892,000 number of transactions had been performed through mobile banking platforms and the value of that transactions were Rs 536 billion. In 2022 (first Q 1) its value was Rs 188 billion. Further, value of mobile transaction handling by the end of Frist quarter of 2022 was Rs 188 billion. Digital banking transaction volume was 135,386,000 and value Rs 6469 billion. In the year of 2022 (first Q) value was Rs 2062 billion.

In an era marked by the COVID-19 pandemic, digital payments in Sri Lanka have experienced remarkable growth. Transactions have increased from Rs 5.6 trillion in Q1 2021 to RS 9.4 trillion in Q1 2023, representing a growth rate of 68% over 2 years. The value of transactions via the Lanka QR digital payment gateway amounted to Rs 681 million in Q3 2023, showing a growth of 84% year-on-year

Even though digital banking expanding its position from desktop PC to mobile phone, Sri Lankans still resistance to adopt digital banking is becoming a huge problem. Due to majority of Sri Lankans are not technologically savvy, the banks have to adopt a ‘wait and see’ attitude. But due to the COVID pandemic situation, importance and the usage of digital channels has been increased.

## LAWS AND REGULATIONS RELATING TO DIGITAL BANKING.

Government of Sri Lanka has enacted legalization to provide directions, guidelines and regulations to supervise and monitor digital payment systems to ensure that the

payment systems are efficient, reliable, secure and cost effective from the perspective of the customers.

Central bank Sri Lanka (CBSL) is the main monitoring body of all commercial banks and specialized banks in Sri Lanka. CBSL primarily issues laws and regulations in relation to digital banking in Sri Lanka.

Payment and Settlement Act, no 28 of 2005 states that the Central bank be the authority for the preparation of a plan for a national payment system and regulation, supervision and monitoring of payments and provide for the disposition of securities. The guidelines and directions issued by Central bank in pursuance of the payment and settlement Act, No.5 of 2005 has laid down the operational procedures, system integrity and safety required for introducing a digital payment system in the country. Electronic transactions act, No. 19 of 2006 encourages the use of reliable form of electronic commerce also strengthens growth of digital systems in the country. The banks that intend to provide mobile based payment solutions are safeguarded by the Act.

Payment devices frauds act, No. 30 of 2006 has listed 19 offences, which are punishable. The offences include highly sophisticated form of payment card frauds using new technology such as skimming, wiretapping, which are considered as biggest threats faced by the payment card industry. Computer Crimes act, No. 24 of 2007 also supplements the above Act in mitigating payment card frauds related to electronic payment systems. Service providers of payment card regulations No.1 of 2009 act emphasized that the appointment of the Central bank as the supervisory authority responsible for the regulation and monitoring of service providers of payment cards.

## AUDITORS' ROLE IN DIGITAL BANKING ENVIRONMENT

It is obvious that auditor cannot continue to use outdated methodologies in a digital-first environment. The audit function must undergo a holistic digital transformation in order to match with the rapid innovations in the banking industry. This not only requires auditors to use technological tools in performing audit processes, but it also requires a mindset change and skill set improvement.

**Required Transformation process of an auditor**




Figure: 03

Source: Author constructed

## Digital awareness and Proactive risk assessment

To ensure a successful audit of online banking facilities, mobile banking and other electronic payment applications, the audit team should understand the business environment in which bank operating in and the prevailing conditions such as regulatory requirements, business requirements and stakeholders' needs.

The audit team needs to execute a robust Internet/Mobile banking & Electronic Payment application audit procedures to effectively identify risk inherent in the digital banking processes, internal controls that are mitigating the risk and adequacy and effectiveness of controls in mitigating identified risks.

The international Auditing and Assurance Standards board (IAASB) has issued revised international Standard on Auditing (ISA 315), identifying and assessing the risk of Material misstatement in December 2019.The revised standard addressees the issue of technological complexity of business environments due to advanced usage of IT by significantly enhancing the auditor's consideration in relation to entity's use of IT and its impact on the audit. The standard emphasizes the need of more robust understanding of the entity's control environment including its IT controls.

To make a sound risk assessment, auditor should have a better digital awareness. Then only auditor can identify potential risk of digital banking operations. Highlighted below are some of the areas of the internet/mobile banking applications and supporting IT infrastructure that should be reviewed to confirm the adequacy of controls to mitigate risk and ensure security of internet/mobile banking applications.

1. **Application Security Review:**

Application controls should be reviewed in line with business rules set through organization's information security policies, standard operating procedures and regulatory requirements to perform the transactions. Controls include authentication/authorization controls such as password security controls, security questions and answers, multi-factor authentication (One-time passwords, tokens). The functional requirement of the application should be validated during the audit

to confirm that the application is fit for intended purpose and meeting the need of stakeholders.

More importantly, applications such as internet/mobile banking Apps are not standalone processes. It is usually integrated with the core banking system of the bank. Therefore, the interface through which the Internet/Mobile Banking application is integrated with core banking system should be reviewed to ensure that it complies with security standard/leading practice for security controls. The Audit team should also ensure that Internet /Mobile Banking and other electronic payment applications for end-to-end encryption of transactions and communication/data exchange at all levels of the application.

2. **Database Security Review:**

The database controls should be reviewed in line with the approved database security configuration. At least following key point should be addressed in the audit program.

- Ensure that users granted access to the database are authorized and the need for such access.
- Ensure that access privileges are based on job function.
- Super users on the database must be identified to ensure that their access is authorized and required for their function. Because super users have more privileges than the ordinary uses and super user always a risk in auditor's point of view.
- All accounts on the database must be verified to prevent unauthorized access. Auditor must see whether there is a periodic user access review to prevent unauthorized access.

- Users must be given uniquely identifiable user IDs and passwords to access the database to ensure accountability of activities.
- Password rules set for the database must be in line with the organization's chosen password policy (e.g., complexity requirement, length, reuse, expiration, lockout, etc.) to ensure use of strong passwords.
- Whether the audit trail/log (trace logs) of the database are activated and backed up externally.
- User access to the database is regularly reviewed for adequacy and relevance and exceptions/anomalies are identified for management action.

3. **Logical Access Controls Review:**

Review of users' access is important on the Internet/Mobile Banking or other electronic payment application(s) and databases to ensure that access is still valid and relevant for their job functions. credentials All staff of the organization who perform admin or support functions on the Internet/Mobile Banking or other electronic payment should be protected to prevent their credentials being used for unauthorized access into the system. Also, accounts of staff members who are on vacation/leave or retired should be disabled from the application as appropriate. A procedure for access review should be put in place to ensure regular review of users' access on the application and invalid access are promptly deleted/deactivated to prevent unauthorized access. Also access logs or audit trails such as, login audit trail (successful/failed/attempted), logout audit trail, activity audit trail should be captured to aid in the investigation of security breaches in the application when the need arises.

4. **Password Security Review:**

Password parameters selected for the application should be secure and conform to the organization's adopted password security policy. Password requirements such as, password length (e.g., minimum of 8 characters), alphanumeric and special character, complexity requirement, password reuse, ageing and lockout controls should be implemented as appropriate. This is to ensure that users have complied with the organization's password policy in selecting password which guaranteed strong passwords.

5. **Business Continuity Management & Disaster Recovery:**

Given the importance of the Internet/Mobile Banking and other electronic payment application to the financial institutions in delivering financial/payment services to their customers, the application should be part of the institution's business continuity and disaster recovery plan. As such, the application should be recoverable in the institution's disaster recovery (DR) site. The application's infrastructures (servers) should be available at the DR site. The application should also be scheduled for simulation testing as part of the institution's disaster recoverability testing plan. Evidence of such recoverability test should be requested and reviewed by the audit team for their adequacy. A disaster recovery procedure/plan should be developed for the Internet/Mobile Banking & payment application.

## REQUIRED QUALIFICATION AND CONTINUOUS TRAINING.

Auditing a computer system is a complex task. The type of software can vary while small companies may use readily available general accounting software that fulfils their requirements, larger companies will often have specific software designed and installed to suit their needs. In many cases, core banking software solutions are designed to cover all, or the majority of, the core functions of a bank. Regardless of the computer systems used, the audit objectives and approach will remain largely unchanged from the audit carried out in a non-computer environment.

Generally, approach of Auditing around the computer is not reliable when systems are more sophisticate and real-time. Specially, with the rapid digitalization of banking sector the usage of "real -time" computer environments have significantly increased. In a fully digitalized environment, there may only be a limited amount of source documentation or paperwork. Therefore, the auditor may employ an approach known as "auditing through the computer". This involves the auditor performing tests on the IT (Information Technology) controls to evaluate their effectiveness.

Testing IT controls is a complex task. A high degree of skill and experience often involving IT audit. Without required skills and knowledge, performing an IT audit of a bank is a daunting task. Therefore, specialists are necessary to undertake such an evaluation of the IT controls. Central bank of Sri Lanka (CBSL) understood the gravity of having a IT specialist in an internal audit team. CBSL recently published a banking direction number 16 of 2021 on 09$^{th}$ December 2021 in relation to the Regulatory Framework on Technology Risk Management and Resilience for Licensed Banks. That Regulatory Framework emphasis the importance of having an audit team member with Acedamic and professional qualification such as,

- ISACA Certified Information Systems Auditor (CISA)
- (ISC)2 Certified Information Systems Security Professional (CISSP)
- Global Information Assurance Certification (GIAC).
- Master's Degree in Information Security or Master's Degree in Computer Science/Information Technology specializing in Information Security.

More importantly IT audits need to be conducted in accordance with the recommended standards and guidelines. Following are some of the standards/guidelines/frameworks which provides the core principles for the auditors to test the IT environments and controls of a bank.

- ISO/IEC 27002-2022- Information technology
- ISO/IEC 27001-2013 - international standard for Information technology — Security techniques — Information security management systems — Requirements
- ISO 22301:2019 - Security and resilience, BCP
- ISO/IEC 20000-1:2018 - Information Technology Service management
- ISO/IEC 27017:2015 - security control for cloud services
- ISO/IEC 27033:2015 Network Standard
- Payment card industry data security standard (PCI DSS)
- COBIT 5/5e
- CIS v8 –Center for Internet Security.
- ITIL v4 Framework – (Information Technology Infrastructure Library) The set of best-practice procedures and processes for IT and digital service management.
- NIST V1.1- (National Institute of standards and technology) Core Framework

- PAS 555:2013 - Cyber Security Risk - Governance and Management by BSI
- BSS – Baseline security Standard –Central Bank of Sri Lanka-Based on ISO27001
- Regulatory Framework on Technology Risk Management and Resilience for Licensed Banks- Central Bank of Sri Lanka

Training programs to increase staff knowledge are important since it creates valuable assets with in the audit team. Auditors must have an updated knowledge on the aforementioned standards so that no regulator or monitoring organization can accuse the auditor being negligence. Specially the central bank of Sri Lanka more focus on BSS – Baseline security Standard –CBSL-Based on ISO27001 and the Regulatory Framework on Technology Risk Management and Resilience for Licensed Banks. Continuous training on IT audits will support to create an inhouse specialists. Ad-hoc training will not give expected improvement and give no value addition. These training activities must link to IT audit goals and in turn intended to achieve specific outcomes, such as shared knowledge, improved performance, or higher levels of innovation.

## USAGE OF DIGITAL TOOLS AND CHANGE IN MINDSET

Continuous monitoring is crucial in today's dynamic and complex business environment, where banks are facing various risks, including fraud, cyber-attacks, financial mismanagement, and non-compliance with laws and regulations. Auditors must be proactive in detecting these significant risks that could potentially harm the bank's reputation, financial stability, or operations. The use of Artificial Intelligence (AI) and machine learning algorithms can help auditors to monitor data sources in real time and detect unusual patterns and anomalies.

The traditional approach to auditing involves periodic assessments of financial statements, internal controls, and compliance with regulations. Value of this approach is limited because it relies on historical data and does not provide real-time insights into potential risks or issues. Continuous monitoring, on the other hand, involves the use of automated tools to analyze data from multiple sources in real time. This approach provides auditors with real-time insights into potential risks or issues, allowing them to take proactive measures to address them.

Using AI and machine learning in continuous monitoring enables auditors to detect potential risks and issues more quickly than traditional methods. AI and Machine learning can analyze large volumes of data from various sources, including financial transactions, customer data , and employee data, to identify patterns and anomalies that may indicate areas of risk.

Continuous monitoring using AI and machine learning can help to detect potential issues more quickly, allowing auditors to address them before they become larger problems. More importantly, continuous monitoring can reduce the amount of manual effort required to monitor data sources, and that will be freeing up auditors to focus on more high-value tasks which is a benefit for the auditor.

Fraud is one of the most significant risks facing financial institutions, and it can have a devastating impact on the organization's reputation, financial stability, and operations.




Figure: 04

Source: www.spiceworks.com

As you can see, the picture depicts that continuous auditing and monitoring is the best practice for prevention of frauds. AI tools can analyze large volumes of data in real time and generate alerts when anomalies are detected, allowing auditors to investigate potential fraud immediately. This can help to prevent further losses and mitigate the impact of fraudulent activity. AI can also help to reduce the amount of manual effort required to detect potential fraud. Traditionally, auditors would need to manually review large volumes of data to identify potentially fraudulent activity. This process can be time-consuming and incline to errors. By using AI tools, auditors can automate the process of fraud detection, enabling them to save the valuable time.

**AI TOOLS**

Specially in a banking audit, large number of transactions need to be scrutinized. Usage of traditional methods of auditing would not be appropriate in that case. One of the most commonly used AI tools in audits is data analytics software. These tools can analyze large volumes of data from multiple sources and identify patterns and anomalies that may indicate potential risks or issues. Data analytics software can also provide insights into areas of the bank that may require additional attention, such as areas where control weaknesses have been identified or where transactions are outside of normal parameters. The use of data analytics software can help auditors to focus on high-risk areas and prioritize their efforts. Following are the famous big data analytic tools which can be used by the auditors.

## CONCLUSION.

Banks play a vital role in an economy since it facilitates for capital inclusion to businesses and carry out transactions which are essential for efficiency of corporate sector. Banking industry has been enormously benefited with the introduction of digital channels to the banking operations. It is obvious that auditor cannot continue to use outdated methodologies in a digital-first environment. The audit function must undergo a holistic digital transformation in order to match with the rapid innovations in the banking industry. Auditor need to update themselves technically so that auditor can face the risk involve in digitalization of banking processes. Increase of Digital awareness and proactive risk assessment, obtaining Qualifications and continuous training, usage of Digital tools & Change in mindset will create an auditor who best fit for the digitalized environment. Otherwise, auditors would not be able to match with the dynamic change in the business world.

## References

Egypt, A.s. (2023). International journal of government auditors: https://intosaijournal.org/journal-entry/the-use-of-artificial-intelligence-ai-in-the-execution-of-audits/

Jalee, A. (2023, January 18). ChatGPT and Leveraging Artificial Intelligence in Auditing.

https://www.isaca.org/resources/news-and-trends/isaca-now-blog/2023/chatgpt-and-leveraging-artificial-intelligence-in-auditing

Nair, B. (2022, July 13). The Evolution of Internal Audit in a Digital-First Environment.

https://www.isaca.org/resources/news-and-trends/industry-news/2022/the-evolution-of-internal-audit-in-a-digital-first-environment

Kanade, v. (2021, june 16). What Is Fraud Detection? Definition, Types, Applications, and Best Practices. Retrieved from www.spiceworks.com:

https://www.spiceworks.com/it-security/vulnerability-management/articles/what-is-fraud-detection/

CBSL. (2022). Payment bulleting report. central bank of Sri Lanka.

Simpson, J., 2002. The impact of the Internet in banking: observations and evidence from developed and emerging markets. Telematics and Informatics, Vol19, p. 315–330.

Nitsure, R. R., 2003. E-Banking: Challenges and Opportunities. Economic and Political Weekly, pp. pp. 5377-5381

# ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා..............


**ජී.ඒ.එම් අයි. ගුණරත්න**
**විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති**


ශ්‍රී ලංකාවේ රාජ්‍ය මුල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය පිළිබඳව පෙර නොවූ විරූ ජනතා අවධානයක් මෑතකාලයේ දී යොමුවී තිබේවිගණන වාර්තාවල ඇතුලත් වන . යාමාර්ග නිරීක්ෂණ හා ඊට අනුකූලව ආයතනික කළමණාකරනය විසින් ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රි පිළිබඳව විවිධ පාර්ශවයන් නිරන්තරයෙන් සිය විමසිලිමත් දෑස් යොමුකරමින් සිටී අංශයේ ආයතන රාජ්‍ය . මවල න්තර පාලන ක්‍රඅභ්‍යා , වලට ආවේනික තත්වයන් වන දූර්වල කළමණාකරන තීරණවලට එළඹීම් මිකතා යනාදිය මෙම තත්වයට පාදක වී දූෂණ හා අක්‍ර ,ත්මකව වාර්තාවන වංචාසංඛ්‍යා ,පවතින දූර්වලතා තිබේමේ හේතුවෙන් ජාතික විගණන කාර් .යාලයෙන් නිකුත්වන විගණන වාර්තා කෙරෙහි මාධ්‍ය මගින් නිරන්තරව හෙළිදරව් කිරීම .වණතාවයක් වී තිබේපුරවැසියාගේ පක්ෂයෙන් බලනවිට යහපත් ප්‍ර ,

රාජ්‍ය ආයතනවල කාර්යසාධනය අගැයීමේ කාර්යයනියාමන ආයතනවල ,ආයතනික මට්ටමින් , මට්ටමින් සහ ස්වාධින පාර්ශවයන්ගේ මට්ටමින් නිරන්තරයෙන් සිදුකෙරේවිගණකාධිපතිවරයා විසින් . මෙම .වඩාත් පිළිගැනීමට ලක්වූ අගැයීමක් වේ , ආයතනවල කාර්යසාධනය අගැයිමසිදුකෙරන රාජ්‍ය ( විගණනයමුල්‍ය ) කාශ සම්බන්ධයෙන් මතයක් පලකිරීම ප්‍ර ආයතනවල වාර්ෂික මුල්‍යරාජ්‍ය ,යාවලියක්‍රි ආයතනවල කටයුතු සකසුරුවම් ලෙස කමෙන්ම රාජ්‍ය ාර්යක්ෂමව හා ඉලක්කගත අරමුණු ඉටුකරගතහැකි ලෙස සිදුවන බව තහවුරුකරගැනීම යන දෙආකාරයෙන්ම (කාර්ය සාධන විගණනය) ලංකාවේ වත්මන් ආර්ථික හා සමාජීය සන්දර්භයන් තුල ඉහත සඳහන් දෙවන ආකාරයේ ශ්‍රී.සිදුවේ මවේදය ගැඹුරින් යොදාගැනීමේ දී සහ කාර්යසාධන විගණනයේකාර්යසාධන අගැයීම් ක්‍ර න්‍යායික ප්‍රවේශයන් පලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය විගණකයා විසින් තවදුරටත් අවධානය යොමුකලයුතු ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් මෙම ලිපියෙන් අවධානය යොමුකෙරේ.

**කාර්යසාධන විගණනය**

උත්තරීතර විගණන ආයතන සඳහා වන කාර්ය සාධන විගණනය පිළිබඳ ජාත්‍යාන්තර ප්‍රමිත-3 අනුව 00 කාර්යයන් හෝ සංවිධාන යනාදියෙහි ,වැඩසටහන් ,මෙහෙයුම් ,පද්ධති ,රජය සතු අස්ථිත්වයන් හෝ ඵලදායිතාවය යන මුලධර්මවලට අනුකූලව /කාර්යක්ෂමතාවය හා ,කාර්යයන් පිරිමැසුම්භාවය යාවලින් තවදුරටත් වර්ධනය කිරිම සඳහා ඉඩකඩ පවතින බව තහවුරමෙහෙයවන බව සහ අදාල ක්‍රි ු කර ගැනීම සඳහා සිදුකරනු ලබන ස්වාධීනකාර්ය සාධන ,අරමුණුගත හා විශ්වාසදායී පරීක්ෂාව,

මෙහිදි කාර්ය සාධන විගණනයේ මූලික සංකල .විගණනය වේ්ප තුනක් කෙරෙහි අවධානය යොමුකෙරෙන බව දන්නා කරුණකි ඒවානම් .

**පිරිමැසුම්භාවය**

සම්පත්වල පිරිවැය අවම කිරිමපිරිමැසුම්භාවයේ මූලධ ,ර්මයෙන් අදහස් වේමෙහිදී පරිහරණය කරනු . නිසි කාලසීමාවක් තුල ,මාණයෙන්හොඳම මිලට නිසි ගුණාත්මක තත්වයෙන් හා ප්‍ර ,ලබන සම්පත් .ලබාගැනීම සිදුවන්නේදැයි පරීක්ෂාවට ලක්කෙරේ

**කාර්යක්ෂමතාවය**

ලබාගත හැකි සම්පත්වලින් උපරිම නිමැවුමක් ලබාගැනීම කාර්යක්ෂමතාවයේ මූලධර්මයෙන් අදහස් වේගුණාත්මකභාවය හා නිසිකාලය තුල ලබාගැනීම යන කරුණු වලට යටත්ව උපයෝජනය ,මාණයප්‍ර . .කරනු ලබන සම්පත් හා එහි නිමැවුම අතර පවතින සම්බන්ධතාවය මෙහිදී සළකා බලනු ලැබේ

**ඵලදායිතාවය**

ඉලක්ක කරන ලද අරමුණු හා අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීම, ඵලදායිතාවය පිලිබඳ මූලධර්මයෙන් අදහස් වේ.මාණය යනාදිය සමඟ එය සම්බන්ධ වේඑල හා පසු බලපෑමේ ප්‍රප්‍ර,නිමැවුම් .

**මූල්‍ය විගණනයකාර්යසාධන විගණනය හා අනුකූලතා විගණනය ,**

රාජ්‍ය අංශ විගණනය මූල්‍ය .ධාන කොටස් තුනකට බෙදේපුළුල් වශයෙන් ඉහත සඳහන් පරිදි ප්‍ර , අස් ,විගණනයපීත්වයක වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මත පදනම් කරගෙන සිදුකරන අතර එහිදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිභාවය තහවුරුකිරීමක් සිදුකරනු ලබයිකාශන ප්‍රමූල්‍ය . සම්බන්ධ විෂයය කරුණ , විෂයය කරුණු තොරතුරු හා විගණන නිර්නායක යනාදිය විගණිත අස්ථිත්වය විසින් තීරණය කරනු ලබන අතර විගණකවරයා විසින් සිදුකරනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධ ස්වකීය මතය ප්‍රකාශකිරීම සඳහා සාක්ෂි රැස්කිරීමය විගණනය මගින්මූල්‍ය ,ඒ අනුව . මූල්‍ය ප්‍රකාශණ සහතික කිරීමක් සිදුකරනු ලබයි .

කාර්ය සාධන විගණනයේදී සෘජුව මූල්‍ය ප්‍රකාශණ පදනම් කර නොගන්නා අතර විගණනයට අදාල විෂයය කරුණ (මාතෘකාව), විෂයය කරුණු තොරතුරු හා විගණන නිර්නායක යනාදිය විගණකයා විසින් තීරණය කරනු ලබයි .කාර්ය සාධන විගණනය සෘජු වාර්තාකිරීමක් වේ .

අනුකූලතා විගණනයේදී පදනම්කරගනු ලබන විෂයය කරුණවිෂයය කරුණු තොරතුරු හා විගණන , නිර්නායක යනාදිය විගණිත අස්ථිත්වය විසින් හෝ විගණකයා විසින් තීරණය කරනු ලබන අතර එය , .සහතික කිරීමක් හෝ සෘජු වාර්තාකිරීමක් විය හැකිය

මේ හේතුවෙන් කාර්යසාධන විගණනයේදී විගණකවරයා විසින් තෝරාගනුලබන විෂය කරුණ , කොතරම් දුරට ජනතා අවධානයට ලක්වන්නේද යන්නත් ඒසඳහා යොදාගනුලබනවිවේක්ෂණශීලී නිර්නායක පිළිබඳවත් පළමුවෙන් විගණකවරයා සෑහීමකට පත්විය යුතුය.

**ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා සැලසුම් කිරීම**

ප්‍රයෝජනවත් තොරතුරු පුරවැසියන් වෙත සැපයීම මගින් සහ පවත්නා තත්වය අවබෝධකරගැනීම හා වැඩිදියුණුකිරීම සඳහා පවතින ඉඩ ප්‍රස්ථාවන් සඳහා පදනමක් සැපයීම තුලින් කාර්ය සාධන විගණනයරජය විසින් යම් කාර්යයක් ,එසේම .වර්ධනය කරනු ලබයිප්‍ර විනිවිදභාවය පිළිබඳ සංකල්පය , ,තිලාභයක් පුරවැසියා වෙත ලැබෙන පරිදිසඳහා වැය කරනු ලබන පොදු අරමුදල් වෙනුවෙන් යම් ප්‍ර විගණිත අස්ථිත්වය විසින් සිය සැලසුම් කාර්යක්ෂම ලෙස හා ඵලදායීව පිළියෙල කර ක්‍රියාත්මක කරන්නේදැයි විගණනයේදී පරීක්ෂා කිරීම අවශ්‍යවේනීති හා රෙගුලාසි සම්බන්ධ අඩුපාඩු හා ,තවද . විශේෂිත අරමුණු ඉටුකරගැනීමෙන් බැහැරවීමට විගණිත අස්ථිත්වය විසින් අනුගමනය කරනු ලැබූ යාමාර්ග පිලිබඳව විගණනයේදී විභාග කර වගකිවයුතු පාර්ශවයන් වෙත අදාල නිසක්‍රි පියවරයන් ගැනීම සඳහා වූ නිර්මාණශීලී විවේචන හා නිර්දේශ කාර්ය සාධන විගණනය මගින් ඉදිරිපත් කරනු ලබයි.

ගැඹුරු කාර්ය සාධන විගණනයක් සඳහා සම්බන්ධවන විගණක වරයෙකු විසින් පිරිමැසුම්භාවය , කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය පිළිබඳ මුලධර්ම තහවුරු කිරීම සඳහා යම් අස්ථිත්වයක් විසින් සිය ආයතනික හා නියාමන සැකසුම් හරහා අවශ්‍යයෙන්ම පිහිටුවා ඇති තත්වයන් විශ්ලේෂණය කිරීම සිදුකල යුතුවේඅදාල භාන්ඩ භාසේවාවන් නිවැරදිව හා කාලීනව සපයනු ලබන බව තහවුරු ,තවද . වන මනා කළමණාකරන පරිචයන් හා කාර්ය පටිපාටි අනුගමකිරීම සඳහා අවශ්‍යනය කිරීම සඳහා වූ විගණිත අස්ථිත්වය සතු සැලසුම් පිලිබඳව විගණක වරයා සෑහීමකට පත්විය යුතුය.

උක්ත කරුණු සළකා බැලීම සඳහා කාර්ය සාධන විගණනය මනා ලෙස සැලසුම් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේමෙහිදි විගණකවරයා තොරාගත් විගණන විෂයය කරුණ සම්බන්ධයෙන් මනා දැනුමක් . ලබාගැනීම අවශ්‍ය වේ වන සියළුම යීනව පවත්වාගැනීම සඳහා අවශ්‍යවිගණනය අනභිතනව හා ස්වා . මාණවත් හා නිවැරදි තොරතුරු ප්‍ර .මාණවත් කාලයක් වැයකිරීම සිදුකල යුතුවේකරුණු රැස්කිරීම සඳහා ප්‍ර .ධාන අභියෝගයකි විගණකයා මුහුණදෙන ප්‍ර ලංකාවේ රාජ්‍යශ්‍රී ,ලබාගැනීමේ අපහසුතාවය

**රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ සමානත්වය(Equality) හා සමාජ සාධාරණත්වය )Equity) පිළිබඳ සංකල්ප සැලකිල්ලට ගැනීම**

රාජ්‍ය ප්‍රතිපත්තීන්වල ගුණාගුණ විවේචනය කිරීම රාජ්‍ය විගණකවරයාගේ විෂය පථයට ඇතුලත්වන කරුණක් නොවන නමුත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වන අරපිරිමැසුම්කාරී බව ,

,ෂමතාවය හා  පලදායකත්වය අගැයීමකාර්යක් කාර්ය සාධන විගණනය මගින් සිදුකරනු ලබයිගැඹුරු    . කාර්යසාධන විගණයක් සඳහා සමානත්වය(Equality)    හා   සමාජ සාධාරණත්වය )Equity)    පිළිබඳ මූලධර්ම සම්බන්ධයෙන් රාජ්‍ය විගණකයා සිය සැලකිල්ල යොමුකල යුතුය .

සමානත්මතා මූලධර්මයෙන් කියැවෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති  තුලින් සමාජයේ සියළු දෙනා වෙත සමාජමය ප්‍රතිලාභ සැලසිය යුතු බවයිතාවයන් සඳහා පුරවැසියන්ගේ  පෞද්ගලික අවශ්‍ය ,මෙහිදී     . ස්ථාවන්සාධාරණත්වය මූලධර්මයෙන් කියැවෙනුයේ සාධාරණ ලෙස සමාජ ඉඩ ප්‍ර .සැලකිලිමත් නොවේ ගලාගෙන යාමට ඉඩ ලැබෙන පරිදි පුරවැසියාගේ හෝ පුරවැසි කණ්ඩායම්වල  විශේෂිත අවශ්‍යතාවයන් හඳුනාගෙන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතු බවය.

උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ පාසැල්  ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නිල ඇඳුම් ලබාදිමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ,සමානත්මතා මූලධර්මය පදනම් කරගනිමින් සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නිල ඇඳුම් සඳහා  අවශ්‍ය රෙදි ප්‍රමාණයක් නොමිලයේ ලබාදෙනු ලැබේ වන ශිෂ්‍යනිල ඇඳුම් අවශ්‍ය ,මෙහිදී . කණඩායම් වෙනම හඳුනා ගැනීමක් සිදුනොකරන අතර ඒ අනුව, එම රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදීධාර ලබාදිම පිළිබඳ ත්  පාසැල් ශිෂ්‍යාළුහෙ  .අරපිරිමැසුම්භාවය යන්න නොසලකා හැර තිබේ , යාත්මක කල මුල් වකවානුවේ දී සාධාරණත්වය පිලිබඳ  මූලධර්මය පදනම් කර තිපත්තිය ක්‍රි ප්‍රරාජ්‍ය ගනිමින් අඩුවරප්‍රසාද සහිත දක්ෂතාවයනගෙන් පිරිපුන් ශිෂ්‍ය ප්‍රජාවක් තොරාගැනීම සඳහා කටයුතු කර තිබුණි .

ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා උක්ත මූලධර්ම කෙරෙහි රාජ්‍ය විගණකයා සිය සැලකිල්ල යොමුකල යුතු අතර එමගින් කාර්යසාධන විගණනයේ වලංගුතාවය තවදුරටත්  තහවුරුකල හැකිවේ .

**විගණනයේ පාර්ශව කරුවන් සමඟ නිරන්තරයෙන් පවත්වා ගත යුතු සන්නිවේදනය**

කාර්යසාධන විගණනය සම්බන්ධ පාර්ශවකරුවන්කරනු ඇතැයි     විගණන වාර්තා පරිශිලනය , යාත්මක කිරිමට වගකිවයුතු අපේක්ෂාකරනු ලබන පාර්ශවයන්  හා  වාර්තාවේ ඇතුලත් නිර්දේශ ක්‍රි පාර්ශවයන්  වශයෙන් කොටස් දෙකක් හඳුනාගත හැකියවිගණකවරයා සිය  කාර්ය සාධන විගණන  . ,වාර්තා  පිළියෙල කර ඉදිරිපත්  කිරිමට ඉලක්ක කරනු  ලබන පාර්ශවය**අපේක්ෂිත පරිශීලකයන්** වේ  . ආයතන සහ  විගණන වාර්තාව සලකා බැලීමට භාජනය කරනු ලබන  තුන්වැනි රාජ්‍ය ,පාර්ලිමේන්තුව පාර්ශවයන්  හා රටේ පුරවැසියන් යනාදී සියළුම පාර්ශවයන් අපේක්ෂිත පරිශීලකයන් වශයෙන් හඳුනාගත හැකියවිගණනයට භාජනය කරනු ලබන මාතෘකාව සම්බන්ධයෙන් විවිධ ආකාරයෙන් වගකීම දරනු  . ,න හෝ පුද්ගලයින් කණ්ඩායමලබන  ආයත**වගකිවයුතු පාර්ශවයන්** වනු ඇත  . විගණනයට අදාල විෂයයෙහි  මෙහෙයුම් හෝ  අධික්ෂණ කාර්යභාරය ඉටුකරනු ලබන පාර්ශවයන් හා  විගණන නිර්දේශ

සළකා බලා අදාල වෙනස්කිරීම්වලට සම්බන්ධවන පාර්ශවයන් ද වගකිවයුතු පාර්ශවයන්ට ඇතුලත් වේ . අපේක්ෂිත ,සමහර විටක **පරිශීලකයන් හා වගකිවයුතු පාර්ශවයන්** එකම පාර්ශවයක් ද විය හැකිය

ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා මෙම පාර්ශවයන් පැහැදිලිව හඳුනාගැනීමටත් එම පාර්ශවයන් සමඟ නිරන්තර සම්බන්ධතාවයන් පවත්වා ගැනීමත් කාර්ය සාධන විගණකවරයා කටයුතු කල යුතුය . මුඛ ආයතනයට හා අදාල පාර්ශව කරුවන් සමඟ විගණනයේ ප්‍ර යාවලිය පුරාම විගණිතවිගණන ක්‍රි යාත්මක කිරිම මගින්මවේද සැලසුම්කර ක්‍රිතොරතුරු සන්නිවේදනය කර ගැනීම සඳහා ක්‍රඅර්ථවත් කාර්ය සාධන විගණනයක් සිදුකල හැකියපාර්ශවකරුවන් සමඟ තොරතුරු ,කෙසේ වෙතත් . වය හා අපක්ෂපාතිත්වය කඩ නොවන බවට සන්නිවේදනය කිරිමේදී විගණකවරයා ගේ ස්වාධීනත් .කාර්යසාධන විගණකවරයා තහවුරුකර ගත යුතුය

**ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා පසු විගණන පරීක්ෂාවන්**

පසු විගණන පරීක්ෂාවන් යනු කාර්යසාධන විගණනයක ප්‍රතිඵල පදනම් කරගෙන විගණිත අස්ථිත්වය හෝ වෙනත් පාර්ශවයක් විසින් ගනු ලබන නිවැරදිකිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාර්යසාධන විගණකවරයා විසින් සිදුකරනු ලබන ස්වාධීන පරීක්ෂාවන් වේයාවලීන් මෙමගින් ආයතනික ක්‍රි . කෙරෙහිවිගණනය තුලින් කලහැකි බලපෑම ශක්තිමත් කිරීම කල හැකි අතර අනාගතයේදී තවදුරටත් සිදුකරනු ලබන විගණන කාර්යයන්වල වර්ධනය සඳහා පදනමක් සපයනු ලැබේ .

පසු පරීක්ෂාවන් මගින් විගණන වාර්තා සහ විගණන සොයාගැනීම් බරපතල ලෙස සළකා ක්‍රියාකිරීමට විගණිත ආයතන හා විගණන වාර්තා පරිශීලකයින් දිරිගන්වනු ලබන අතර ආයතනික කාර්යසාධන දර්ශකවලට ලඟාවීම කිරිම සඳහා පලදායි හා ස්වාධින මාර්ගොපදේශ සපයනු ලබයිවිගණිත . .යනය හා සංවර්ධන කටයුතු සඳහා ද පසු පරීක්ෂා පියවරයන් වැදගත් වේන්තර අධ්‍යයතනවල අභ්‍යආ

පසු පරීක්ෂා පියවරයන්යාත්මඅදාල නිර්දේශ ක්‍රි ,ක කිරීම සඳහා පමණක් සීමා නොවන අතර එමගින් විගණිත ආයතනය ණය කල බව හා සාධාරණ කාල සීමාවක් තුල නිවැරදිමාණවත් පරිදි ගැටළු ආමන්ත්‍රප්‍ර , .යාමාර්ග ගෙන තිබෙන බව අවධානයට ලක් කරනු ලබයිකිරීමේ ක්‍රි

කාර්ය සාධන විගණනයකදී ඉදිරිපත් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කෙරෙන ආකාරය පුළුල් වශයෙන් කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් වර්ග කල හැකියයාත්මක කෙටිකාලීන නිර්දේශ ක්‍රි . වූ තොරතුරු ආයතනික වශයෙන් ලබාගැනීමෙන් සිදුකල හැකි ඒ සඳහා ,ගතිය මැන බැලීමකිරිමේ ප්‍ර ගතිය මැන බැලීම සඳහා නැවත විගණනයකයාත්මක කිරිමේ ප්‍රනමුත් දිගුකාලීන නිර්දේශ ක්‍රි සිදුකිරීමට සිදුවිය හැකයාත්මක කිරිමේදී එමගින් සිදුවිය හැකි ආර්ථික හා සමාජමය දිගුකාලීන නිර්දේශ ක්‍රි ,එසේම . පසු , මෙහිදී සිදුකරනු ලබන නැවත විගණනයකදී . විය හැකන බැලීම අවශ්‍යමාණය මැබලපෑමේ ප්‍ර

මාණාත්මක හා ගුණගණනය කල හැකි ප්‍ර ,බලපෑම්වල ආර්ථිකමය වාසි අවාසිාත්මක බලපෑම් සහ ගණනය කල නොහැකි ගුණාත්මක බලපෑම් යනාදිය වෙන් වෙන්ව අගැයීම් කල යුතුවේ.

පසු පරීක්ෂා පියවරන් සඳහා නිශ්චිත හා පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් විගණන ක්‍රියාවලිය අපේක්ෂිත පරිදි සම්පුර්ණ කිරිමට මෙන්ම විගණනයේ ඵලදායිත්වය වැඩිකිරීමට හැකි වේ.

**විගණන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම**

ගැඹුරු කාර්යසාධන විගණනයක් සඳහා රාජ්‍ය විගණකවරයා දේශීය හා ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන්වලට අනුකූලව විගණනය සැලසුම්කිරීමවාර්තා ඉදිරිපත් කිරීම හා පසුපරීක්ෂාවන් ,මෙහෙයවීම , සිදුකිරීම මගින් විගණනයේ ඵලදායිත්වය වැඩිකිරීමටකටයුතුකලයුතුවේ විගණන කාර්යයේදී මූල්‍ය . මෙන් නොව කාර්යසාධන විගණනයකදී ආයතනික කාර්යසාධන පරීක්ෂාවට භාජනය වන බැවින් කාශ කිරීමට පවතින ණ හා නිර්දේශ සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් විකල්ප අදහස් ප්‍රවිගණන නිරීක්ෂ මිතීන්ට අනුකූලව කටයුතු කිඉඩකඩ වැඩි හෙයින් විගණන ප්‍රරීම මගින් විගණනයේ ගුණාත්මකභාවය තහවුරුකිරීම අවශ්‍ය වේ.

**සාරාංශය**

උක්ත කරුණු අනුවඵලදායී කාවඩා විධිමත් හා ප්‍ර ,ර්යසාධන විගණනයක් සඳහා විගණකවරයා විසින් විගණන විෂය කරුණ හා විගණන නිර්නායක තෝරාගැනීමේදී ,විගණනය සැළසුම් කිරීමේදී , සමානත්මතා හා සමාජ සාධාරණත්වය යන මූලධර්ම ක්‍රියාවට නැංවීමේදී ,විගණනයේ පාර්ශව කරුවන් සමඟ නිසි සන්නිවේදනයක් පවත්වා ගැනීමේදී රීමේදී හා පසු පරීක්ෂා පියවරයන් අනුගමනය කි , මිතීන්වලට අනුකූලව කටයුතු කිරීමේදී ඒ පිළිබඳව නිරන්තර අවධානයක් යොමුකිරීම මගින් විගණන ප්‍ර ගැඹුරු කාර්යසාධන විගණනයක් සිදුකල හැකිවේ .

## මානව අයිතිවාසිකම් වර්ධන ඉතිහාසය

**කේ.එන්.එම්.කුමාරසිංහ**
**ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති**
**B.Com, LLB. AAL.MA**

### මානව හිමිකම් )Human Right)

මිනිසා විසින් ලගා කර ඇති කරගත යුතු දෙයක් නොව මිනිසෙකු ලෙස ලොවට බිහි වන සෑම කෙනෙකුටම උත්පත්තියෙන් උරුම විය යුත්තක් ලෙස සැළකේඑසේ වුව ද යතාර්ථය වනුයේ මානව . හිමිකම් අහිමි කරගෙන ඇත්තේ ද මිනිසා විසින්මයහය ජ ව්‍යුඑනම් මිනිසා විසින් ගොඩනගා ඇති සමා . මිනිසා පාලනය කිරීම සඳහා මිනිසා විසින්ම බලය පවරා ඇති පාලක මිනිස් කාණ්ඩායමෙහි අතීතය විමසීමේ .අත්තනෝමතික අදූරදර්ශ පාලනයක් තුළින් මානව අයිතිවාසිකම් අහිමි කිරීම සිදු වී ඇත දී මුල් යුගයේ සිටම මේ දක්වාම මිනිසා තම ආරක්ෂාවේ අවශ්‍යතාවය හේතුවෙන් කණ්ඩායම් ලෙස ජීවත්වීමවිවිධ අනතුරු වලින් ආරක්ෂාව සඳහා ආරක්ෂිත ආයුධ ,කණ්ඩායම් නායකයෙකු තෝරා ගැනීම, එදා ආරක්ෂාවට පමණක් මුල්කොටගෙන .යාත්මක වෙසටන් කිරීම සිට මේ දක්වාම ක්‍රි , නිපදවීම ,ගොඩනැගුණු කණ්ඩායම් අද වන විට ආර්ථිකය බලශක්තියබලය ,භූමිය ,දේශපාගලනය ,ජාතිය ,ආගම , .රසාද උදෙසා ගැටුම් ඇතිකර ගැනීම දක්වා වර්ධනය වී ඇතහා වරප්

### මානව හිමිකම් අවභ්‍යතාවය මතුවීමට බලපාන කරුණු

මානව ඉතිහාසය පරීක්ෂාවේදී ගෝත්‍රික කණ්ඩායම් අතර ගැටුම් ඇති වීම නිසා ජයග්‍රහණය කළ කණ්ඩායම විසින් පරාජය වූ කණ්ඩායමේ අය වහලුන් ලෙස යොදා ගන්නා ලදිම මයේ උච්චතමෙම ක්‍ර . මය හු පැලැන්තිය විසින් වහල් ශ්‍රරෝම ප්‍ර .මය පෙන්වා දිය හැකියස්ථානයක් ලෙස රෝම යුගයේ වහල් ක්‍ර මෙම සටන් වලදී .යොදා ගත්තා පමණක් නොව වහලුන් ද්වන්ධ සටන් වලට යොදවා සතුටට පත්විය හනය කළ සටනකින් දුර්වලව සටන් සඟයා මරා දැමීමට ජයග්‍ර .පරාජය වන්නාට අත්වනුයේ මරණය වේ 73.පූ.ක්‍රි .හලා හට සිදු වීම එකළ සිරිත වියවදී පමණ රෝමයේ සටන් වහලෙක් වන පර්සියානු ජාතික ස්පෘතස් නැමැත්තා සටනකින් ජයග්‍රහණනය කළ පසුව පරාජය වූ තම සටන් සගයා මරා දැමීම ප්‍රතික්ෂේප කර සටනට අණදුන් කුමාරවරුන් මරා දමා වහල් නිදහස් සටන ආරම්භ කරන ලදිසටන් ස්පෘතස් විසින් . සඳහා නඩත්තු කරන ලද වහලුන් ඇතුළුව අනෙකුත් දහස් ගණනක් සමඟ විසූවියස් කන්දට ගමන් කර බල රෝම හමුදාව විසින් සියළුම ක් පමණ රෝම හමුදාව සටන් කළ අතර ප්‍ර 4 එතැන් පටන් වසර .ඇත එසේ වුව ද.වහලුන් සමූල ඝාතනය කරන ලදි එදා ඇරඹි වහලුන්ගේ නිදහස් සටන නොනැවතිනි .

### ඇමෙරිකානු නිදහස් සටනේ බලපෑම(1770)

මුල් අවධියේ දී බ්‍රිතාන්‍යය යටත්ව සිටි කාලයේ දී ඉංග්‍රීසි ජාතිකයන් ජනපද 16 (කොලනි)ක් පිහිටුවා පදිංචි කර ඇතජනපදකයින් වගා කටයුතු හා . සිරකරුවන්යතාන්‍යමෙසේ පදිංචි කර අය බොහෝ දුරට බ්‍රි. 1782- 1763 .ජය බදු අයකරන ලදි රතාන්‍යවෙළදාම් කටයුතු කරන ලද අතර මොවුන්ගෙන් බ්‍රිදක්වා ඇමෙරිකානුවන් වන අප වෙනත් රටකට බදු ගෙවන්නේ ඇයි ප්‍රශ්නය මතු කරන ලදිඇමෙරිකානුවන්ට . මුල් වරට හිරු නොබසින .ශය හා ස්පාඤ්ඤය යන රටවලින් සහය ලැබුණිමෙම සටන සඳහා ප්‍රං ත හා මුද්දර පනත ජනතාවයන් පනවා තිබූ උක්වතු පනතාන්‍යබ්‍රි .යා පරාජයට පත් වියඅධිරාජ්‍ය ප්‍රතික්ෂේප කරන ලදිඇමෙරිකානු ජනතාවගේ අයිතීන් වෙනුවෙන් ආරම්භ වූ සටන අවශේෂ රටවල . වර්තමානයේ දී මානව අයිතිවාසිකම් දක්වා .ජාතීන්ගේ නිදහස උදෙසා සටන් වලට ශක්තියක් විය ,ගත හැකි වීම එනම් වෙළදපලින් මිලට .එදා අතීතයේ වහලුන් වෙළද භාණ්ඩයක් විය .වර්ධනය වී ඇත

යෝජපල ප්‍රන ගැනීමවහලුන් .පවරා දිය හැකි වීම හා විනාශ කිරීමේ හැකියාව වහල් හිමියා සතු විය , එසේම වහලාගෙන් ඉපදෙන දරුවන් වහලුන් .වැඩිපුර ලඟ තබා ගැනීම ධනවත් බවේ ලක්ෂණයක් විය .වීම හා ඔවුන්ගේ අයිතිය ද වහල් හිමියන් සතු විය

**මැග්නාකාටා 1215 ගිවිසුම**

එංගලන්තයේ ජෝන් පාලන සමයේ දී ගිවිසුම ඇති වියජෝන් රජු අකුරු නොදත් උගත්කමක් නොමැති . පල්ලියේ පූජක පක්ෂයන්ට ,හුන්ප්‍ර ,ඔහු මහජනතාව පමණක් නොව රදලයින්.කෲර පාලකයෙකු විය ඒ .සියළුම දෙනා ආනාරක්ෂිතභාවයට පත්වීම හේතුවෙන් රජුට තර්ජන එල්ල වන ලදි .හානිකරන ලදි ධාන පූජක සමඟ ගිවිසුමකඅනුව පල්ලියේ ප්‍රට අනුව රට පාලනය සිදු විය .ක් විය 63 ගිවිසුමේ වගන්ති . .එහි අදට වලංගු වැදගත් වගනතියක් ආරම්භ විය “දේශීය නීතියට හෝ විනිසුරු තීරණයකට පටහැනිව කිසිදු නිදහස් පුරවැසියෙක් අත්තඩංගුවට ගැනීම හෝ සිරභාරයේ තබා නොගත යුතු බවයි” මෙම වගන්තිය අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව 13න වගන්තියට ඇතුළත්ව ඇතපාලකයෙකුට . පීඩාවට පත් කිරීම වැළැක්වීම ආරම්භ වූයේ ,අත්තනෝමතික බලතල භාවිතා කිරීම මහජනයා මර්දනය .මෙම ගිවිසුම මහිනි

**ඉංග්‍රීසි විප්ලවය (1658-1628)**

, ලවයෙන් ලද දැනුමකාර්මික විප් .වැනි සියවස වන විට සමාජය දියුණු මට්ටමකට පැමිණ තිබුණි 17 පන්නරයසාද තිබිය යුතු බවට අයිතිවාසිකම් හා වරප්‍ර ,ඒ අනුව වඩා නිදහසක් .අවබෝධය මීට හේතු විය , ජනතාවට අවබෝධ වී තිබුණිමෙකල පාලක පංතිය හා පූජකයින් නඩත්තු කිරීම මහජනතාවට පැවරී . අධික බදුබර .මහිනි ඔවුන් අධි සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන ලද්දේ ජනතාවගේ බදු මුදල් .තිබුණි ජනතාවට පීඩා ගෙන දුනි .පීඩනය තවත් වර්ධනය කරවීය ,පසු කාලිනව ඇති වූ ආර්ථික අවපාතය . දී 1628 .තවදුරටත් පූජක හා පාලක පංතිය නඩත්තු නොකළ යුතු බවට කල්පනා කරන ලදිOliver Cromwell නැමැති ගොවි නායකයෙකු විසින් මෙම සටනට නායකත්වය ලබාදෙන ලදි. ඔවුන් ගොවි විප්ලවයක් මහින් රජුගේ පරම බලය නැතිකර පාර්ලිමේන්තුව ලැබිය යුතු ක්‍රමයකට සටන් කරන ලදි . .මයක් තුළ මානව හිමිකම් වර්ධනය වියන්තවාදී ක්‍රජාත්‍රාමෙම තත්ත්වය තුලින් එංගලන්තයේ ප්‍ර

**ප්‍රංශ විප්ලවය(1794- 1789)**

ප්‍රංශයේ මධ්‍යතන යුගයේ ඇති වූ ආර්ථික අවපාතය පසුව ජනතාව අධික පීඩනයට ලක් විය .පාලකයින් , පාලකයින්ට එරෙහිව ලෝකයේ .දැඩි බදු අයකරගෙන සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන ලදි ,පූජකයින් ශ ථම හා දැවැන්ත සටන ප්‍රංසභෝදරත්වය සටන් පාඨය කරගෙන ආර්මභ වූ ප්‍ර ,සමානත්වය ,නිදහස ම මිනිසෙකුම උපතින් සමානතිඑලයක් ලෙස ඒකාධිපතිවාදය අවසන් වීම හා සැසටනෝ ප්‍ර.විප්ලවය වියය යන පදනම මත පාලනයක් ඇති වීම මානව හිමිකම් බිහි වීමේ වැදගත්ම අවස්ථාවකි.

**ලතින් ඇමෙරිකානු රටවල ඇති වූ වෙනස් වීම්**

ස්පාඤ්ඤඑම යටත් විජිත ගිලිහීමට ඇමෙරිකානු නිදහස් .යටත් විජිත රාශියක් ඇති කර ගෙන තිබුණි , ටිනාව යටත් විජිතභාවයෙනදී අර්ජන් 1816 මුලින්ම .සටන බලපාන ලදි් මිදෙන ලද්දේ ශාන්ත මාර්ටින් නැමැඅත්තාගේ නායකත්වය යටතේය 1822 .පසුව චිලී රට නිදහස් වීමට ආර්ජන්ටිනාව සහය දෙන ලදි .දී

පේරු රාජ්‍යය ද නිදහස ලබා ගන්නා ලදි 1830 .පමණ  බෙල්ජියමේ නිදහස් සටන ආරම්භ වියයුරෝපය  . දී නිදහස උදෙසා විප්ලව හා ලතින් ඇමෙරිකානු රටවල් මේ අවධියේ රැල්ලක් ආරම්භ වියයුරෝපයේ  . 1830 තිඵලයක් ලෙසමෙම රැලි වල ප්‍ර .පෙළපාලි උද්ඝෝෂණ ඇති විය ,මය සූරාකෑමට එරෙහිව වර්ජනශ්‍ර ඕලන්දය ,බෙල්ජියමත් නිදහස් රාජ්‍යයක් බවට පත් වියකාර්මීකරණය නිසාවෙන් යුරෝපීය රටවල   . මෙනිසා ජනතා .වර්ධනය විය රැකියා ගැටළු ,පන ආහාරනිවාස අධ්‍යාව තම අයිතීන් වෙනුවෙන් සටන් කරන ලදිපාකිස්ථාන නිදහස් සටන ආදිය තුළින් ද මිනිසුන් යටත් භාවයෙන්  ,ඉන්දියානු නිදහස් සටන . 1857 .මිදී තම අයිතීන් රැක ගැනීමට සමත් වන ලදිබ්‍රිතාන්‍යයින් විසින් ඉන්දියාව යටත් විජිතයක් බවට පත් කරන ලදියාව පළමු කැරැල්ල හේතුවෙපසුව ඉන්දි .න් එතෙක් රට පාලනය නැගෙනහිර වෙළඳ සමාගම තුළින් බ්‍රිතාන්‍යය කිරීටය පාලනය  මතු වියසිරිත් විරිත් වලට  ,දේශීය සම්පත් කොල්ලකෑම . .සීන්ට විරුද්ධව ඉන්දියානුවෝ පෙළ ගැසිනසාගත ආදිය නිසා ඉංග්‍රී  ,පහර දීම වරක "සුද්දා මරනු"  සටන් පාඨය ද මතු විය 1947.දී සියළුම ඉන්දියානුවෝ ඉංග්‍රීසින්ට විරුද්ධ වන ලදිදී  1947 තිඵලයක් ලෙසඑහි ප්‍ර . .කාශ කරන ලදියක් බවට ප්‍රඉන්දියාව නිදහස් රාජ්‍ය

**චීනය මානව හිමිකම**

චීනයේ  වසර ඔහුට  .යා ඉතා බල සම්පන්න නායකයෙකු වියකට පෙර සිටි තාවෝ අධිරාජ්‍ය 2300 එසේ වුවත .නය තුළ නොවීයවිරුද්ධව කතා කිරීමට කිසිවෙකු වී් එකල සමාජ ක්‍රමය අතික්‍රමණය කල ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයින් වන කොන්ෆියුසියස් සහ  ලා ඔට්ටු යන දෙදෙනාම ජීවත් වූයේ මේ කාලයේ වීම ද විශේෂ සිදු වීමකිකොන්ෆියුසියස් විසින් රජයට සමීපව යහපාලනය හා සහජීවනය පිළිබ .ඳ න්‍යාය හඳුන්වාදෙන ලදි .ඔට්ටු විසින් කොන්ෆියුසියස් වඩා ඉදිරියට ගොස්  මානව දයාව පිළිබඳ මතවාද ඉදිරිපත් කරන ලදිමරණ දඬුවමට පළමු වරට එරෙහි  .දඬුවම් තුළින් වැරදි අඩු නොවන බවට තර්ක කරන ලදි.  වූයේඔට්ටු විසිනි.

**ආගමික ඉගැන්වීම මත මානව හිමිකම්.**

මිනිස් ජීවිතයට ලබා දෙන වටිනාකම හේතුවෙන් අන් අයට මෛත්‍රියකරුණාව මිනිසා පෙළඹ, යාවද , වීම තුළ සමානාත්මකභාවයසමාජ සාධාරණ බව ඇති වේ විශේෂයෙන් බෞද්ධ දර්ශනය තුළ කියවෙන පංච  , හ වස්තු මඟින් සතර සංග්‍ර ,හ්ම විහරණසතර බ්‍ර ,සතර අගතියෙන් තොර වීම ,දසරාජ ධර්මය ,ශීලය සියවසේ විසූ බලකාමයෙන්  .පූ.ක්‍රි .පුරවැසින් මානව ගුණධර්ම රකින අයෙකු බවට පත් වේ ,පාලකයන් රටවල් යටපත් කරගත් අශෝක අධිරාජ්‍යයා පසුකාලීනව ජීවිත විනාශ නවතා ධාර්මික වූයේ ද බෞද්ධ දර්ශනය හේතුවෙනි.

**මානව හිමිකම් සඳහා පැනවූ පනත්**

- ඇමෙරිකානු විප්ලවය හේතුවෙන් පැන වූ
  -ඇමෙරිකානු නිදහස් පනත 1976
  -අයිතිවාසිකම් පනත 1991
- ප්‍රංශ විප්ලවය හේතුවෙන්
  - ශප්‍රං 1789ප්‍රඥප්තිය.
- වස්ථාවම ව්‍යරුසියන් ආණ්ඩුක්‍ර 1917
- - 1948එක්සත්  ජාතීනගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශන
- - 1966සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ  ගිවිසුම
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්  පිළිබඳ ජාත්‍යන්තර  නීතිය.

වර්තමාන ලෝකය අද භුක්ති විඳින අයිතිවාසිකම් දීර්ඝ කාලයක් තුළ සිදුකළ අරගලයක ප්‍රකාශනයක් වේ.

**ශ්‍රී ලංකාවේ මානව හිමිකම්**

ශ්‍රී ලංකාවද 1978 .කාශනය බැඳී සිටීඑක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍ර 1948ව්‍යවස්ථාව වන තෙක් මානව අයිතිවාසිකම් අධිකරණය මඟින් ක්‍රියාත්මක කරවාගත නොහැකි වියම ලංකා ආණ්ඩුක්‍රශ්‍රී . වස්ථාවේව්‍යIII වැනි පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ මානව අයිතිවාසිකම් කීපයක් මූලික අයිතිවාසිකම් යටතේ නීතිගත කර ඇත .

- මතු සබැඳි -

## LKAS 08- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තුමේන්තු වෙනස් වීම් සහ වැරදි

**L.K.Indika Samantha**
**MBA(Fin.Sp), Bsc(Mgt)Sp, LICA,CBA, AMA, MAAT,IPFA**
**Senior Assistant Auditor General**

බොහෝ කලක සිට විවිධ අවස්ථා වලදී මා දැක ඇත්තේ මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව බොහෝ පිරිස් නිවැරදි අවබෝධයක් නොමැතිව අතරමංව සිටින බවයි. මෙම ප්‍රතිභා සගරාවට හරහා සරල උදාහරණයක් තුලින් එය පැහැදිලි කිරීම මාගේ උත්සාහයයි.

පැහැදිලි කිරීමේ අභ්‍යාස - 01 ( Example 01)

අරලිය සමාගම රු. 5,000කට වඩා අඩුවෙන් වැය දරා මිලට ගන්නා යන්ත්‍ර උපකරණ මිලට වර්ෂයේදීම අයභාර වියදමක් සේ සලකා ලාභ හෝ අලාභ ප්‍රකාශයට මාරු කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වෙතත් ව්‍යාපාරයේ කළමනාකරණය විසින් 2023/04/01 දින මෙම ව්‍යාපෘතිය වෙනස් කිරීමට තීරණය කර ඇත. ඒ තුළින් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශනවල **අදාළ බව හා විශ්වාසනීය බව** වැඩිකළ හැකි යැයි කළමනාකරණය අපේක්ෂා කරයි. පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

01. රු. 5,000ට වඩා අඩුවෙන් දරා මිලට ගත් යන්ත්‍ර උපකරණ සඳහා එක් එක් වර්ෂවල දැරූ සමුච්චිත අගයන් පහත දැක්වේ. (ව්‍යාපාරය විසින් සෑම උත්සහයක්ම දරා වර්ස පහක (5) තොරතුරු ලබාගෙන ඇත.)

| | | |
|---|---|---|
| 2022 / 2023 | - | 60,000 |
| 2021 / 2022 | - | 80,000 |
| 2020 / 2021 | - | 90,000 |
| 2019/ 2020 | - | 15,000 |
| 2018 / 2019 | - | 70,000 |

02. 2023/04/01 දිනට යන්ත්‍ර උපකරණ ගිණුමේ ශේෂය රු. 900,000ක් හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 380,000කි.

03. 2023/04/01 දිනට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය හා රඳවාගත් ලාභ ගිණුමේ ශේෂය පිළිවෙළින් රු. 1,000,000 හා රු. 600,000 කි.

04. යන්ත්‍ර උපකරණ වාර්ෂිකව 20%ක් සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කරයි. (මිලට ගත් වර්ෂයේදී මුළු වර්ෂයටම ක්ෂය කරන බව සිතන්න.)

ඉහත සඳහන් තොරතුරු මත අදාළ ප්‍රතිපත්ති වෙනස්වීම අතීතයානුයෝගී ව්‍යාවහාරය මත 2023 / 2024 ගිණුම් වර්ෂවලට බලපාන පරිදි ගිණුම්ගත කරන ආකාරය පෙන්වන්න.

**පිළිතුර (Answer)**

ප්‍රථමයෙන් අවබොධකර ගත යුත්තේ මෙම ප්‍රතිපත්තිය වෙනස්කර ඇත්තේ වෙනත් ප්‍රමිතියක අවශ්‍යතාව මතද එසේ නැතහොත් කළමනාකරණයේ අවශ්‍යතාව මතද යන්නයි. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කළේ මූල්‍ය ප්‍රකාශනවල තොරතුරුවල අදාළ බව හා විශ්වසනීය බව වැඩි කිරීමට **කළමනාකරණයේ අවශ්‍යතාවය** පරිදිය. එම නිසා LKAS 08 අනුව අතීතයානුයෝගී ව්‍යාවහාරය මත බලපෑම ගිණුම්ගත කළ යුතුය. අරලිය සමාගමේ ප්‍රවර්ථන වසර වනුයේ 2023/04/01 දිනෙන් ආරම්භ වී 2024/03/31 දිනෙන් අවසන් වන වර්ෂයයි. වසර පහකට (5) පෙර තොරතුරුද ඔබට සපයා ඇත. කලින් ප්‍රතිපත්තිය මත සිදු කර ඇත්තේ යන්ත්‍ර උපකරණ ගිණුමට හර කළ යුතු දෑ වියදම් ගිණුමකට හර කිරීමයි. දැන් එම ප්‍රතිපත්තිය වෙනස් කර ඇත. වියදම් සේ හඳුනාගත් දෑ යන්ත්‍ර උපකරණ ගිණුමට හඳුනාගත යුතුය. ඔබ සිහි තබා ගතයුතු කරුණ නම් ඔබ දැන් සිටින වර්ෂයයි. ඔබ සිටින්නේ 2023 / 2024 ගිණුම් වර්ෂය තුළයි. කෙසේ වෙතත් වත්කම් ගිණුමේ ශේෂයන් වර්ෂය ආරම්භයේ තිබුණත් පෙර වර්ෂයන් සඳහා ආදායම් හා වියදම් ගිණුම් නොමැත. නමුත් ඒවාට ශුද්ධ වෙනස රඳවාගත් ලාභ තුළ ඇත. එම නිසා අතීතයානුයෝගී ව්‍යාවහාරයට අනුව ගැලපීම කළයුත්තේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ඇති රඳවාගත් ලාභ හරහාය.

**යන්ත්‍ර උපකරණ ගිණුම**

| | | | |
|---|---|---|---|
| 2023/04/01 ඉ/ගෙ ශේෂය | 900,000 | | |
| රඳවාගත් ලාභ (ස1) | 315,000 | ප/ගෙ ශේෂය | 1,215,000 |
| | **1,215,000** | | **1,215,000** |

**යන්ත්‍ර උපකරණ ක්ෂය වෙන් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| | | 2023/04/01 ඉ/ගෙ ශේෂය | 380,000 |
| ප/ගෙ ශේෂය | 587,500 | රඳවාගත් ලාභ (ස2) | 207,500 |
| | **587,500** | | **587,500** |

**අරලිය සමාගම**

**2024/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

හිමිකම් වෙනස්වීමේ ප්‍රතිශතය

| විස්තරය | සාමාන්‍ය කොටස් | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|
| 2023/04/01 දිනට ශේෂය | 1,000,000 | 600,000 | 1,600,000 |
| නැවත ප්‍රකාශ කළ ශේෂයන් | | | |
| යන්ත්‍ර උපකරණ | - | 315,000 | 315,000 |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම | - | (207,500) | (207,500) |
| 2023/04/01 දිනට නැවත ප්‍රකාශකළ ශේෂය | **1,000,000** | **707,500** | **1,707,500** |

**සටහන්**

**ස:1**

2022 / 2023 - 60,000

2021 / 2022 - 80,000

2020 / 2021 - 90,000

2019/ 2020 - 15,000

2018 / 2019 - 70,000

මෙම රු. 315,000ක අගය, 2023/03/31 වන තුරුම ලාභ හෝ අලාභ ප්‍රකාශයට මාරු කර ඇත. එහි බලපෑම නිසා රඳවාගත් ලාභ අඩුවී ඇත. එසේම යන්ත්‍ර උපකරණවල අගයද අඩුවී ඇත. එම නිසා අතීතයානුයෝගී ව්‍යාවහරය මත එය ගැලපීම කළ යුතු ද්විත්ව සටහන වන්නේ,

යන්ත්‍ර උපකරණ ගිණුම (හර) 315,000

රඳවාගත් ලාභ ගිණුම (බැර) 315,000

රඳවාගත් ලාභ ගිණුම බැර කරන ශේෂය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළින් පෙන්විය යුතුය.

**ස:2**

යන්ත්‍ර උපකරණ ගිණුමට නව ශේෂයක් හර කළ බැවින් ඊට අදාළ ක්ෂය වෙන් කිරීම ගණනය කළ යුතුය. ඔබ දැන් ක්ෂය ගණනය කරන්නේ 2023/04/01 දිනට වේ.

**2018/2019 කාලච්ඡේදයේ මිලට ගත් යන්ත්‍ර**

| | | |
|---|---|---|
| පිරිවැය | 70,000 | |
| 2018 / 2019 | 70,000 x 25% | 17,500 |
| 2019/ 2020 | 70,000 x 25% | 17,500 |
| 2020 / 2021 | 70,000 x 25% | 17,500 |
| 2021 / 2022 | 70,000 x 25% | 17,500 |
| සමුච්චිත ක්ෂය | | 70,000 |

මෙම යන්ත්‍රය 2021 / 2022 වර්ෂයේදී ක්ෂය වී අවසන් වේ. එම නිසා රු. 70,000, 2023/04/01 දිනට සමුච්චිත ක්ෂය වශයෙන් සැලකිය යුතුය.

**2019/2020 කාලච්ඡේදයේ මිලට ගත් යන්ත්‍ර**

වාර්ෂික ක්ෂය

| | | |
|---|---|---|
| 2019/ 2020 | 15,000 x 25% | 3,750 |
| 2020/ 2021 | 15,000 x 25% | 3,750 |
| 2021/ 2022 | 15,000 x 25% | 3,750 |
| 2022 / 2023 | 15,000 x 25% | 3,750 |
| සමුච්චිත ක්ෂය | | 15,000 |

**2020/2021 කාලච්ඡේදයේ මිලට ගත් යන්ත්‍ර**

වාර්ෂික ක්ෂය

| | | |
|---|---|---|
| 2020 / 2021 | 90,000 x 25% | 22,500 |
| 2021 / 2022 | 90,000 x 25% | 22,500 |
| 2022 / 2023 | 90,000 x 25% | 22,500 |
| සමුච්චිත ක්ෂය | | 17,500 |

**2021/2022 කාලච්ඡේදයේ මිලට ගත් යන්ත්‍ර**

වාර්ෂික ක්ෂය

| | | |
|---|---|---|
| 2021 / 2022 | 80,000 x 25% | 20,000 |
| 2022 / 2023 | 80,000 x 25% | 20,000 |
| සමුච්චිත ක්ෂය | | 40,000 |

**2022/2023 කාලච්ඡේදයේ මිලට ගත් යන්ත්‍ර**

වාර්ෂික ක්ෂය

| | | |
|---|---|---|
| 2022 / 2023 | 60,000 x 25% | 15,000 |
| සමුච්චිත ක්ෂය | | 15,000 |

එම නිසා 2023/04/01 දිනට ප්‍රතිපත්ති වෙනස් කිරීම නිසා ක්ෂය වෙන් කිරීමට වන බලපෑම

| | | |
|---|---|---|
| 2018 / 2019 | = | 70,000 |
| 2019 / 2020 | = | 15,000 |
| 2020/ 2021 | = | 67,500 |
| 2021 / 2022 | = | 40,000 |
| 2022 / 2023 | = | 15,000 |
| | | **207,500** |

රු. 207,500 ක්ෂය වෙන්කිරීම වශයෙන් 2023/04/01 දිනට ගැලපීම කළ යුතුය. 2023/04/01 දිනට උපකරණ ක්ෂය වෙන් කිරීම ගිණුම ඔබට දී ඇත. එය වත්කම් ගිණුමකි. නමුත් ක්ෂය ගිණුම හර කිරීම කළ නොහැකිය. කිමද යත් පෙර වසරවල ක්ෂය ගිණුම් රඳවාගත් ලාභවලට ගැලපී ඇත. එම නිසා එම ප්‍රමාණය ගැලපිය යුත්තේ රඳවාගත් ලාභ ගිණුම හරහාය. ඒ සඳහා පහත ද්විත්ව සටහන භාවිතා කළ හැකිය.

| | |
|---|---|
| රඳවාගත් ලාභ ගිණුම (හර) | 207,500 |
| ක්ෂය වෙන් කිරීමේ ගිණුම් (බැර) | 207,500 |

මෙම අභ්‍යාසය දී ඇත්තේ එක් ගිණුම් වර්ෂයකට බලපාන පරිදිය. ප්‍රායෝගිකව මූල්‍ය ප්‍රකාශන සකසන විට සංසන්දිත වර්ෂයේ තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල මුහුණතේ පෙන්නුම් කරයි.

**<u>පැහැදිලි කිරීමේ අභ්‍යාස 02 (Example 02)</u>**

XYZ සමාගම 2020 අප්‍රේල් 01 වන දින රු. 500,000ක් වටිනා මෝටර් වාහනයක් මිලට ගෙන ඇත. එදින එහි ඵලදායි ජීවිත කාලය වර්ෂ හතරක් (4) බවත් සුන්බුන් අගය රු. 100,000ක් බවත් ඇස්තමේන්තු කර ඇත. නමුත් එහි ඵලදායි ජීවිත කාලය 2023 අප්‍රේල් 01 වන දින සිට තවත් වසර තුනකින් (3) කාලයකින් වැඩි විය යුතු බවත් නව සුන්බුන් අගය රු. 75,000ක් ලෙසත් ඇස්තමේන්තු වෙනස් කර ඇත. මෙම ඇස්තමේන්තු වෙනස්වීම 20x7 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා බලපාන ආකාරය පෙන්වන්න.

**පිළිතුරු**

**මෝටර් වාහන ක්ෂය ගිණුම**

| | | | |
|---|---|---|---|
| ක්ෂය වෙන්කිරීමේ ගිණුම | 31,250 | | |
| | | ලාභ හෝ අලාභ ප්‍රකාශය | 31,250 |
| | **31,250** | | **1,215,000** |

වර්තමාන ගිණුම් වර්ෂය - 2023/04/01 සිට 2024/03/31

ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමත් නිසා වර්තමානයට හා අනාගතයට බලපාන පරිදි ගැලපීම කළ යුතුය.

**මෝටර් වාහන ක්ෂය වෙන් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| | | ඉ/ගෙ ශේෂය (ස:1) | 300,000 |
| ප/ගෙ ශේෂය | 331,250 | රඳවාගත් ලාභ (ස2) | 31,250 |
| | **331,250** | | **331,250** |

සටහන්

ස:1

මෝටර් වාහනය මිලට ගත් දින සිට 2023/04/01 දක්වා කර ඇති ක්ෂය සෙවීම

| | | |
|---|---|---|
| පිරිවැය | = | 500,000 |
| සුන්බුන් අගය | = | (100,000) |
| ක්ෂය කළ හැකි අගය | = | 400,000 |
| | | |
| ඵලදායී ජීව කාලය | = | 4 |
| එක් වර්ෂයක ක්ෂය | = | 400,000/4 |
| | = | 100,000 |
| | | |
| 2020 / 2021 වර්ෂයේ ක්ෂය | = | 100,000 |
| 2021 / 2022 වර්ෂයේ ක්ෂය | = | 100,000 |
| 2022 / 2023 වර්ෂයේ ක්ෂය | = | 100,000 |
| 2023/04/01 දිනට සමුච්චිත ක්ෂය | = | 300,000 |

වර්තමාන වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීම.

| | | |
|---|---|---|
| පිරිවැය | = | 500,000 |
| මෙතෙක් ක්ෂය | = | (300,000) |
| නව සුන්බුන් අගය | = | (75,000) |
| ක්ෂය කළ හැකි අගය | = | 125,000 |

නව ඵලදායී ජීවිත කාලය (4+3=7-3=4) - වසර 04 යි

(2023/04/01 සිට ඉදිරියට ඇති වසර ගණන)

2023/ 2024 වර්ෂයේ ක්ෂය - 125,000/4

- 31,250

පැහැදිලි කිරීම

එම ඇස්තමේන්තුව වෙනස්කළේ 2023/04/01 දින බැවින් එදින සිට ඉදිරියට බල පැවැත්වෙන ලෙස අදාළ ගැලපීම කර ඇත.

2023/04/01 දින සිට ඉදිරියට ඇති සුන්බුන් අගය රු. 75,000කි.

2023/04/01 දින සිට ඉදිරියට ඇති ඵලදායී ජීවිත කාලය වර්ෂ 04කි.

ඒ අනුව 2023/ 2024 වර්ෂයට අදාළ ක්ෂය වීම් රු. 31,250කි.

මෙම අභ්‍යාසය වර්තමාන වර්ෂයට මෙන්ම අනාගත ගිණුම් වර්ෂ සඳහාද අදාළ ඇස්තමේන්තු වෙනස්වීම් බලපෑම් ඇති කරන උදාහරණයකි. කෙසේ වෙතත් ප්‍රවර්තන වසරට පමණක් බලපාන ඇස්තමේන්තු වෙනස්වීම්ද ඇත. උදාහරණ ලෙස බොල් ණය කපා හැරීමේ අගය වෙනස් කිරීම සැලකිය හැකිය. එය බලපානුයේ එය වෙනස් කරන ගිණුම් වර්ෂයටය.

**පැහැදිලි කිරීම අභ්‍යාස 03 (Example 03)**

ළහිරු සාමගමේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ.

**ළහිරු සමාගම**

**12/31 දිනට අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | රු. | රු. |
|---|---|---|
| | 2024 | 2023 |
| විකුණුම් | 165,000 | 154,000 |
| විකුණුම් පිරිවැය | (65,000) | (55,000) |
| බදු පෙර ශුද්ධ ලාභය | 100,000 | 99,000 |
| ආදායම් බදු | (20,000) | (19,800) |
| බදු පසු ශුද්ධ ලාභය | 80,000 | 79,200 |

2023 වර්ෂයේදී විකුණු රු. 5,000ක පිරිවැය ඇති තොගයක් වැරදීමකින් 2023 තොගය තුළ අඩංගු වී ඇති බව 2024 වර්ෂයේ අනාවරණය වී ඇත.
2023 වර්ෂය ආරම්භයේ රඳවාගත් ලාභ රු. 100,000ක් වූ අතර 2023 අවසාන රඳවාගත් ලාභ ශේෂය රු. 179,200කි. 2023 හා 2024 වර්ෂවල ආදායම් බදු ප්‍රතිශතය 20%ක් බව උපකල්පනය කරන්න. ළහිරු සමාගමේ ස්කන්ධ ප්‍රාග්ධනය රු. 500,000කි. එය වර්ෂ 02 තුළ නොවෙනස්ව පැවතුණි.

අවශ්‍ය වන්නේ:-
LKAS 08 අනුව ඉහත වැරදි නිවැරදි කළ යුතු ආකාරය දක්වන්න.

පිළිතුර
මෙම වරද සිදුවී ඇත්තේ සංසන්දිත (පෙර) වර්ෂයේදීය. සංසන්දිත වර්ෂයේ තොරතුරුද මූල්‍ය ප්‍රකාශනයේ මුහුණත පෙන්වන නිසා ඒවා නිවැරදි කළ හැකිය. නමුත් පෙර වර්ෂයේ ඉදිරිපත් කළ ලාභය නැවත ප්‍රකාශ කළ යුතුය. එය කළ යුත්තේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය හරහාය.

**ළහිරු සමාගම**

**2024/12/31 දිනට අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය**

| | සාමාන්‍ය කොටස් | රඳවාගත් ලාභ | රු. එකතුව |
|---|---|---|---|
| 2023/01/01 ආරම්භක ශේෂය | 500,000 | 100,000 | 600,000 |
| නැවත ප්‍රකාශකළ ලාභය (ස:1) | - | 75,200 | 75,200 |
| 2023/12/31 නැවත ප්‍රකාශ කළ ශේෂය | 500,000 | 175,200 | 675,200 |
| මුළු විස්තීර්ණ ආදායම | - | 84,000 | 84,000 |
| 2024/12/31 දිනට ශේෂය | 500,000 | 259,200 | 759,200 |

**ළහිරු සමාගම**

**2024/12/31 දිනට අවසන් වර්ෂය සඳහා**

**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | **2024** | රු. **2023** |
|---|---|---|
| විකුණුම් | 165,000 | 154,000 |
| විකුණුම් පිරිවැය | ස:3 (60,000) | ස:2 (60,000) |
| බදු පෙර ශුද්ධ ලාභය | 105,000 | 94,000 |
| ආදායම් බදු | ස:5 (21,000) | ස:4 (18,800) |
| බදු පසු ශුද්ධ ලාභය | 84,000 | 75,200 |

පැහැදිලි කිරීම

ස:1

2023 වර්ෂයේ ලාභය වන රු. 79,200 එක් වරක් ප්‍රකාශ කර ඇති නිසාත් 2024 වර්ෂයේ අදාළ වරද අනාවරණය වී ඇති නිසාත් එය නිවැරදි කිරීමේදී ප්‍රකාශ කළ ලාභය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හරහා නැවත ප්‍රකාශ කළ යුතුය.

ස:2

2023 වර්ෂය අවසානයේ තොග රු. 5,000ක් අධි තක්සේරු වී ඇති නිසා විකුණුම් පිරිවැය රු. 5,000කින් අඩුවේ. එමනිසා එය නිවැරදි කිරීම සඳහා දී ඇති විකුණුම් පිරිවැය රු. 55,000ට රු. 5,000ක් එකතු කර නිවැරදි විකුණුම් පිරිවැය ලෙස රු. 60,000ක් වාර්තා කර ඇත.

ස:3

2023 වර්ෂයේ අවසාන තොගය 2024 වර්ෂයේ ආරම්භක තොග වශයෙන් වාර්තා වේ. ඒ අනුව 2024 වර්ෂයේ ආරම්භක තොගය රු. 5,000කින් වැඩි වී ඇත. එම නිසා 2024 වර්ෂයේ විකුණුම් පිරිවැයද රු. 5,000කින් වැඩිවේ. එය නිවැරදි කිරීමට දී ඇති විකුණුම් පිරිවැය වන රු. 65,000න් රු. 5,000ක් අඩු කළ යුතුය. ඒ අනුව නිවැරදි විකුණුම් පිරිවැය රු. 60,000කි.

ස:4

බදු පෙර ශුද්ධ ලාභය රු. 94,000 වූ බැවින් ඒ සඳහා බදු අනුපාතය 20% ගණනය කිරීමෙන් රු. 18,800ක් ලැබේ.

ස:5

නව බදු පෙර ශුද්ධ ලාභය රු. 105,000න් බැවින් බදු අනුපාතය 20%ක් ගණනය කිරීමෙන් රු. 21,000ක් ලැබේ.

## සියලු දෙනා දැන සිටිය යුතු ඔන්ලයින් නීතිය

**සහකාර විගණකාධිපති, නීතිඥ වසන්න සිසිර කුමාර,**

**පේරාදෙණිය විශ්වවිද්‍යාල විගණන ශාඛාව**

වර්ෂ 2024 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත අප රට තුළ බලාත්මකවී ඇත.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ තීරණ ගැනීම වෙනුවෙන් කොමිෂන් සභාවක් පිහිටුවීම, තහනම් ප්‍රකාශනවලින් ආරක්ෂාව සැළසීම, තහනම් කාර්යයන් සඳහා මාර්ගගත ගිණුම්, ව්‍යාජ මාර්ගගත ගිණුම් භාවිතය වැළැක්වීම, තහනම් කාර්යයන් සඳහා භාවිත කරන මාර්ගගත ස්ථාන හඳුනා ගැනීම, තහනම් ප්‍රකාශ සන්නිවේදනය සඳහා මුදල් සැපයීම සහ ආධාර අනුබල දීම මැඩ පැවැත්වීම මෙම පනතේ අරමුණු වන්නේය.

මේ පනතේ විශේෂත්වය වන්නේ මේ පනත යටතේ ගැනෙන වරදක් ශ්‍රී ලංකාව තුළදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතදී ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජයට හෝ පදිංචි තැනැත්තෙකුට අලාභයක්, හානියක් හෝ පීඩාවක් කරනු ලබන ඕනෑම විටකදී අදාළ විමයි.

මෙම පනතේ අතිශය තීරණාත්මක කාරණය වන්නේ මෙතෙක් වරදක් බවට පත් කර නොතිබුණු සමාජ මාධ්‍ය හරහා කරනු ලබන සන්නිවේදන හා ක්‍රියාකාරකම් වරදක් බවට පත් කිරීම සඳහා දඬුවම් නියම කර තිබීමයි. ඒ අනුව කිසියම් සමාජ මාධ්‍ය ජාලා පරිශීලකයෙකු විසින් දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ තමා පල කරන අදහසක් හෝ සිදු කරන ප්‍රකාශයක් මේ පනත යටතේ වරදක් ලෙස නිගමනය කිරීමේ සහ ඒ සඳහා දඬුවම් පැමිණවීමේ හැකියාවක් පවති.

පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව යම් පුද්ගලයෙකු පල කරනු ලබන අසත්‍ය ප්‍රකාශයක් මඟින් රටේ ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යට හෝ මහජන සාමයට බාධාවක් වුවහොත් එය වරදක් වන අතර වසර 05 ක උපරිමයකට යටත්ව සිරදඬුවම් නියම කිරීම සහ රුපියල් ලක්ෂ 05 දක්වා දඩ නියම කිරීම හෝ ඒ දඬුවම් දෙකටම යටත් කිරීමේ හැකියාව පවති.

එසේ වුවද ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍ය, මහජන සාමයට තර්ජනයක් යන්න පිළිබඳ නිශ්චිත අර්ථනිරූපණයක් ලබා දිය හැකිද? එය සෑම විටම ප්‍රශ්න සහගත විය හැකිය, විවාදාත්මක විය හැකිය. යම් ආකාරයකට එම ප්‍රකාශ හේතුවෙන් බලපෑමට ලක්වන පාර්ශවයට වාසිදායක වන අයුරින් ඉතා පටු ලෙස අර්ථනිරූපණය කළහොත් එය වරදක් වන අතර ඉන් මහජනයා වෙත දැඩි බලපෑමක් සිදුවීම වැළැක්විය නොහැකිය.

පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව පුද්ගලයෙකු විසින් මාර්ගගත ක්‍රමයකට අධිකරණයට අපහාස වන ආකාරයේ අසත්‍ය ප්‍රකාශයක් කරන්නේ නම් එය වරදක් වන්නේය. අධිකරණයට අපහාස වන ආකාරයේ ප්‍රකාශයක් යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) අනු ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව පුද්ගලයෙකු අධිකරණයට අපහාස වන අයුරින් අසත්‍ය ප්‍රකාශයක් කළ හොත් කොමිෂන් සභාව විසින් එය අධිකරණය සමග සාකච්ඡා කර නඩු විභාගය පවත්වාගෙන යාමට අධිකරණයට සහය විය යුතු බව දක්වා ඇත.

පනතේ මෙම වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාව තවදුරටත් පුළුල් කිරීමක් වශයෙන් පෙන්වා දිය හැකිය. කෙසේ වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාව එම ව්‍යවස්ථාවේම සඳහන් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සමඟ ගැටෙන බව නීතිවේදීන්ගේ මතය වුවද, මේ යටතේ පසුගිය කාල පරිච්ඡේදය තුළ අප රටේ පුරවැසියන්ට සිර දඬුවම් පවා නියම වූ බව අපට දැකගත හැකි විය.

පනතේ 14 වන වගන්තිය තවත් සුවිශේෂි තත්ත්වයක් ගන්නා බව පෙනී යයි. මෙහිදි යම් පුද්ගලයෙකු මාර්ගගත ක්‍රමයට පල කරන ප්‍රකාශයක් හේතුවෙන් තවත් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් ප්‍රකෝප කරවන හෝ කැරළි ගැසීමට පොළඹවන්නේ නම් එය වරදක් වන්නේය. එහිදි වරදකරු වන්නේ කැරළි ගැසීමට සම්බන්ධ පුද්ගලයා නොව අදාළ අසත්‍ය ප්‍රකාශය කළ පුද්ගලයා වන අතර ලක්ෂ 05 නොඉක්මවන දඩයකට හෝ උපරිම වසර 05 ක සිරදඬුවමක් හෝ ඒ දෙකටම යටත් වන්නේය. එකී ප්‍රකාශය හේතුවෙන් කැරළි ගැසීමක් සිදු වී නොමැති වුවද ඒ සඳහා ලක්ෂ 03 ක් නොඉක්මවන දඩයකට හෝ වසර 03 ක සිර දඬුවමකට හෝ දෙකටම යටත් විය හැකිය. මෙහිදිද අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ පුද්ගලයෙකු විසින් කළ ප්‍රකාශයක් යම් කණ්ඩායම් ප්‍රකෝප කරවීමට බලපෑවද යන්න නිශ්චිතවම අර්ථනිරූපණය කළ හැකිද යන්න පිළිබඳවයි.

පනතේ 16 වන වගන්තිය යටතේ ආගමික හැඟීම් නිග්‍රහයට පත් කිරීමේ ඒකාන්ත සහ ද්වේශසහගත චේතනාවෙන් වාචික, ලිඛිත හෝ දෘශ්‍යමය නිරූපණය මගින් අසත්‍ය ප්‍රකාශයක් කිරීම වරදක් බව දක්වා ඇත. යම් පුද්ගලයෙකු පල කරනු ලබන ප්‍රකාශයක් නැතහොත් පෝස්ටුවක් මගින් වෙනත් ආගමික කණ්ඩායමකට බලපෑමක් වූවාද යන්න නිශ්චය කරන්නේ කෙසේද? මෙවැනි මතභේදාත්මක තත්ත්වයන් ඉදිරියේදී අපට දැකගත හැකි වන්නේය.

තවද 15 වන වගන්තිය යටතේ අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම තුළින් නීත්‍යානුකූලව ආගමික වැඳුම් පිදුම් කිරීමකට, ආගමික පූජාවක නිරතවන්නන්ට ස්වේච්ඡාවෙන් බාධා කිරීම වරදක් වශයෙන් දක්වා ඇත. මේ සඳහා වසර 03 ක සිර දඬුවමක් හෝ රුපියල් ලක්ෂ 03 ක් නොඉක්මවන දඩයකට හෝ එකී දඬුවම් දෙකටම හෝ යටත්විය යුතු වන්නේය.

සන්නිවේදනය යන්නට පනතින් ලබාදී ඇති නිර්වචනයට අනුව තහනම් ප්‍රකාශයක් සමාජ මාධ්‍ය ජාලයක පල කිරීම මෙන්ම එය හුවමාරු (Share) කිරීමද වරදක් ලෙස දක්වා ඇත. මක්නිසාදයත් එකී ප්‍රකාශය

තුළින් මහජන ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හා මහජන සාමයට තර්ජනයක් වන්නේ නම් එය වරදක් බව දක්වා තිබීමයි.

මාර්ගගත ගිණුමක් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම තුළින් රැවටීමට ලක් කිරීම, වෙනත් අයෙකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම, හිරිහැර කිරීම සඳහා ප්‍රකාශ සන්නිවේදනය කිරීම, ආරක්ෂක අංශවල සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු කැරළි ගැසීම සඳහා පෙළඹවීමේ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් කිරීමද දඬුවම් ලැබිය හැකි වරදවල් වන්නේය.

පනතේ 21 වන වගන්තිය දක්වන ආකාරයට මාර්ගගත ගිණුමක් හෝ මාර්ගගත ස්ථානයක් හරහා ළමයෙකුට අදාළව අපයෝජන ස්වභාවයෙන් හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු යම් ඡායාරූපයක්, හඬ පටයක්, වීඩියෝ පටයක් පල කිරීම වරදක් වන අතර උපරිම වසර 20 ක කාලයක් නොඉක්මවන සිර දඬුවමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ ඒ දෙකටම යටත් වන්නේය.

පනතේ 22 වන වගන්තිය අනුව මේ පනත යටතේ ගැනෙන වරදක් සිදු කිරීම සඳහා බොට් (පරිගණක වැඩසටහන්) සැකසීම හෝ වෙනස් කිරීම වරදක් වන අතර වසර 05 ක උපරිම කාලයක දඬුවමකට යටත් වන්නේය. මේ පනතේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී කාරණයක් වන්නේ මේ පනතේ සඳහන් කරුණක් වෙනත් ලිඛිත නීතියක් සමඟ අනනුකූල හෝ ගැටීමක් වන විට මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු බව 51 වන වගන්තියේ සඳහන් වීමයි. එහි අදහස වන්නේ අනෙකුත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මේ පනතේ ඊට අදාළ විධිවිධාන අදාළ වන බවය. මේ පනත යටතේ වන සියලු වැරදි සම්බන්ධයෙන් නඩු අසා විභාග කිරීමේ අධිකරණ බලය පනතේ 39(1) ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

පනතේ 40 වගන්තිය ප්‍රකාරව මේ යටතේ වන වරදක් සිදුකිරීමට තැත් කිරීමද වරදක් බවත් එකී වරදකට ඒ ඒ වරදවල් යටතේ සිර දඬුවම් කාලයෙන් අඩක් සහ දඩ මුදලින් අඩක් දඩ නියම කිරීමේ හැකියාවක් මේ පනත යටතේ ලබාදී ඇත. තවද පනතේ 41 සහ 42 වගන්ති ප්‍රකාරව වරදකට අනුබල දීම, වරදක් කිරීම සඳහා වෙනත් යම් තැනැත්තෙකු සමඟ කුමන්ත්‍රණය කිරීමද වරදක් ලෙස දක්වා ඇත්තේය.

මේ යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවට අදාළ අන්තර්ජාල සේවාව සපයන ආයතනයෙන් තොරතුරු විමසීමේ බලයද, තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කළ හොත් මහෙස්ත්‍රාත් අධිකරණයෙන් තොරතුරු සපයන ලෙස නියෝගයක් ලබා ගැනීමේ බලයද ලබා දී ඇත.

ඔබ මේ දක්වාම මාර්ගගත ක්‍රම ඔස්සේ අදාළ ප්‍රකාශයේ ස්වභාවය, තරම පිළිබඳ අදහසක් ඇතිව හෝ නැතිව ප්‍රකාශ යොමු කරන්නට ඇති නමුත් මින් ඉදිරියට අප සියලු දෙනාම ඉතාමත් කල්පනාකාරීව, විමසිලිමත්ව සමාජ මාධ්‍ය භාවිතා කරන්නට පුරුදු පුහුණු විය යුතු බව පෙන්වා දිය හැකිය.

කෙසේ වුවද තොරතුරු තාක්ෂණ නීතිය අනුව සමාජ මාධ්‍ය හරහා සිදු වන සන්නිවේදනය නීතියක් මඟින් පාලනය කිරීම අපහසු කාර්යයක් වන්නේය. මක්නිසාදයත් මෙම සමාජ මාධ්‍ය ජාලා මෙහෙය වන්නේ දේශසීමාවලින් බැහැර පාර්ශවයන් විසින්ය. විශේෂයෙන් Facebook, WhatsApp, Google වැනි ආයතන මේ අතුරින් ප්‍රධාන තැනක් ගනී. මේවා පාලනයේදී එකී ආයතනයවලට බලපාන්නේ එකී මාධ්‍ය ක්‍රියාත්මක වන රටවල පවතින නීතියයි. කිසියම් රටක දේශීය නීතියක් මඟින් අන්තර්ජාතිකව ක්‍රියාත්මක වන සමාජ මාධ්‍ය පාලනයට උත්සාහ කිරීම කොතරම් ප්‍රායෝගිකද යන්න මෙහිදී ගැටළු සහගත වන්නේය.

තාක්ෂණය ඔස්සේ සිදුවන වැරදි තාක්ෂණය මඟින් පාලනය කිරීම වඩාත් ප්‍රායෝගික වුවද, අප රටෙහි එවැනි වැරදි නීතිය මඟින්ම පාලනය කිරීමට උත්සාහ කරනු ලබයි. මෙහිදීද උත්සහ කරන්නේ එවැනි වැරදි නීතිය මඟින්ම පාලනය කිරීමයි.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් පුළුල් අර්ථ කථනයන් ලබාදීමට උත්සාහ කිරීමට තවමත් ප්‍රමාද නොමැත. මක්නිසාදයත් තවමත් නීතිය ක්‍රියාත්මක වීම ආරම්භ වූවා පමණි. මේ සම්බන්ධයෙන් වරදකරුවන් වන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම, නඩු කටයුතු පවත්වාගෙන යාම දඬුවම් පැමිණවීම බහුලව සිදුවීම ඉදිරියේදී දක්නට ලැබිය හැකිය.

මෙහිදී අළුතින් පිහිටුවනු ලබන කොමිෂන් සභාව, පොලිසිය ඇතුළු සියලු දෙනා ඉතාමත් බුද්ධිමත්ව කටයුතු කළ යුතු බව අවධාරණය කළ යුතුය. මක්නිසාද සාමජ මාධ්‍ය භාවිතය ලොව පුරා අසාමාන්‍ය ලෙස වර්ධනය වෙමින් ඒ සඳහා ඇබ්බැහි වෙමින් පවතින යුගයක මහජනතාව අතරින් විවිධාකාරයේ ප්‍රකාශ සන්නිවේදනය වීම වැළැක්විය නොහැකිය. එසේ ඔවුන් විසින් පල කරණු ලබන ප්‍රකාශ පිළිබඳ මේ පනත යටතේ දඬුවම් පැමිණවීම අඛණ්ඩව සිදු වුවහොත් එය මහත් සමාජ ගැටලුවක් බවට පත් විය හැකි අතරම අධිකරණය වෙත විශාල නඩු සංඛ්‍යාවක් විභාග කිරීමට සිදු වීම තුළින් අධිකරණ කාර්යය භාරයද සංකීර්ණ තත්ත්වයක් ගනු ඇත.

කෙසේ වුවද අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික නීතියට ගරු කළයුතු වන්නේය. විශේෂයෙන් භාෂණයේ, ප්‍රකාශනයේ නිදහස නීතිය ඉදිරියේ සාමානාත්මතාවය ආරක්ෂා විය යුතු වන්නේය. මේ පනත යටතේ සඳහන් වන දේ වැරදි ආකාරයකට ක්‍රියාත්මක වුවහොත් මූලික අයිතීන් සාහසික ලෙස පාලනය කිරීමේ හැකියාවක් පවතිනු ඇත.

කෘත්‍රිම බුද්ධිය (AI) සහිත තාක්ෂණික යුගයක සිටින අප හට මෙවැනි දෑ තාක්ෂණික වශයෙන් පාලනය කළ හැකිව තිබියදී නීතිමය වශයෙන් පාලනය කිරීමට උත්සාහ කිරීම ඉතාමත් බරපතල තත්ත්වයක් විය හැකිය.

මේ පනතේ විධිවිධාන ඉදිරියේදී බොහෝ දුරට සංශෝධනයට ලක් වීමේ හැකියාවක් පවතින බව පෙන්වා දිය හැකිය. එසේ වුවද සමාජ මාධ්‍ය භාවිතයේදී පෙරට වඩා බුද්ධිමත් වන්න. එසේ නොවුන හොත් ඉදිරියේදී ඔබ අප සියලු දෙනාටම බරපතල ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු විය හැකිය.

# இலங்கையில் உள்ள உள்ளூராட்சி அதிகார சபைகள் தொடர்பான கணக்கீட்டு மற்றும் கணக்காய்வு நடைமுறைகள் (Accounting and Auditing Procedure for the Local Authorities in Sri Lanka)

---

**By. A.M.Mahir**
**Superintendent of Audit**

## (அ) கணக்கீட்டு பணிகள் தொடர்பான சட்ட ஏற்பாடுகள்

ஒவ்வொரு உள்ளூராட்சி அதிகார சபையும் சட்டத்தின் பிரகாரம் உருவாக்கப்பட்ட பின்னர் அதன் பொதுவான நிதித் தேவைகளுக்கென ஒரு நிதியம் ஸ்தாபிக்கப்படுதல் வேண்டும். இந்த நிதியத்தை ஸ்தாபிப்பது தொடர்பான பிரேரணை பிரதேச சபைகள் சட்டத்தின் பிரிவு 129 (1) இன் பிரகாரமும், மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 158 (1) இன் பிரகாரமும், நகர சபைகள் கட்டளைச் சட்டத்தின் 185 (1) இன் பிரகாரமும் சம்பந்தப்பட்ட உள்ளூராட்சி மன்றத்தின் முதலாவது சபை கூட்டத்தின் போது நிறைவேற்றப்படுதல் வேண்டும்.

உள்ளூராட்சி மன்றத்தினால் அறவிடப்பட்ட அல்லது சேகரிக்கப்பட்ட அனைத்து வருமானங்களும், ஒன்று திரண்ட வருமானமும் பிரதேச சபை சட்டத்தின் பிரிவு 129 உட்பிரிவு (2), நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 158 (1) மற்றும் மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 185 உட்பிரிவு (2) என்பவற்றின் பிரகாரம் இந்த நிதியத்தில் வரவு வகைப்படுதல் வேண்டும்.

ஓர் உள்ளூராட்சி மன்றத்தினால் ஏற்றுக் கொள்ளப்படும் பணத் தொகைகள் அனைத்தும் அமைச்சரினால் அங்கீகரிக்கப்பட்டுள்ள ஒரு வங்கியில் பேணிவரும் நடைமுறைக் கணக்கொன்றில் வரவு வைக்கப்படுதல் வேண்டும். இக் கணக்கு பிரதேச சபைச் சட்டம் பிரிவு 130, நகர சபைகள் கட்டளைச் சட்டம் பிரிவு 158 உட்பிரிவு (1) மற்றும் மாநகர சபைகள் கட்டளைச் சட்டம் பிரிவு 186 என்பவற்றின் பிரகாரம் முறையே ‘‘பிரதேச சபை நிதியம்’’, ‘‘உள்ளூர் நிதியம்’’ மற்றும் ‘‘மாநகர நிதியம்’’ என அழைக்கப்படும்.

பிரதேச சபைச் சட்டத்தின் பிரிவு 131 இன் பிரகாரம், நம்பிக்கை பொறுப்புக் கட்டளைச் சட்டத்தின் பிரிவு 20 இல் குறிப்பிடப்பட்டிருக்கும் பிணையங்களை கொள்வனவு செய்வதற்கென சபையின் மிகை நிதிகளை பயன்படுத்த முடியும். நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 158 உட்பிரிவு (4) மற்றும் மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 187 என்பவற்றில் இதனையொத்த ஏற்பாடுகள் காணப்படுகின்றன. இலங்கை அரசாங்கத்தின் பிணைமுறிகள் மற்றும் அரச முதலீட்டு வங்கியினால் வெளியிடப்பட்டிருக்கும் கடன் முறிகள் மற்றும் இலங்கை அரசாங்கத்தினால் உத்தரவாதப்படுத்தப்பட்டிருக்கும் எவையேனும் பிணைமுறிகள் என்பவற்றில் முதலீடுகளை மேற்கொள்வதற்கென மிகை நிதிகளை பயன்படுத்திக்கொள்ள முடியும்.

உள்ளூராட்சி நிதியங்களைக் கொண்டு செலவுகளை மேற்கொள்ளக் கூடிய நோக்கங்கள் பிரதேச சபைச் சட்டத்தின் பிரிவு 132 இலும், நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 159 இலும், மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 188 இலும் குறிப்பிடப்பட்டுள்ளன.

கொடுப்பனவுகள் தொடர்பாக வழங்கப்படும் அனைத்துக் காசோலைகளிலும், 2012 இன் 21 ஆம் இலக்க உள்ளூர் அதிகார சபைகள் (விசேட ஏற்பாடுகள்) சட்டத்தின் மூலம் திருத்தப்பட்டவாறான பிரதேச சபைகள் சட்டத்தின் பிரிவு 132 இன் பிரகாரம், உள்ளூராட்சி உதவி ஆணையாளரினால் அதிகாரமளிக்கப்பட்டடிருக்கும் (தவிசாளர் தவிர்ந்த) இரு உத்தியோகத்தர்கள் கையொப்பமிடப்படுதல் வேண்டும். 2012 இன் 21 ஆம் இலக்க மேற்படி சட்டத்தின் மூலம் திருத்தப்பட்டவாறான நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 159 உட்பிரிவு (2) இன் பிரகாரம் இத்தேவை விதித்துரைக்கப்பட்டுள்ளது. அதன் பிரகாரம், உள்ளூராட்சி ஆணையாளரின் அங்கீகாரத்திற்கு அமைவாக, சபையினால் நியமனம் செய்யப்பட்ட (தவிசாளர் தவிர்ந்த) இரு உத்தியோகத்தர்களினால் காசோலைகள் கையொப்பமிடப்படுகின்றன. மேலே குறிப்பிடப்பட்ட சட்டத்தின் மூலம் திருத்தப்பட்டவாறான மாநகர சபைகள் கட்டளைச் சட்டம் பிரிவு 189 இன் பிரகாரம், சபையினால் அதிகாரமளிக்கப்பட்ட (முதல்வரைத் தவிர்ந்த) இரு உத்தியோகத்தர்கள் காசோலைகளில் கையொப்பமிட முடியும்.

**<u>நாளாந்த கணக்கீட்டுப் பணிகள் மற்றும் வருடாந்த கணக்குகளை தயாரித்தல் என்பன தொடர்பான சட்ட ஏற்பாடுகள்</u>**

பிரதேச சபைகள் சட்டத்தின் பிரிவுகள் 171 மற்றும் 184 என்பவற்றின் பிரகாரம், பிரதேச சபையின் கணக்கீடு தொடர்பான விதிகளையும், பயன்படுத்த வேண்டிய படிவங்களையும் விதித்துரைக்கும் அதிகாரம் உள்ளூராட்சி அமைச்சருக்கு வழங்கப்பட்டுள்ளது. அதன் பிரகாரம், இது தொடர்பாக அமைச்சரினால் உருவாக்கப்பட்ட விதிமுறைகள் 1989 ஏப்ரல் மாதம் 17 ஆந் தேதியிடப்பட்ட (அதிவிசேட) வர்த்தமானி இல. 554/5 இல் பிரசுரிக்கப்பட்டுள்ளன.

நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 176 இன் பிரகாரம், கணக்கீட்டு நோக்கங்களுக்கென உள்ளூராட்சி ஆணையாளரினால் விதித்துரைக்கப்பட்டிருக்கும் ஒரு பதிவேடு அல்லது பதிவேடுகளை பயன்படுத்தப்படுதல் வேண்டும். இக்கட்டளைச் சட்டத்தின் பிரிவு 177 இன் பிரகாரம், ஒவ்வொரு வருடத்தினதும் டிசம்பர் 31 ஆந் திகதி வரையிலான பெறுவனவுகள் மற்றும் கொடுப்பனவுகள் குறித்த ஒரு கணக்கு மற்றும் அத்திகதியிலுள்ளவாறான சொத்துக்கள் மற்றும் பொறுப்புக்கள் தொடர்பான கூற்று என்பன தயாரிக்கப்படுதல் வேண்டும். அப்பிரிவின் 2 ஆம் உப பிரிவின் பிரகாரம், வருமான மற்றும் செலவுக் கணக்குகளின் ஒரு சாராம்சமும், சொத்துக்கள் மற்றும் பொறுப்புக்கள் கூற்றும் அடுத்து வரும் வருடத்தில் மார்ச் 1 ஆந் திகதிக்கு முன்னர் பொது மக்களின் அறிவித்தலுக்கென வர்த்தமானியில் பிரசுரிக்கப்படுதல் வேண்டும்.

நகர சபைகளின் கணக்குகள் மற்றும் வரவு செலவுத் திட்டம் என்பவற்றை தயாரிப்பதில் பயன்படுத்தப்பட வேண்டிய சம்பந்தப்பட்ட படிவங்கள் தொடர்பான விதிமுறைகளை உருவாக்கும் அதிகாரம் 1939 இல் உருவாக்கப்பட்ட நகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 193 இன் பிரகாரம் அமைச்சருக்கு வழங்கப்பட்டிருந்த போதிலும், இதுவரையில் அத்தகைய விதிமுறைகள் எவையும் உருவாக்கப்படவில்லை. இக்குறைபாடு காரணமாக நகர சபைகளில் கணக்குகளை தயாரிப்பதற்கான ஒரு சட்ட ரீதியான நடைமுறை இருந்து வரவில்லை.

மாநகர சபைகளில் மதிப்பீடுகள், வரவு செலவுத் திட்டங்கள், கூற்றுக்கள் மற்றும் கணக்குத் திரட்டுக்கள் என்பவற்றைத் தயாரிப்பதற்கென பயன்படுத்த வேண்டிய படிவங்களும், ஏனைய ஆவணங்களும், மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் பிரிவு 172 உட்பிரிவு (1) பந்திகள் (g), (h) மற்றும் (i) என்பவற்றின் பிரகாரம், மாநகர சபைகளினால் உருவாக்கப்பட்டிருக்கும் துணை விதிகளின் மூலம் விதித்துரைக்கப்படுதல் வேண்டும். எவ்வாறிருப்பினும், இதுவரையில் அத்தகைய துணை விதிகள் **கொழும்பு மாநகர சபை தவிர்ந்த** வேறு எந்தவொரு மாநகர சபையினாலும் உருவாக்கப்படவில்லை. தற்பொழுது கொழும்பு மாநகர சபை தவிர்ந்த ஏனைய மாநகர சபைகள் உள்ளூராட்சி திணைக்களத்தினால் 1974 இல் அறிமுகம் செய்து வைக்கப்பட்ட **விக்கிரமநாயக்க கணக்கீட்டு முறையை** பின்பற்றி வருகின்றன.

## இறுதிக் கணக்குகள் மற்றும் வருடாந்த வரவு செலவுத் திட்டத்தின் தயாரிப்பு

இறுதிக் கணக்குகள் தற்பொழுது உள்ளூராட்சி மன்றங்களினால் தயாரிக்கப்பட்டு வரும் வருமான மற்றும் செலவுக் கணக்குகளையும் சம்பந்தப்பட்ட வருடத்தின் டிசம்பர் 31 இல் உள்ளவாறான சொத்துக்கள் மற்றும் பொறுப்புக்களை எடுத்துக் காட்டும் ஐந்தொகையையும் உள்ளடக்குகின்றன. எந்தவொரு நிறுவனத்திலும் பின்பற்றப்பட்டு வரும் கணக்கீட்டு நடைமுறையை மூன்று படிமுறைகளில் பிரித்துக் காட்ட முடியும்.

- **அடிப்படை ஆவணங்களின் தயாரிப்பு** - பற்றுச் சீட்டுக்கள் மற்றும் உறுதிச் சீட்டுக்கள், களஞ்சியசாலையிலுள்ள பொருட்கள் தொடர்பான பற்றுச் சீட்டுக்கள் மற்றும் களஞ்சியசாலையினால் வழங்கப்பட்ட பொருட்கள் தொடர்பான பற்றுச்சீட்டுக்கள் முதலியவை.
- **பயன்பாட்டு ஆவணங்களை பதிவு செய்தல்** - வீத வரிகள், வரிகள் மற்றும் குத்தகை, வாடகை பதிவேடு, உரிமக் கட்டண பதிவேடு மற்றும் நானாவித கடன் கொடுத்தோர் பட்டியல்.
පිළිතුර නැත යන්නයි. වර්තමානයේදී ධනවාදී රටවල් ලෙස පිළි නොගන්නා වෙනත් ආර්ථික රටාවන් සහිත රටවල් අඩු වැඩි වශයෙන් තම යුධමය ආර්ථිකමය හා ආක්‍රමණික ආකල්ප ඔස්සේ අනෙක් රටවල්වලට බලපෑම් එල්ල කරයි.උදාහරණ ලෙස සමාජවාදී පදනමක් සහිතව පැනනැගි රටවල් වන රුසියාව සෝවියට් දේශය බිඳවැටීමෙන් පසුව ආරක්ෂක හා මිලිටරි කර්මාන්තය සඳහා කරන මැදිහත්වීම, චීනය විසින් ගෙන යන ආර්ථික වැඩපිළිවෙල ඒ සඳහා උදාහරණ වේ.

**අවසානය**

සාරාංශයක් ලෙස, ධනේශ්වර රටවල මිලිටරි, ආර්ථික ආක්‍රමණශීලී ආකල්ප තුන්වන ලෝකයේ රටවලට ප්‍රබල බලපෑම් ඇති කළ හැකි අතර, ඒවායේ සංවර්ධන ගමන් පථයන්, දේශපාලන ගතිකත්වයන් සහ ජාත්‍යන්තර සබඳතා හැඩගස්වයි. මෙම බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා සමානාත්මතාවය සහ තිරසාර ආර්ථික ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම, ස්වෛරීභාවයට සහ මානව හිමිකම්වලට ගරු කිරීම සහ ඇතුළත් සහ සහයෝගී ජාත්‍යන්තර සබඳතා පෝෂණය කිරීම වැනි අවශ්‍යතාවයන් තම රාජ්‍ය ප්‍රතිපත්ති අතරට එක් කරගැනීම ශ්‍රී ලංකාව වැනි රටවල් සඳහා ඇති කාලීන අවශ්‍යතා වේ.

## දූෂණයෙන් තොර රටක් බිහි කරමු

බී. එන්. ප්‍රශාදිනී
කලමනාකරණ සහකාර - තැපැල් ශාඛාව

දූෂණයෙන් තොර රටක් බිහි කිරීම යනු සමාජය,පරිසරය සහ ආර්ථිකය හරහා සම්පූර්ණව ශක්තිමත් සහ සාමකාමී රටක් ගොඩනැගීමේ අත්‍යවශ්‍යතාවයක් වන අතර, එයට එකඟ වීමෙන් පමණක් සාර්ථකව ඉටු කර ගත හැක. දූෂණය තොර රටක් යනු කව්රුත් විශ්වාස කළ හැකි ගරු කල හැකි සහ සත්‍යතාවය, සාධාරණතාවය සහ අවංකභාවය ඇඟවෙන ආණ්ඩුක්‍රමයක් සහ සමාජයක් වීම අත්‍යවශ්‍ය වේ.

පළමුව පාලනයේ අවංකභාවය සහ සවිස්තරාත්මක කාර්යාලීය විනිවිදභාවය ප්‍රමුඛත්වයට තබා ගැනීම, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා නායකයින් සියලු කටයුතු විනිවිදභාවයෙන් කිරීම තුළින් ජනතාවගේ විශ්වාසය දිනා ගත හැකි අතර, දූෂණයට ඉඩ නොදී සවිමත්ව සහ පසුබැසීමකින් තොරව රටේ පරිපාලනය සිදු කළ යුතුය. දූෂණය හේතුවෙන් සමාජය, ආර්ථිකය හා පාලනය ආදි ක්ෂේත්‍රවලට දැඩි අහිතකර බලපෑම් සිදු වේ. එවැනි දූෂණ ක්‍රියාවලට ඉඩ නොදිම මගින් දූෂණයෙන් තොර සමාජයක් බිහි කළ හැක.

දෙවැනියට ආර්ථිකයේ ස්ථාවරතාවය සහ සාධාරණ බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර, දූෂණය යම්තාක් දුරට නොව බෙහෙවින් පාලනය කල හැකිය. සුරක්ෂිත ආර්ථික පද්ධතියන් සහ ජනතාවගේ පරිශීලන හැකියාවන් වර්ධනය කිරීම තුළින්, පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල දූෂණය අඩු කළ හැක. සාධාරණ බදු ක්‍රමයක් ව්‍යාපාරික නීති රීති කෙරෙහි දැඩි පරික්ෂා කිරිම හරහා ව්‍යාපාරික වශයෙන් අභ්‍යන්තර විශ්වාසයක් තහවුරු කළ හැකි අතර, ඒ ආකාරයෙන්ම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේ අවස්ථා නිර්මාණය කළ හැකි අතර ජනතාව තුළ දූෂණය පිළිබඳව නිසි අවබෝධයක් ඇති කළ හැක. එම නිසා සාමාන්‍ය ජනතාවට පමණක් බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකර ව්‍යාපාරිකයාටද එකසේ බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් දූෂණයෙන් තොර රටක් හා රජයට අමතර ආදායමක් ද ඉපයිය හැකිය.

තෙවැනියට ප්‍රජා අධ්‍යාපනය සහ නීති රීති පිළිබඳ සත්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කර ජනතාවට දූෂණය පිළිබඳ අවබෝධයක් ලබා දිය යුතුය. දූෂණය පිළිබඳ අවබෝධයක් ඇති කිරීමේ අරමුණින් ජනතාවගේ ක්‍රියාකාරීත්වයට සහ උනන්දුවට අභ්‍යන්තර බලයක් සැපයිය හැක. එවිට දූෂණයට එරෙහිව සටන් කරන ජනතාවක් බිහි වේ. එමෙන්ම ජනතාව දූෂණය පිළිබඳ දැනුවත් වීම මගින් ජනතාවට දූෂණයට එරෙහිව හඬ නැගිය හැක. එම නිසා සත්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ජනතාවට දූෂණය යන්න දැන ගැනීමට මහත් පිටුවහලකි.

තරුණ පරපුරගේ සහභාගිත්වය සහ නායකත්වය දූෂණය තොර රටක් බිහි කිරීමට මූලිකත්වයන් සපයයි. තරුණ පරපුර නව මානව සම්පත් වලින් පිරි දූෂණයෙන් තොර සමාජයක් පවත්වාගෙන යාමේ සහ නව පරපුරේ අවංක නායකයන් බිහි කිරිම සඳහා එකඟතාවයන් සහ සහයෝගීතාවයක් තුළින් එකතු වි එක්ව කටයුතු කරයි. දූෂණයෙන් තොර රටක් බිහි කිරීමට පියවර ගෙන, ඒ සඳහා අදාළ උත්සාහයන් ක්‍රියාත්මක කිරීමේදී අපේ වගකීම් ඉටු කිරීම අත්‍යාවශ්‍ය ය. දූෂණයෙන් තොර රටක් බිහි කිරීමට අප සියලු දෙනාගේ සහයෝගීතාවය, වගකීම් සහ උනන්දුව ඉතා වැදගත්ය. දූෂණය වැලැක්වීමේ යෝජනා අසා අමතක නොකර ක්‍රියාවට නැංවීමෙන් ජනතාවට බියෙන්, සැකයෙන් තොරව ජීවත් විය හැක. එම නිසා යෝජනා වචනයට සීමා නොකර ක්‍රියාවට නැංවීම අනිවාර්ය කරුණකි.

අපි දූෂණයට එරෙහිව කටයුතු කිරීම මගින් සාධාරණ විශේෂී සහ ගෞරවනීය සමාජයක් ගොඩනගා ගත හැක. අපේ කැපවීම සහ ජනතා අභිප්‍රාය පිරිවැය අඩු කිරීමට විශේෂාංගයක් වේ. දූෂණය තොර රටක් බිහි කරමු. ඉන් දූෂණය නොමැති සාමකාමී සහ සමබර සමාජයක් ගොඩනගා ගැනීමේ අපේ අරමුණ සැබෑ කරමු. හෙට උපදින අද ඉපදී සිටින අනාගතයේ රට භාර ගැනීමට සිටින නායකයින් දූෂණය නම් රකුසාට ලබා නොදී බේරා ගැනිම වත්මන් නායකයන් වන අප , එනම් වැඩිහිටියන්ගේ වගකීමයි.

# කෙටි කතාව

## පළමු පත්වීම

### ගිවෝන් යානිකා නන්දසේන
### වරලත් පුස්තකාලයාධිපතිනී - ජාතික විගණන කාර්යාලය

අපි හැමෝටම අපේ මුල්ම රැකියාව කළ ස්ථානය සදානුස්මරණීයයි කියලා කිව්වොත් ඒක බොරුවක් නෙමෙයි කියලයි මං හිතන්නෙ... වසර ගනනාවක් ගෙවිලා ගිහිල්ලත් අදටත් ඇස් පියාගෙන ඒ මතක අතරෙ සැරිසරන්න මට
පුළුවන්...මුල්ම පත්වීම් ලිපිය ලබපු දවසෙ ඉඳන්...ඔව් ඇත්තෙන්ම...
*****************************************************************************

"දුව අන්න ඔයාට ලියුමක් තිබුනා රෙජිස්ටර් පෝස්ට්... කම්කරු දෙපාර්තමේන්තුවෙන් එවලා තියෙන්නේ...
අර ඔයා ගිය ඉන්ටර්විව් එක ගැනද දන්නෙ නෑ..."
මව පැවසුවේ මා සරසවියේ දේශනයකට සහභාගී වී පැමිණි එක් සෙනසුරාදා දිනයක හවස් වරුවේය.
"අපෝ අම්මා ඒක නම් වැඩක් නෑ.. මාව තේරිලා නැතුව ඇති... එදා ඉන්ටර්විව් එකට ඇවිත් හිටිය සේරම ඩිග්‍රිය සම්පූර්ණ කළ අය... මං විතරයි එතන ඉගෙන ගන්න ළමයෙක්ට හිටියෙ...ඒ මදිවට ඔක්කොම ඇවිත් හිටියේ සාරි ඇඳලා ජැන්ඩි පහට... මං විතරයි කැෂුවල් ගිහින් හිටියේ හාල්පාරුවා වගේ...එදා මුලු ඉන්ටර්විව් බෝර්ඩ් එකම මං දිහා බැලුවේ අමුතු ජීවියෙක් දිහා බලන විදිහට..."
මා කීවේ මව දුන් ලිපිය අතට ගන්නා අතරතුර තරමක දෙගිඩියාවෙනි.
" හරි හරි ළමයෝ ඕක කඩලා බලන්නකො ඉතිං අංජනම් බලන්නෙ නැතුව මෙතන"
ඇගේ කීමට මා ලහි ලහියේ ලිපිය කැඩුවේ ගැහෙන හදවතිනි.
මා කම්කරු දෙපාර්තමේන්තුවේ තෙවන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිනියක ලෙස තෝරා පත් කර ගෙන ඇති බවත් ලබන මස මුල සිට වැඩ භාර ගත යුතු බවත් එම ලිපියේ සඳහන් කර තිබුණි. විහඟ වෙස් ගෙන ඇත අවකාශයේ පියාසලා යන්නාක් බඳු ප්‍රහර්ශයකි එවර මගේ හදවතට දැනුනේ..මේ මා බලාපොරොත්තු වූ රැකියාවයි. කුඩා අවධියේ සිට පොත පතට ඉමහත් ඇල්මක් දැක්වූ මා පොත් සමග බැඳුණු මෙම වෘත්තියට ඇලුම් කිරීමට පෙළඹුණේ විදුහලේ පුස්තකාලය භාර ශිෂ්‍ය නායිකාව වීමෙන් පසු එවකට එහි පුස්තකාලයාධිපතිනිය සමග සමීප ඇසුරක් ඇතිවීමත් සමගයි.
උසස් අධ්‍යාපනය සඳහා පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ධාරාවන් තෝරා ගැනීමට මා උනන්දු කළේ ඇයයි.
"අනේ අම්මා ඉන්ටර්විව් එකෙන් මාව තේරිලා...මට මේක හරියට හීනයක් වගේ...ලබන මාසෙ පළවෙනිදා ඉඳන් වැඩ භාර ගන්නලු..."
මං කිව්වේ සතුට වැඩි කමට උඩපැනලා අම්මාවත් බදාගන්න ගමන්
" මට හරිම සතුටුයි දුව..අඩු වයසින්ම ඔයාට රස්සාවක් ලැබුණු එක මොන තරම් දෙයක්ද... තාත්තා ඔයාව එතන ජොබ් බැන්ක් එකේ රෙජිස්ටර් කරලා තිබුණු නිසා හොඳට ගියා"
අම්මාගෙ මූණෙ හිනා මල් පිපිලා තිබුණු හැටි මට අද වගේ මතකයි... අම්මා විතරක් නෙමෙයි තාත්තා වගේම මගේ නංගිත් එදා හිටියෙ හරිම සතුටින්...
ජීවිතේ පළවෙනි පාරට බොහොම අමාරුවෙන් ඔසරියකුත් ඇඳගෙන තාත්තත් එක්ක පත්වීමෙ වැඩ භාර ගන්න ගියපු හැටි මට මේ දැනුත් මතක් වෙනවා...
"දුව ඔයාට වැඩ ඇරිලා එනකොට තනියම එන්න පුළුවන් නේද..? ගන්න ඕන බස් එක, බහින තැන එහෙම මතකයිනෙ..නැත්නම් මං එන්නද හවසට ඔයාව ගන්න...? "
"එපා තාත්තා ඕන නෑ...මට තනියම එන්න පුළුවන්..."

එසේ කියා පියාට සමු දුන් මා පරිපාලන අංශයට ගොස් වැඩ භාර ගැනීමේ ලිපිය ද අත්සන් කර දී බිම් මහලේ පිහිටි මගේ සේවා ස්ථානය වූ කම්කරු දෙපාර්තමේන්තු පුස්තකාලයට පිවිසියෙමි.
ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය ඒ මොහොතේ නොසිටි අතර සිනහවකින් මුව සරසාගෙන මා පිළිගැනීමට ඉදිරියට ආවේ ප්‍රධාන ලිපිකාරිණියයි. මැදි විවේ පසු වූ ඇය නමින් කුසුම් විය. ඇයට අමතරට සුභා සහ හශ්මිනී නමින් තවත් තරුණ ලිපිකාරිණියන් දෙදෙනෙක් විය. මගේ සම වයසේ පසු වූ හශ්මිනී ඉතා ඉක්මනින් මා හා මිතුරු වූවත් පොත් බැහැරදෙන අංශයේ සිටි සුභා අක්කා සිටියේ බුම්මාගෙනය. කාරයාල කාර්ය සහායකයින් තිදෙනෙකු වූ අතර ඉන් ජ්‍යෝෂ්ඨතමයා ඉදිරි පෙල අසුනේ පසු වූයේ ඉතාමත් අහංකාර ලීලාවෙනි. ද්‍රවිඩ ජාතිකයෙකු වූ ඔහු නමින් කොම්බන් නම් විය. අනෙක් දෙදෙනා සුහදශීලී කොලු ගැටවුන් දෙදෙනෙකි. සරිත් මුස්ලිම් ළමයෙක් වූ අතර ලීලාරත්න නම් වූ අනෙකා ගමක හැදුනු තරුණයෙකි. ඇත්තෙන්ම පුස්තකාලය සියලු ජාතීන්ගේ සුසංයෝජනයක් විය.. එම පුස්තකාලය කම්කරු නිතී පිළිබඳ පත පොතින් සන්නද්ධ වූ විශේෂ පුස්තකාලයකි. නවකතා කියවීමට ඉමහත් රුචිකත්වයක් දැක්වූ මා හට එම නීති පොත් කෙරෙහි කිසිදු ප්‍රියතාවයක් නොවිණි. මද වේලාවකින් ප්‍රධාන පුස්තකාලයාධිපතිනිය පැමිණියාය. මා සමග සුහද කතා බහින් අනතුරුව ඇය මට පැවරූ පලමු රාජකාරිය වූයේ ශ්‍රී ලංකා සේවක සහරාවේ සිංහල ලිපි සඳහා සුචි සංලේඛ සකස් කිරීමයි. එයද ඉතා නීරස විය. පිටුපස අසුනක සිටි සරිත් නිදි කිරා වැටෙන අයුරුත් කොම්බන් ඔහුට බැන වදින අයුරුත් මගේ නෙත් කොනට හසු විය. තම රාජකාරියට අයත් නැති වුවද අපට තේ සාදා උදේ හවස මේසයට ගෙනැවිත් තැබුවේ කොම්බන්ය. දවස ගෙවුනේ ඉබි ගමනිනි. හවස රාජකාරි අවසන්ව ගෙදර යාමට බසයකට ගොඩවීමි. එකවර මහා සූ හඬක් නැගී ආවේ මා හිඳගත් අසුනට පිටුපස අසුනෙනි. කාර්යාල අඳුමින් සැරසුණු කොලු රැනක් පිටුපස දිගු අසුනේ හිඳ කසු කුසු ගැහ.
"කවුද බං මේ???.. මීට කලින් මීටර් වෙලා නැති සීදේවි..."
"ඔය මචං අලුත් පත්වීමක්නෙ...පුස්තකාලෙ ඉන්නෙ..."
"මොනවා උඹ කොහොමද දන්නෙ...?"
"දවල් මං පත්තර බලන්න පුස්තකාලෙට ගියානෙ....එතකොට දැක්කෙ...කොහෙද ඉතිං උඹලා වැස්සකටවත් ඕකට ගොඩ වෙලා තියෙන එකක්යැ..."
"අපෝ ඕකෙ අපිට කියවන්න පුළුවන් පොත් නෑ...අනික අර ඉස්සරහම මහ සෝනා වගේ ඉන්න පියන් කාරයාගෙ ගෙම්බර් බලන්න පුළුවන් කාටද බං... ඌ හිතන් ඉන්නෙ ඌ තමා එතන බොස් කියලා..."
"කමක් නෑ හෙට ඉඳන් ලන්ච් ටයිම් එකේ පත්තරේ බලන්න වත් යමං මචංලා..."
"ඔව්... ඔව්... මේ වගේ නංගිලා ඉන්නකොට නොගිහින් කොහොමද..."
"යකූ...පෙනේද මුගෙ කතාව..."
"සූ..සූ..ඒ... මේ...සීදේවි නංගි ඔයාගෙ නම මොකක්ද???... ගම කොහෙද...???"
"ඔහොම ඔරවන්න එපා මයෙ මැණිකේ...හඳුන්පොත කීං...කීං...ගානවා..."
රත්තරං නෙත් දෙකින් සලා සිහිල් පවන්...ජීවිතේ ලසෝ තැවුල් නිවන්න රත්තරං...
මේ උසුළු විසුළු මැද හොඳ හැටි ඔරවාගෙන මා බසයෙන් බැස ගත්තේ කලබලයෙනි.
එවර මා මගද වරද්දාගෙන තිබුණි. කිරුළපන හන්දියෙන් බසිනු වෙනුවට මා බැස තිබුනේ පොල්හේන්ගොඩිනි.
කේන්තිය වැඩි කමට දැන් මට හැඩෙන්නට එන්නේය. ආපසු ගෙදර යන විට හොඳටම හවස් වී තිබුණු අතර අම්මා මග බලමින් උන්නාය.
කොහොමද දුව රස්සාව හොඳයිද...? ඇය විමසුවාය
වරදක් නෑ අම්මා...ඇල්මැරුණු ස්වභාවයෙන් මම ඊට පිළිතුරු බැන්දෙමි.
මුන කට සෝදා ආහාර ගෙන නින්දට ගිය මා උඩ විසි වී යළි ඇහැරුණේ පසු දා උදෑසන මවගේ කෑ ගැසීමටය.
"නැගිටින්න දුව...නංගි ඉස්කෝලෙ ගිහිල්ලත් දැන් ගොඩක් වෙලා... තාත්තත් උදේම වැඩට ගියා... දැම්මා ලැස්ති වෙලා ගියේ නැත්නම් ඔයාට වෙලාවට වැඩට යන්න බැරි වේවි... "

මා දෙවැනි දවසේ වැඩට ගියේ අම්මාගේ වදෙන් පොරෙන් බේරීමට නොහැකි තැනය.
ආරක්ෂක අංශයේ සිටි නිලධාරිණිය ''ගුඩ් මෝර්නිග් මිස්'' කියා සිනා පෑ අතර මමද පෙරළා ඇයට සුබ පැතුවෙමි.
පුස්තකාලයට පිවිසෙන විට සියලු දෙනා සුහද සිනා පෑ අතර මා සමග සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී තිබූ අනෙක් තැනැත්තියද එදින සේවයට වාර්තා කර තිබුණි. මා ඇයට රේණු අක්කා යැයි කියමි. කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියක වූ ඇය විවාහක තැනැත්තියක් විය. ටික දිනක් ගත විට බොහෝ මිතුරු වූ ඇයගේ උදෑසන බත් පතෙන් වැඩි කොටසකට වග කීවේද මාය. එකම දිනයක පත් වීම් ලද බැවින්දෝ අප සිටියේ ඉදිකට්ටයි නූලයි මෙනි. පූර්ව ගර්භණී සමයේ පසු වුවත් ඇය බොහෝ ක්‍රියාශීලී අයුරින් රාජකාරියේ නියුතු විය.
අපගේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් තුමිය දහවල් කාලයේ පුස්තකාලයට පැමිණීම දෛනික දින චරියාවක් වූයේ ඇය ප්‍රධාන පුස්තකාලයාධිපතිනියගේ හොඳම මිතුරිය වූ බැවිනි. මා ඇයට සීතා මැඩම් කියා කියමි. ඇය කෙරෙහි මා සිතේ වූයේ බිය මුසු ගෞරවයකි. කෙදිනකවත් මගේ නමින් ආමන්ත්‍රණය නොකල ඇය මට කීවේ පොඩි කෙල්ල කියාය. පෙර දින මට විහිළු කළ පිරිමි ළමුන් කැළ දිවා ආහාර වේලාවේ පත්තර හා සඟරා බැලීමට පැමිණ සිටිනු දක්නට ලැබුණි. පුස්තකාලයේ ප්‍රධාන කාර්යාල කාර්ය සහායක තැන වූ කොම්බන් ඉදිරියේ ඔවුන් හැසිරුණු විනීත සුනීත ස්වභාවය හාස්‍ය දනවන සුළු විය. පසු කාලීනව ඔවුන් මගේ ඉතා හොඳ මිතුරන් වූ අතර අද වන විට රජයේ විවිධ කාර්යාලවල විවිධ උසස් තනතුරු දරන බවද මෙහිදී මගේ සිහියට නැගේ.
තෙවන දිනයේ පාඨක සේවා අංශය සම්පූර්ණයෙන්ම මා වෙත භාර දෙන ලදී. පුස්තකාලයේ තිබූ කම්කරු නීති රීති පිළිබඳ පොත පත කෙරෙහි මගේ සිතේ උනන්දුවක් ඇති වූයේ කවදා සිටදැයි නිශ්චිතව පැවසීමට නොහැකි වුවත් මම ක්‍රමක්‍රමයෙන් මෙම පරිසරයට අනුගත වෙමින් සිටියෙමි. මට පැවරූ රාජකාරිය කුමක් උව එය නොපිරිහෙලා ඉටු කිරීමට මම සැලකිලිමත් වූයෙමි. අප කරනා වැඩ වල වැරදි අඩු පාඩු කොම්බන්ගේ උකුසු ඇසින් ගැලවී නොගිය අතර ඔහු ඒවා ප්‍රධාන පුස්තකාලයාධිපතිනියගේ කනේ තබන බවද මම ඉතා හොඳාකාරයෙන්ම දැන සිටියෙමි.
''එයා හැසිරෙන්නෙ මේකෙ බොස් එයා කියලා හිතාගෙන වගේනෙ''
ඇතමෙක් ඔහු නැති තැන කසු කුසු ගෑහ.
කුමක් හෝ රුස්සන්නේ නැති දෙයක් සිදු වුවහොත් හෙතෙම මා හට තරවටු කළේ උපැස් යුවල යටින් බලා
''යානිකා මිසී මේ මොනා කරනවා...? ''යනුවෙන් කැඩුණු සිංහලෙනි.
ඔහු නැති තැන අපි ඔහුව චීෆ් ලයිබ්රේරියන් යන අනවර්ථ නාමයෙන් හඳුන්වා උසුළු විසුළු කළෙමු.
නමුත් ඔහු වැනි පලපුරුදු අවංක සේවකයින් ආයතනයට කොතරම් වටීදැයි අපට වැටහී ගියේ ඔහු මාරු වී ගිය පසුවය.
පාඨක සේවා අංශයේ මා සිටි අසුන අසලින්ම අලුතින් පරිගණයක් ගෙනැවිත් සවි කළ ආකාරය මට හොඳ හැටි මතකය. අන්තර්ජාල පහසුකම්වලින් සමන්විත එම පරිගණකය මා භාවිතා කළේ පාඨකයින්ට අවශ්‍ය තොරතුරු සොයා දීමට හා පරිගණක දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීමට පමණි. මුහුණු පොත හා සමාජ මාධ්‍ය ජාලා ජනප්‍රිය නොවූ ඒ යුගයේ නව දැනුම සොයා අපි අන්තර්ජාලය පීරුවෙමු. තොරතුරු බෙදා හැරුණේ විද්‍යුත් තැපැල භාවිතයෙනි. ඊට අමතරව පාඨක දැනුම සඳහා විෂයට අදාල අනුක්‍රමණිකා සාර සංග්‍රහ සහ අත් පොත් ප්‍රකාශයට පත් කරන ලද්දේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනී ශ්‍රීමතී සූරිආරච්චි මහත්මියගේ අධීක්ෂණය යටතේය. කම්කරු නීතිවලට වැදගත්වන මිල අධික විදෙස් සඟරා කිහිපයක්ම අඛණ්ඩව මිලදීගත් අතර ඒවා පාඨකයින් අතර ප්‍රචලිත කරනු වස් අප විසින් පටුන පිටු සේවාවක් පවත්වාගෙන යන ලදී. නවක පත් වීම ලද අපගේ ආගමනයත් සමග මහජන සේවාවන් වෙනදාට වඩාත් පුළුල් විය. දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල ශාඛා පුස්තකාල 39ක් පිහිටුවීමත් කම්කරු කෞතුකාගාරය පිහිටුවීමේ පිඹුරුපත් සැකසීමත් මේ අතර සිදු විය. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි සලද පුස්තකාලය යටතේ පැවතුනි. පුස්තකාලයට පොත් මිලදී ගැනීම පුස්තකාල කමිටුව හරහා සිදු වූ ප්‍රධාන කටයුත්තයි. පුස්තකාල කමිටුවේ සභාපති කම්කරු කොමසාරිස් ජනරාල් වරයා වූ අතර කමිටුවේ ලේකම්

පුස්තකාලයාධිපතිනියයි. එවකට කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කළේ මහින්ද මඩිහහේවා මහතාය. ආයතනයේ පැවති සියලු කාර්ය සාධන රැස්වීම් සඳහා පුස්තකාලයාධිපතිතුමිය සමග මමත් රේණු අක්කාත් සහභාගී වීමු.

පොදු මහජනතාව සමග නිරන්තරයෙන් ගනුදෙනු කරන කම්කරු දෙපාර්තමේන්තුවට වෙබ් අඩවියක් ඉතා ඉක්මනින් සැකසිය යුතු බවට කම්කරු කොමසාරිස් ජනරාල්තුමා යෝජනාවක් ගෙන ආවේ එවන් වූ රැස්වීමක් අතරතුරය.

පූරණී ඉන්ස්පයිරේෂන් එකෙන් හෙට එනවා අපේ වෙබ් සයිට් එක ඩිවෙලොප් කරන හැටි ගැන මීටින් එහෙකට

කවුද මේකට ඉන්වෝල් වෙලා වැඩ කරන්නෙ...??? කම්කරු කොමසාරිස් ජනරාල්තුමා විමසා සිටියේ උපැස් යුවල යටින් තීක්ෂණ බැල්මක් අප වෙත යොමු කරමිනි.

"යානිකාට පුළුවන් නේද පුස්තකාලෙ වැඩටික කරන ගමන් මේ වැඩේටත් පයෝරිටි දෙන්න..? "

අප සියලු දෙනා මුනිවත රකින විට හෙතම මගෙන් එක එල්ලේම විමසා සිටියේය.

"හත් දෙයියනේ කවද කාපු ටකරන්ද....??

ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් නැති වුවද එතුමාට බැහැයි කියන්නට බැරි කමට මම ඇටිකෙසෙල් කෑ උගුඩුවෙකු සේ "පුළුවන් සර්... " යනුවෙන් මිමිණුවෙමි. එතැන් පටන් මට පැවරුණු රාජකාරි පරාසය පුළුල් වන්නට විය. එවකට උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරමින් සිටි මා වෙබ් අඩවි සැකසීම පිළිබඳ දන්නා ඉලව්වක් නොවීය. එහෙත් පරාද විය නොහැකි නිසා එතැන් පටන් ඒ පිළිබඳ වැඩිදුර ඉගෙනීමට සිතා ගතිමි. කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ පාලන අධිකාරිය විසින් මා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය පාඨමාලාවට අමතරව IDM ආයතනයේ වෙබ් අඩවි සංවර්ධන පාඨමාලාවකටද යොමු කරන ලදී. එතැන් පටන් යකා බැඳ ගත්තා සේ වැඩ කිරීමට මට සිදු විය. සතියේ දිනවල රාජකාරි කටයුතු සඳහාත් සති අන්තය පාඨමාලා සඳහාත් මගේ කාලය වැය විය.

"මේ ළමයව අල්ල ගන්න තියෙන අමාරුවක් රස්සාවට ගියාට පස්සේ...

දැන් හරි ගිහිල්ලනෙ මෙයාට... අපිව දැන් ඕන නෑ... අලුත් යාලුවො ඉන්නවනේ...

කොහොමද ඔෆිස් ගිය මුල් දවස්වල නහයෙන් අඬපු හැටි..

ඒකටත් එක්ක දැන් ඔෆිස් එක බදාගත්තු ගමන්මයි මෙයා.... "

ඔවැනි ආඩපාලි කියමින් නිවසට ආ ගිය නෑදෑ හිත මිතුරෝ නොයෙක් විට මැසිවිලි නැගූහ.

ICTA ආයතනය මගින් අපට Joomla හරහා වෙබ් අඩවි සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසියක් SLIDA ආයතනයේදී පවත්වන ලද්දේ ඔය අතර තුරය. එයට සහභාගී වී සෑදූ වෙබ් අඩවියට දෙවන ස්ථානය හිමි වූ ආකාරය අදටත් හීනයක් සේ මගේ සිතේ රැඳී තිබේ. බැහැයි කියා දෙයක් නොමැති බැව් මා එදින තේරුම් ගතිමි. මනුදම් ගුණයෙන් සපිරුණු ඉහල නිලධාරී පිරිසකගේ ගුරු හරුකම් ලබමින් රැකියාවේ නිරත වීමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි. සාම්ප්‍රදායික පුස්තකාලයාධිපති වෘත්තියෙන් බැහැරව නිර්මාණශීලී පුස්තකාලයාධිපති වෘත්තිකයෙකු ලෙස නැගී සිටීමට පන්නරය දුන් මා පළමු පත්වීම ලද කම්කරු දෙපාර්තමේන්තුවට හිස නමා ආචාර කරමි.

# කවි සිතුවිලි

**අමතක මතක**

විගණන පියස තුන්වැනි තට්ටුවේ සිට
දියත උයනේ සිරි අසිරිය ගෙන නෙතට
පෙරකල හිඳි අසුනෙ ඇන්දට තට්ටු කොට
මතකද මාව ඇසුවෙමි ලංව හෙමිහිට ?

පැරණි මතක සටහන් අළුත් කෙරුමට
තැබූ අත්සනක් ඇත්දැයි ගෙන විපරමට
එබී බලමි ලිපි ගොනු අල්මාරියට
එහි නැත පැරණි කිසිවක් නැවත දැකුමට

ඉඩ ලද විගස කාලය දිවා බොජුනට
රැස් වී එකට බත් පත බෙදා ගැනුමට
සතුටින් ගෙවූ අඩ පැය කෑම මේසෙට
මතක නැතිලු පෙර හිටි හැටි අප එකට

ඇස හුරුපුරුදු අය ඇද්දැයි විමසුමට
සැරිසැරුවෙමි නොමැත ඒ අය දකින්න
පරණ පොරකි මා මේ පියසේ සැමට
කොඳුරා කියයි සිත ආපසු හැරෙන්නට

ගඟ දිය විලස කාලය ගලා යන විට
බැස යායුතුය ඉඩදී සොබා දහමට
යටගිය සොඳුරු සටහන් මතුකර සිතට
සැනහෙමි ගෙවූ කාලය නැවත සිහිකොට

**ජී.ඒ.එම්. අයි. ගුණරත්න**

**මගේ වෙසක් පත**

වෙසක් පතක් ගෙන ඔබහට එවන්නට
ගියෙමි කඩපොලට ඒගැන බලන්නට
අරුමෙකි වෙසක්පත් නැත මිලදී ගන්ට
සිහිවිය එකල සුබපැතු'යුරු මා ඔබට

ලොකුම සුබපැතුම පන්තියෙ ටීචර්ට
පොඩි පොඩි පැතුම් පත් අන් හැම මිතුරන්ට
අතේ තැපැලෙන් නොවැරදි ලැබෙන්නට
යවා බලමි කවුරුද සුබ පැතුවෙ මට

කොතරම් දියුණු වුවත් ලෝකයම අද
එදවස සුන්දරයි සරු හිත් ගොඩක් මැද
සිහිකර බුදුවදන් අම ගුණ පිරුණු හද
සුබ වෙසඟක් පතම් දී මම සාදු නද

**ජී.ඒ. එම්.අයි. ගුණරත්න**

**කවි පෙති දෙපෙති**

මඳ අඳුරු හවසක
ඉතා පිළිවෙල නිවෙසක
කෝපි උගුරක් තොලගා
ලියන කවි මට නැත

හරිත පෑ උතුරන
සිහිල් වන වදුලු අස
මඳ පවන වැද නිවුණු
ලපටි මල් අතගා සිප
මා ලියූ කවි නැත
කලාතුරකින් මිස

සාරි කලිසම් තෙරපෙන
අඩි උස කකුල්
පෑගී මිරිකෙන
කායීාල දුම් රියක
දහදිය මුසු විලවුන් පහසක්

අමතර පංති නිම කර
කලබල සැඳෑවක කෙළවර
එකිනෙකා ඉඟි මරා කොඳුරන
මිහිරි බාලිකා රහසක්

පොකුරු පහනක දිස්නය
විදුලි පංකා බමන රස්නය
බීර වීදුරු අතර කියවමි
නොකියවුණු තව හැඟුම් දහසක්

එදින් ඒ දවසක
හදවත පුපුරු ලයි දෙදරයි
පුපුරුලන තැනකින්
කවි පෙති දෙපෙති ලියලයි

**මේබලා උදාරි ලියනගේ**
**විගණන නිලධාරී**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

**තාත්තෙක් දැක ඇත**

වෙහෙසබර දිනෙක කෙලවර
වැඩුණු කොල්ලෙකු ලුණු ගෙනයන
ගුස්ති අංගම් පොර කියාදී
සිය කැමැත්තෙන් ගුටිකන
තාත්තෙක් දැක ඇත
නොඇහැරෙන්නට ,
මැසි මදුරු උවදුරු විමසන
ළපටි කොපුලක
හාදු කෙළ කෝටියක් තවරන.....

ෆයර් ට්‍රක්,දුම් කෝච්චි එන්ජිම්
බඩවත පලා පැටළුම් හරින
කුරුඹැට්ටි මැශින් රොබෝ සොල්දාදුවන්
කොයි කාගේත් ලෙඩ  හඳුනන
තාත්තෙක් දැක ඇත
සුපර් හීරෝට අදින,
යූ ටියුබ් පීරා නොදන්නා විද්‍යාව විමසන

ඉතා ඉවසුම් සහගත
චිත්‍රයක වර්ණ සංකලනය පෙන්වන
බැරි තැන අල්ලා දමා
මූ අම්මා වගේමයි මුමුණන
තාත්තෙක් දැක ඇත
පසුම්බිය වියැළුණු දිනෙක
පුතු නමින් උල්පත් මවන

මහ වැසි කුණාටු මැදද
යලි යලිත් මල් පුබුදුවමි
පුතු දිහා බලන ඇස් වල
මටැති ප්‍රේමය හඳුනමි......

**මේබලා උදාරි ලියනගේ**
**විගණන නිලධාරී**

**පෙත්සම්**

රටේ දේපල සොරා කයි නම්
නීතියට ගරු නොකර ඇත්නම්
කියන්නට වෙන කෙනෙක් නැත්නම්
එවනු මැන ඔබ අපට පෙත්සම්

දූෂණය වංචා ද ඇත්නම්
අයාලේ පාලනය යා නම්
නොවී පසුබට වෙමින් කඩිනම්
එවනු මැන ඔබ අපට පෙත්සම්

සුදුසු අය හට තැනක් නැත්නම්
නුසුදුසුන් ඉහළටම යා නම්
බලා ඉන්නට තවත් බැරිනම්
එවනු මැන ඔබ අපට පෙත්සම්

ලැබෙන වැටුපේ විෂමතා නම්
විසඳගන්නට කෙනෙක් නැත්නම්
තැවී තැවී හිඳ පලක් නැත්නම්
එවනු විස්තර ලෙසින් පෙත්සම්

ගෙදර දොර පවරා ගනී නම්
වන්දියක් හෙම නොලැබුණේ නම්
අසරණව ඔබ නින්ද නැත්නම්
එවනු විස්තර ලෙසින් පෙත්සම්

හිතවතුන් බඳවා ගනී නම්
නාස්තිය දූෂණය වැඩිනම්
හෙලිකෙරුම වේ ඔබේ යුතුකම
පියවරක් ගත හැකිය කඩිනම්

දරුවාට පාසලක් නැත්නම්
අල්ලසක් ඉල්ලා සිටී නම්
නොවනු මැන ඔබ ඊට බයනම්
එවනු විස්තර ලෙසින් පෙත්සම්

නවා නීතිය දෙවා දඬුවම්
මාරුකර ඈතට යවා නම්
සොයා ගන්නට ඊට විසඳුම්
එවිය හැක ඔබ අපට පෙත්සම්

ඊරිසියාවෙන් පෙලෙන්නේ නම්
කෙනෙකු හට මඩ ගසන්නට නම්
බොරු කියා අප රවටන්න නම්
එවන්නට නම් එපා පෙත්සම්

දක්ෂයා  බිම වට්ටන්න නම්
නඟින ඉණිමග පෙරලන්න නම්
කරන වැඩ  ටික අවුල්වේ නම්
එවන්නට නම් එපා පෙත්සම්

ආයතන බිඳ දමන්නට නම්
ඔප්පු කෙරුමට කරුණු නැත්නම්
වෙන්නෙ නෑ අප බළල් අත් නම්
හැරෙන හැටි ඔබ දනිමු අපි නම්

දුරු කරනන්නට හිසේ ඉදිමුම්

කදිම ඔසුවකි ලියන පෙත්සම්

රටක් හරියට හදන්නට නම්

අවංකව කල යුතුය යුතුකම්

**එස්.පී ආර්. මල්කාන්ති**
**වාර්තා අංශය (PRC)**

**<u>බලාපොරොත්තුව</u>**

සඳරැස් වැටිලා දොල ලඟ පාරට
මා එනවිට අද ඔබව සොයා
නිල්වන් තුරුලිය අතරින් දිස්වෙයි
ළඳේ ඔබේ මුව මඬලෙ සිනා

**<u>හිතන තරම් සුව නැහැ</u>**

මලේ එපා ඇස් ඉඟිකර සිනාසෙන්න
එපා මලේ ඔමරි බැලුම් හෙලාලන්න
ඔය පෙම්ලොව
දුක් ගිණිගොඩ මිස
ඔබ පතනා සුව නෑ

කුසාවතිය හැරදා ගොස්
පබාවතිය ජයලැමුත්
කුස කුමරුන් විඳ ගැහැටට
වන්දි ගෙව්වේද
ප්‍රේමය කිසිදා
කිරුළ අහිමි වූ හිසකට සෙවනක් වූයෙද
ප්‍රේමය කිසිදා

**<u>දැව හොරා</u>**

වනයට රිංගූ දැව හොරෙකු
කෙලින් ඇති ගස් කප කපා බිම හෙලයි
වක් වූ ඇද ගස් ඔහුට වැඩක් නැත
හොයන්නේම කෙලින් තිබෙන ගස්ය
හරියට කෙලින් ඍජුව කතාකරන නුඹ වගේ

**කේ .යූ .ඩී . සරත් කුමාර**
**නියෝජ්‍ය විගණකාධිපති**

**කාටනම් පෙනේවිද....**

උල් පතින් කඳු මුදුන
සිපගත්ත දා පටන්
සයුර වෙත රැගෙන ගොස්
පුද කරන තෙක්ම දිය
රැගෙන ආ ගංගාව
නගන ඉකිබිඳුම හෝ
වෙන්වීම දරාගෙන
යලිත් ගලනා වෙහෙස
කාට නම් පෙනේවිද.......

නියන් සිදී කාලයක
පොලෝ තල සූරගෙන
අහස් කුස හිස් මතට
උරා ගත් ජල බිංදු
ඝනව සීතල තුරුළු
කරන් සිටිනා දිනෙක
බර වැඩිව වැස්ස ලෙස
යලි පොළොව තෙමූවද
අහස් කුස කෙළෙස නම්
ඒ වියෝ දුක් විදිද
කාට නම් පෙනේවිද.......

මල් කැකුල පොහොට්ටුව
විකසිතව සුවඳ මැද
ගසට සතුටක් දෙමින්
දිලුනාට කාලයක්
ඒ මලම මුකුලිතව
පරව බිම වැටුනාම
ගසට දුක හිතෙන යුරු
කාට නම් පෙනේවිද .......

හිමි අහිමි වීම් මැද
ළදරු විය තුරුණු විය
ගෙවා මැදි වියද ගොස්
මරණයේ එළිපත්ත
වෙතට ලංවී වූවද
දරාගෙන මෙතෙක් කල්
ඔබ අහිමි දුක දරන
හදවතක දුක් කඳුළු
කාට නම් පෙනේවිද.......

**ඩයනා නිරෝෂනි ජයසුන්දර**

**මා පොඩි පුතු අම්මේ....!**

වෙනතක ගිය පිය සෙනෙහස සිහි කරවා
පපුතුර සුසුමන් සිරකර තබලා
මා ජීවන මඟ කිරුළ පළන්දන
දිනයක් නුඹ මඟ බලමින් සිටියා

අම්මේ නුඹ විදි තනිකම දුටුවා
මා සනසා නුඹ කඳුලැලි සැලුවා
නුඹේ තුරුණු විය සිත යට සඟවා
මගේ ලොවේ මන්දිර තැනුවා

අම්මේ මා හෙට සරසවි යනවා
වෙදැදුරු වී මතු ඉන් පිටවෙනවා
කෑ ගසමින් මා නුඹ ඇමතුවා
නුඹත් ගිහිල්ලා වෙන කැඳලි තනාලා

නුඹේ පොඩි පුතුගේ සෙනෙහස මදිවද
මා තනිවන බව නුඹට නොදැනුනද
අළුත් කැදැල්ලේ සතුට රැඳේවිද
මා ගැන මතකය ගිලිහි යාවීද

සරසවියේ යායට මල් පිපිලා
මිතුරු මිතුරියන් මා වට කරලා
වෙදැදුරු නලාව පපුවේ තද කරන්
නුඹ නැති ශෝකය දැන ගන්නද අම්මේ..

නුඹේ සෙනෙහින් හිස පිරිමැදලා
මගේ පොඩි පුතු මගේ ලෝකය කියලා
ආයේ කියන්නට මා සිත සනසා
නුඹ එන්නේ කවදද අම්මේ..!

**මනෝරි ද සොයිසා**
(LSW)

**හමුවීම, වෙන්වීම**

සසර ගමනෙහි අතර මඟකදී
ඉපදිලා මේ මනු ලොවේ
කලින් කළ හමු වූ සියල්ලන්
සමඟ කාලය ගත වුනේ

සුරතලින් බැදිලා ළමා විය
එළිය කළ මව්පියවරුන්
සතුට සොම්නස සෙනෙහෙ මන්දිර
ගොඩනැගූ මිතුරන් සොහොයුරන්

පෝරු මස්තක රනින් සැරසී
කුලගෙයට ආ පති පතින්
පරපුරේ නම බබළවන්නට
අපට හමුවූ දූ පුතුන්

මිතුරු දම් මැද සතුරු වෙස්ගත්
ගමන් මඟ ඇහිරූ දනන්
දුකට කඳුළට ළඟ හිඳන් සිටි
මේ සියළු දෙන පෙම් බැඳන්

වෙළි සෙනෙහින් සැවොම අදරින්
සමුගන්න අකමැති මතකයෙන්
හැරදමා යන දිනක් වේය මතු
කිසිවෙකුට කිව නොහැකි අයුරින්
ආයේ හමුවෙයි දිනයකදී මතු
සසර ගමනේ නන් වෙසින්
කෙලෙසකත් නැද අඳුන ගත්තේ
කෙලෙස් පිරි පින් මදිකමින්

ආයේ හමුනොවන බව කිසිවෙකුත්
අපේ පෙම් බැඳී මතකයෙන්
නොකර හැරදවූ යුතුකම් දිනක සිහිකරන්
අදම කළ යුතුයි මතුදා නොවී පසුතැවුම්

**මනෝරි ද සොයිසා**
**(LSW)**

**වැහිදාට ගෙදර**

හෙල්මලු යාය උඩ කඳු බෑවුමක් මැද
කටුමැටි ගෙපැළ නොම්යෙන දියපාර ළඟ
මනරම් සිතුවමකි ඇතට පෙනන විට
එහි කඳුළක්ය සතුටක් පෙනුනට දුරට

පොල්අතු වහල සිපගෙන වැහි කඳුරු වැදී
මුතුකැට අකුරුවැල් යායම එකට වැටී
පොත් පිටු අතර නිල් පාටින් රූප සැදී
ඉකිබිඳ හඩයි පිටුවක මුල්ලකට වැටී

වහලයේ උල්පතට යළි අද උපත ලැබී
ගේ මැද දිය ඇල්ලෙ නව සුබ නිමිති පෙනී
එය පිළිගන්න කොරහක් උඩ අතට නිදී
තව මුට්ටියක් පොත් මේසය උඩට වඩී

තුරුල්වන තුරුම මේ වැහි කඳුළු කැට
තුරුල්ලට වීම් අම්මා ළඟට පැන
සියල් සපිරි නොවුණත් මේ හෙවණ යට
සියල්ලටම පෙර මට ආදරය ඇත

**ගයාන් දොලුවීර**
**කළමනාකරණ සේවා නිලධාරි**

**සසර.....**

මිනිසත් වෙසක් ලබලා අපි මේ භවයේ .......
කෝ කෙරුවාද නිවනට පිං හරි හරියේ .......
රැස්කර ගත්ත අකුසල් කඳ කිටි කිටියේ .......
අරගෙන යන්න වෙනවාමයි මතු සසරේ.......

බුදු හිමි දෙසූ දහමින් සිත සනසාන....
දම් සිතුවිලි වලින් හදවත් පුරවාන....
ජීවිත මගේ මේ යන මහ අහුරාන.....
පෙර කළ පවු ඒවී පසුපස හැරුනාම......

සුවදැති  මලින් බුදු සමිදුන් පුද දීලා.....
සිත සතපවා දහමින් ඔපවත් වීලා.......
නිවන් මඟට හොඳහැටි පින් රැස් කරලා....
ගෙවලමු මේ භවය  කුසලට මඟ පාදා....

**කේ. කේ. එල්. රසාංගිකා**
**කළමනාකරණ සේවා නිලධාරි**

**පස්සෙ මගේ  කසාදෙන්...**

දහකාර කෙළි කවට
සිනහ සයුරක් මැදින්
ගෙවුව මං ජීවිතය
හරිම හරි සංතොසින්......

මුදු මොලොක් පිහාටුව
මද පවනෙ දහ කරන්
වගෙයි මගෙ ජීවිතය
දැනුනෙ මට ඒ ලෙසින්........

ආදරය සෙනෙහසම
පුරවාපු ජීවිතෙන්
විවාහයකට කොහොම
යන්නෙ මම තුටු සිතින් ..........

දැන දැනම බැදෙන බව
සසර මහටම තවත්
විවාහය අත ළඟයි
පවු නිසා මවුපියන්.........

ජීවිතය තුළ හරිම
විදපු මං ආදරෙන්
හැමදේම නැති වෙයිද
පස්සෙ මගෙ කසාදෙන්.......

**කේ. කේ. එල්. රසාංගිකා**
**කළමනාකරණ සේවා නිලධාරි**

**අභිමි ප්‍රේමය**

සිඹින තරමට මලක් සිත ළඟ සුවඳ මුහු වේ නම්...
හඬන බඹරිඳු දුරක ඇයි තව සුවඳ මා වේ නම්...
අඳුරු රැයකදි ඉකි ලද්දි සිත සුසම් පිට වේනම්...
කෙලෙස හිමියනි ඉවසම්ද එය නුබට නොඇසේනම්..........

ක්ෂිතිජයේ ලං වෙලා මොහොතක ඉනූ දුක් කඳුලින්...
ප්‍රේමයක හැඩ මට අභිමි විය වසාගත් දුකකින්...
නුබ කොහොම ප්‍රිය සබඳ ඉන්නේ මේ තරම් දුරකින්...
අත වනන විට මධුසමය මට පැමිණිලා රහසින්...............

නුබම ඇවිදින් ලං වෙලා සිර කරපු සිර කුටියෙන්...
ඉගිල යන්නට දින පැමිණ ඇත ඉගිල යමි කෙලෙසින්...
නුබව මැදි කර තැනූ තනුවක මියුරු සර බිඳුනෙන්...
කෙලෙස නම් යළි වයන්නද වෙන කෙනෙකු හා සතුටින්............

**අසංක උදය කුමාර**
**TAP අංශය**

**නුඹ නැති ලොවක් නැත**

පැනයක් මොටද හදවත දෙන සුසුම් වල
යුගයක් බැඳුනි නුඹ හා මම සසර සල
වැහි පිට වැහි වැටී හෙන හඬ සවන තුල
නුඹ මා ලං කලා සිතුවිලි කිනිති වල..................

බැලුවෙමි එබී දෙනෙතට ඔබෙ විටින් විට
නැත දොම්නසක් තිබුනේ එහි කිසිම විට
තුරුළුව සිප ගත්ත නුබෙ තොල්පෙති වලට
රිදුනිද කියා සිතුනා මොහොතකට මට................

සෙනෙහස ගලා නෙතු සඟලේ පවුරු බැම
බිඳදා සිනාසුනි ලංකර ලයට ලැම
උපමා කුමට දෙවුදුවකට අසම සම
දුටුවෙමි ඔබේ හදවත ලැම යටින් මම.....................

සසරක් උසට බැඳි සෙනෙහස වෙන වයන
යුගයක් මොටද නුබ මාගෙන් දුරස් වුන
වදනක් කියන්නම් හදවත මැදින් එන
නුබ නැති ලොවක් නැත සොඳුරියෙ කිසිම දින......................

**අසංක උදය කුමාර**
**TAP අංශය**

**ඉවසපන් මගෙ මැණික දින ටිකයි ගෙවෙන්න..........**

කඳුලු කැට බර වෙලා දෙකොපුල් තෙමෙන්න...
පිස දමා සිප ගත්තෙ සෙනෙහෙන් පිරෙන්න...
නුබ දෙසම නෙත් යොමා ඇසි පිය සලන්න...
මං ආස නුබේ ඔය සිනහව විඳින්න.........................

වළාවක් තරමටම අහස් කුස රැඳෙන්න...
සෙනෙහෙ ඇත නුබේ ළඟ ඒ වගෙ පිරෙන්න...
ඇනෙයි කටු යනෙන මග දෙපතුල් රිදෙන්න...
නුබ ළඟදි දුකත් මට සතුටකි විඳින්න..............

වෙන් කරන් මැවුණීන නුබවම දකින්න...
මේ තරම් ලං වෙද්දි මගෙ හිත පිරෙන්න...
කොයි තරම් සැප වුවද වට පිට පිරෙන්න...
මං ආස නුබේ ඔය තුරුලෙහි නිදන්න............

ඈත ක්ෂිතිජය එපා මට නුබ රඳන්න...
මැත විශ්වය නුබයි දන්නවද කියන්න...
හිමින් සවනට ළංව සොඳුරියෙ අහන්න...
මම නුබට ආදරෙයි මේ හිත පිරෙන්න................

සුහම සුභ දවසකට වීණා වයන්න...
ඉනු කඳුලු පිස දමා සිනහව රඳන්න...
මඟුල් පෝරුව ළඟයි නුබව එහි තියන්න...
ඉවසපන් මගෙ මැණික දින ටිකයි ගෙවෙන්න..............

**අසංක උදය කුමාර**
**TAP අංශය**

**බුද්ධ පූජා තැටිය**

පොඩි පැටියගේ හිත
හොඳටෝම රිදිලා..
හීන මල විසිරී
පෙති බිමට වැටිලා ..
හිමිදිරියෙ නැගිටගෙන
සාදුට උයන් ගියපු ..
බුද්ධ පූජා තැටිය
වෙන කෙනෙක් පුදලා ..
මුතු කුඩේ යට යන්න
සුදු සරම ඇඳලා ..
මුළු රැයම මැවූ සිහින
බොඳව හිත බිඳිලා..
මගේ පුතු උස් වේවි
කඩු කිණිසි මැද්දෙන් ..
එපා පුත සැලෙන්නට
දිරි හිතට අරගන්..
රිදුන හිත අද්දරට
වැටි කඳුළු පිසගන් ..
සෝක සංකා නොවේ
තිසරණේ බලයෙන් ..
තවත් දවසක් ඒවි
මුතු කුඩේ ඉහලන්..
අපි බුද්ධ පූජාව
එදාටත් ගෙන යන් ..

**බී.එල්. කළුආරච්චි,**
**කලමනාකරණ සේවා නිලධාරී (BPT)**

**උතුම් වූ මිනිස්බව**

පෙර කලා වූ පිනෙන් ලැබී ඇති මිනිස්බව
ගෙවා නිම කල යුතුය එකතුකර නොගෙන පව
පමා වූවොතින් අප ලගාකර ගැනුම පින
හිමි නොවේ නැවත මේ උතුම් වූ මිනිස්කම

කිසිවෙකුට අවැඩ කර ලබන ජය කුමකටද?
තවකෙකුට උගුල් අටවාලා තුටි කුමකටද?
අනුන් කොටවා ලබන කෙටි ජයක් කුමකටද?
නොමිනිසුන් ලෙසින් ජීවත් වන්නෙ කුමකටද?

තමන්ගේ වාසියට අනුන් කොටවනු එපා
තාවකාලික දිවියෙ අනුන් රිදවනු එපා
බොරුව වංචාව කර ලොව නසාලනු , එපා
උතුම් මිනිසත් බවේ අගය කෙලසනු එපා

තවකෙකුගෙ දුකේදී පිහිට වී සනසවා
ඇත්ත ඇති සැටියෙන් බොරු නොකර පවසලා
පිදිය යුතු දනන් හට නිසි ලෙසින් පුදාලා
රැක ගනිමු මිනිස්කම උතුම් ලෙස සිතාලා

**නිරෝෂා දමයන්ති ජයලත්**
**වාර්තා සැකසුම්කරු**

**රිදුනු හිත පාරවන පෙම් කවිය නුඹම විය…….**

කලු අහස සරසන්න වලාකුළු මදි වුනා…
ගහකොලද සුසුම්ලන හඩ හෙමින් ලං වුනා…
හිත් මානෙ ලග හිටිය අය අපෙන් වෙන් වුනා…
තනිකමට හුරු වෙන්න හිතට කල් මදි වුනා…

පෙනී පෙනී දුර යන්න දුර ගිහින් හිනැහෙන්න…
ඒ සිනහා දෙස බලා වුනා මට සැනසෙන්න…
පිපුණු මල් වැස්සකට තෙමී ගිලන් විය ගතම…
මිරිගුවට පෙම් බැදන් සිත ගිලන් වූ ලෙසම…

කවිය දැන් විය නපුරු රිදුනු හිත පාරවන…
ඒ වුනත් කවිපදයි සිතේ ඇති දේ කියන…
පැරුණත් පබැදුමෙන් රිදුනු හිත ඉරිතැලුන…
කියන්නේ හිත ඔබ ගැනයි කවිය මෙන් ලග හිදින…

තනිකමට හුරු හිතක කවිපදත් විරහව ගැනයී…
වෙනස් කල හැකි නොවේ එය පරම සත්‍යයයි…
ආදරේ හිඩසකහුදකලාවට ටික දුරයි…
පෙම් කවක් ලියවෙයි නුදුරු දින ඒ හිතත් දැන් පෙම්බරයී…

**ලක්මාලි දූලංකා**

**කළමනාකරණ සේවා නිලධාරී**

**සමහරවිට....**

ජීවිතේ කියන්නෙ හරි පුදුම දෙයක්....
අපි කැමති අය අපෙන් ඈත් වෙනවා...
අපි ආදරේ කරන අය නිසා අපිම විඳවනවා...
ඒ වෙනස්කම් දරාගන්න බැරුව දුක් වෙනවා...
උපතින් මුකුත් නොගෙනාපු අපි...
ගෙවෙන හැම මොහොතකම බැඳීමක් හොයනවා...
හුරු වෙන්න පුලුවන් නම් තනිකමට...
ආදරය කරන්න පුලුවන් නම් හුදකලාවට...
රැවටීම්, වෙන්වීම්, පසුතැවීම්
නොදැනේවි නොහැගේවි....
ජීවිතවය පහසු වෙයි නේද එදිනට...
“සමහරවිට...”

**ලක්මාලි දූලංකා**
**කළමනාකරණ සේවා නිලධාරී**

**ගමෙන් නගරයට පියමැන්නා**

සදාකාලික මතකයක් වී
නිබඳ මා සිත සනසනා
ගෙවූ ඒ සුමිහිරි අතීතය
සොඳුරු හැඟුමන් කැන්දනා

ඉඩක් ලද විට සෙල්ලම මතක් වී
ළමුන් පිටියට රොක් වෙනා
උදේ ඉඳන් රෑ යාමේ වෙනකන්
නෑ නිනව්වක් හැම දෙනා

කැලේ කොළේ තුරු වැල් අතරේ
මොර දං හිඹුටු සොයා ඇවිදින්
නා තුරු සෙවනේ ගිමන් නිවා
මතකයි කෑ හැටි රස කර සතුටින්

ඇලේ දොලේ දුව පැන නටමින්
දණ්ඩි පැටව් ඇල්ලූ හැටි දහයෙන්
හිටියා නම් අද උන් යහතින්
විඳි දුක ගැන ගතු කියයි සොවින්

වෙල් එළියේ හැමතැන වෑ කන්දේ
කොල්ලො කුරුට්ටෝ  රංචු පිටින්
කළ සෙල්ලම් තිබුණත් මතකේ
අද කොයි ඒ් සිටි පොඩි දරුවන්

ලෝකෙ පුරා හැම තැන මනසින්
සැරිසැරුවේ සුරඟන කතා තුළින්
අදටත් හිත ගිය ඒ ලෝකෙන්
එළියට එන්නට අකමැති මං

කාලය ගෙවිලා මං ලොකු වීලා
කිසි දින නැවතත් යළි නොඑනා
සුන්දර ඒ ලොව මතක් කරමි මම
ළං කර ගෙන මගෙ දරු දෙදෙනා

රස කර කියනා කතා අසා
සැනසෙයි නැලවෙයි පොඩි දරුවන්
අනේ අපට කෝ ඒ ලෝකය දැන්
අසයි ම 'පුතු ඇස් උඩ ඉන්දන්

මට හිමි වු එ් නුඹට අහිමි වූ
සුන්දර ලොව වෙත මතු කිසිදා
නැවතත් යන්නට බැරි බව සිහි වී
මගෙ හද කකියයි සොවින් සදා

පුතේ නුඹට ඒ ලොව මග හැරුණේ
කිමද කියා මා දැන උන්නා
දිවි මඟ එළිය කරන්නට නුඹගේ
ගමෙන් නගරයට පියමැන්නා

**අනූෂා සුදර්ශනී දසනායක**

**එස්-1 ශාඛාව**

**සුබ උපන්දිනයක්**

තෙලි තුඩට පණ පොවමි සිව් වසරකින් පසුව....
කවි සිතුම් පොදි ගණන් ඔබ කෙරෙහි ඇත ලංව......
සසර බැඳි සෙනෙහසද නොවැටහෙයි මට තවම ...
හද පුරා පිරී ගිය ආදරය ඔබ හටය....

ගෙවී ගිය රුදුරු කල් යල් මගේ කෝ කොහිද..
අමතකයි දුකක් නැත හිත හැදුව රුව ඔබය...
දෙඩූ බස් හදවතේ පතුලේම සිරවුවද...
අයිතිකාරිය ඇයයි අත ගන්න ලඟ ලඟම...

නොවැම්බර් හය දිනට විසි හතයි නේද දැන්..
දිවි ගමන සුවඳවත් කරයි සුබ නිමිති දැන්...
ලෙඩින් තොර දුකින් තොර සතුටු සම්පතින් දැන්...
තවත් දින කෝටියක් වසන්නට පතමි දැන්....

විඩාබර මගේ දිවි කතර සමුදුරක් කල..
ඔබේ ආදර පවසෙ මියෙන තුරු සැතපෙන්න...
පාරමී පුරමි මම මතු යසෝවත වෙන්න...
සිදුහතුන් වුව මැනවි පැතුම් මල් ඵල ගන්න....

**පුලාරා දෙව්මි මාන්නප්පෙරුම**
**සංවර්ධන නිලධාරී**

**අම්මා**

අඳුරු අහස එළිය කරන උදා ඉරයි අම්මා
සඳ නැති මුත් ආකාසේ තනි තරුවයි අම්මා
නිරුදක මහ වැලි කතරේ දිය දෝතයි අම්මා
ගොහොරු මඩේ සුවඳ හමන නෙළුම් මලයි අම්මා

කඳුළ සුසුම දුක අභියස සිනා පොදයි අම්මා
මහ සයුරේ මග පෙන්වන පහන් ටැඹයි අම්මා
තනි නොතනිය දුරු කරවන සෙවණැල්ලයි අම්මා
දහසක් දුක් හිසේ දරන මහ මේරුව අම්මා

පරදින හැම වාරයකම ජය කණුවයි අම්මා
රෝගී සිත් සුවපත් වන දිව ඔසුවයි අම්මා
කටු අකුළේ සුවඳ හමන මල් පොකුරයි අම්මා
සැඩ පහරේ දිය ගැඹරේ රුවල් ඔරුව අම්මා

වියළී ගිය ඉඩෝරයට පොද වැස්සයි අම්මා
අඳුරු කුටිය එළිය කරන පහන් සිලයි අම්මා
අදමින් පිරි මිනිස් ලොවේ ගුණ සුවඳයි අම්මා
මෙතේ බුදුන් අභියසදී නිවන් දකින් අම්මා

**එච්.එම්.එස්.එන්.ටී. හේරත්**
**කළමනාකරණ සේවා නිලධාරි**
**වාර්තා අංශය**

**යථාර්ථය**

එනවිට කිසිවක් ගෙන එන්නේ නැත
සසරේ පුරුදුයි ගෙන එන්නේ
යන විට කිසිවක් ගෙන යන්නේ නැත
හොඳ සහ නරකයි  ගෙන යන්නේ

ආගම දහමට ගරු නොකරන විට
මිනිසත් බවමයි පිරිහෙන්නේ
සුදු රෙදි යාරය පමණක් හිමි වී
හතර රියන යට වැළලෙන්නේ

කිසිවක් කිසිවිට සදාතනික නැත
අටලෝ දහමයි කැරකෙන්නේ
තණ්හා ආශා පොදි බඳිනා විට
මිනිසත් බව නොපෙනී යන්නේ

දහම් රසය විඳි සොඳුරු සිතක් තුල
යහ ගුණ පමණයි දිදුලන්නේ
ගුණ දම් සුරකින සමාජයක් තුල
සුන්දර මිනිසුන් බිහිවන්නේ

**එච්. එම්. එස්. එන්. ටී. හේරත්**
**කළමනාකරණ සේවා නිලධාරි**
**වාර්තා අංශය**

**සංසාර ගමනක හමුවීමක්**

ජීවන මං පෙතෙහි
බාධක දුක් කම්කටොළු බිඳ
ජය ගන්න වෙර දරද්දී
සාගරය පරදන ඔබේ සෙනෙහස
සෙවනැල්ලක්ව මා රකිනා විට,
ඔබේ දුක මගේ දුක කරගෙන
මා ඔබ සනසන විට,
සතුට අප බෙදා ගෙන තුටින් ඉපිලෙන විට,
සංසාර ගමනේ එක්ව බැඳෙමින් එන
වරෙක ඔබ මව වී දියණිය විය මා ඔබේ
තවත් වරෙක,
මා ඔබේ මව වී  දියණිය විය ඔබ මගේ
පැමිණි ගමනක සංධිස්ථානයක් ලෙස
දැනෙනවා මට මේ භවය
මගේ ආදර අම්මේ......

**ඩී. ඒ. ප්‍රියංකා නිලන්ති**
**මුදල් සහකාර**

**ජීවිතයේ යථාර්ථය**

දසමසක් මව් කුස තුල සිට
ලොව දැක්කේ
එදවස සිට ජීවිතයට පා තැබුවේ
තේරුම් ගන්නට ජීවිතය ගැන
බොහෝ ඇත්තේ
එනමුදු නැතේ කිසිත් ගෙනියන්නට
පිට මිනිසට බර දීලයි
ජීවය අතහැර අපි යන්නේ............

සැරසී සුදු ඇඳුමකින්
අනුන් මසා දුන්
නිදාගෙන හතරැස් පෙට්ටියක
අනුන් සදා දුන්
එකතු වූ පිරිසකගේ කර මතින්
ගොසින් දමයි පාළු සොහොනකට
අනුන් කපා දුන්............

ගෙනියන්නට නැතේ කිසිත්
මෙලොව ඇත්තේ
තමා කල පින් පව් පමණක්
රැගෙන යතේ
එනිසා හැකි පමණට
දන් දෙන්නේ
කෙදිනක හෝ හැරයන බව
දැන ගන්නේ.................

**ආර්.පි. සකුන්තලා සෙව්වන්දි රණසිංහ**
**ගිණුම් අංශය**

**නිහඬ පෙම්වතා**

ප්‍රේම අහස් කුස අඳුරු කරගෙන
වැටුනු අනෝරා වැස්සකට
තෙමුනු අත්තටු වල කඳුලු වියලෙන තුරු
තෙරක් නොමැතිව ඔහේ පියඹන කිරිල්ලියකට
මග කියන , තනි රකින තරුවක් මිසක
පෙම් ගී කියන විහගෙක් නොවෙයි මම

තෙමුනු අත්තටු ඇතිව
ඉර මඩලේ උනුහුමට අයාලේ පියඹන
කිරිල්ලියන්ගෙන් එකියක නෙවෙයි ඈය
කැමති නෑ මන් එ අහිංසක අත්තටු වලට
අයාලේ ගිය බව කියනවාට අහස් කුස
ඈ හොයන්නේ උණුහුම නොව
පරන මතක ගසා ගෙන යන හිත මිතුරු හුලගක් ය

පියාඹන්නට නොහැක මට
මන් අයිති නිසොල්මන් හුදකලා රැයකට
තරුවක එලියකට පුලුවන් ද ඉතින්
එ කඳුලු අත්තටු වේලන්න

නොදෙමි අඳුරු වලාකුලු වලට
තෙමන්නට අසෙනි වැසි වලට ආයෙත් ඈ ව
මතු දිනෙක ලෙන්ගතු විහගෙකුගේ උනුහුමට
වියෙලෙනු ඇත එ අත්තටු වල කඳුලු තෙත
පියාඹන් ඇත ඔවුන් දුරකට

එවිට එ අහසින් බැස එමි
හන්තාන කඳු පාමුලට

ආයෙමත් තනිවෙමි .....

**R.M.D.P. මධුශානි**
**විගණන නිලධාරි**

**රන් පුතුණී.......**

සුරලොව සිට ආදා පටන් අපෙ උණුහුමට
සවියක් දැනුණලු අප්පච්චිගෙ හිතට
පෙරුමන් පුරා ආදා ඔබ අපෙ ලොවට
පෙර භවයක සුවඳ දැනුණලු අම්මගෙ හිතට

එදා පටන් පෙරමඟ සලකුණ ඔබය
සියලු පැතුම් එක්වන්නේ ඔබ නමින
සුවදායක සිහිනෙක වෙසෙනා අරුම
කියාපෑවෙ සුරතල් නෙත් අභියසය

කිරි සිනා මැදින් හැඩවෙන සෙනෙහෙ ලොව
පිරිපුන් බවක් දැනෙනවා රන් පුතුණී මට
මතුදා ජය ගන්න මගෙ පුතු මුළු ලොවම
තෙරුවන් සරණ ලැබෙනවා මගෙ පුතුන් හට

**එච්. පමෝදා මධුරංගි**

**ආයතන අංශය.**

**පිරිමිකම ගැන අසාපන්.......**

තමාව පමණක් විශ්වාස කර

ජීවන ගමන් මගෙහි

සහකාරිය ලෙස අතිනත ගත්

සීතාවගේ පතිවත පවා

සැකකල

රාමාගෙන් නොව.......

තම සතුරාගේ පතිනිය වුව

ඇයගේ පතිවත සුරැකි

ඇයව ආරක්ෂා කල

රාවණාගෙන්.........

අසාපන්...............

පිරිමිකම ගැන බිඳක්...........

**ඒ. එච්. එෆ්. අමීනා**
**සහකාර විගණන අධිකාරී**

**පොත් පිස්සුව**

කොළඹම පොත් සැනකෙළියක්
නොයා ඉන්න බැරි ගමනක්
අරගෙන කෙටි නිවාඩුවක්
ගියා ගන්න හොඳම පොතක්

එක පොතකට පොත් පනහක්
සල්ලි නොබලා එක මොහොතක්
මිලදී ගෙන තව වටයක්
කැරකුණි ගෙන උජාරුවක්

ගත් පොත් ගොඩ මහා බරක්
එල්ලාගෙන තව වරුවක්
පොත් කතුවරු දැක සතුටක්
ගත්තා නෙව සෙල්ෆි ගොඩක්

ගෙදරත් ඇත පොත් කන්දක්
දැන් ගත්තා තව කන්දක්
ගෙට ගොඩ වී රෑ ජාමක්
පිරෙව්වා පොත් රාක්කයක්

කෑමට නැත කිසි පිරියක්
ගත්තා තිබු ලොකුම පොතක්
දාගෙන ලොකු කණ්ණාඩියක්
නිදි වැරුවා පැය හතරක්

**ගිවෝන් යානිකා නන්දසේන**

**නොකියූ පෙම**

ශීත කාලෙ ගෙවී ගිහින්
කැටි වූ හිම දිය වී යනවා
සුළි කුණාටු නිමා වෙලා
වසත් කාලෙ පැමිණ තියෙනවා

අයිලයට ඉහළ දුර  අහසේ
අලුත් සඳක් නැගී දිලෙනවා
ඒ පුරහඳ මැද්දෙන් මට
අල්තීනයි නුඹව පෙනෙනවා

නොකියූ පෙම් පුරාවතක
සැමරුම් නෙත මැවී පෙනෙනවා
ඉදිකටු තුඩකින් හාරා
යළි යළි මගෙ හිත පාරනවා

කඳු  මුදුනේ උසට වැඩුණු
පොප්ලර් ගස් දෙපස වැනෙනවා
අතැර නොයන බව පවසා
උනුන් වැළඳ සුවය සොයනවා

පොප්ලර් ගස් අතු අතරේ
දුයිෂෙන් යැයි නුඹ හිනැහෙනවා
මා බලන්න කවදා හෝ
අල්තීනයි ඒවි හිතෙනවා

**ගිවෝන් යානිකා නන්දසේන**

**මගේ සඳ නුඹ**

සඳේ නුඹේ කැලුම් වැදී
හදක හැඟුම් දුරක ඇදී
ඈත නුඹ ගැන පැතුම් බැඳී
නොයනු මැනවි මගෙත් මිදී

වලා කැරළි  පේලි සැදී
නුඹව වහන් කරන් හිඳී
තරු කුමරියො පවුරු බඳී
ලං වන්නට මටද  නොදී

සිතුවිලි රළ ඉවුරු  බිඳී
නුඹෙ උනුසුම් පහස යදී
එනු මැන මා වෙතට ඇදී
සනසමි නුඹ හාදු දිදී

නෙතු හීසර කැලුම් දිදී
ආල නුරා හැඟුම් බඳී
නුඹ මගෙ තුරුලටම වැදී
සොඳුරු ලොවක් මවා හිඳී

**ශිවෝන් යානිකා නන්දසේන**

**අම්මා**

නෙළුම් මලක් ලොව පිපෙනා විලසට

මට සෙනෙහස දුන්නේ....

කඳුළු බිඳක් මගෙ දෙනෙතට වැටෙන්න

නෑ නුබ ඉඩ දුන්නේ......

සිරුරේ  ලේ මව් කිරට හරවලා

මා දැඩි කළ වරුනේ........

දොහොත් මුදුන් දී සදා වදිමි ඔබෙ

පා යුග මම සැණිනේ...................

නෙතින් ගලා යන කඳුළු බිඳක් ලඟ

නුබේ සෙනෙහස ගඟුලේ.......

ගීලි මියෙන්නම් සසර පුරා මම

වෙලී නුබගේ තුරුලේ.....

මහා මෙරක් වන් නොසැලෙන නුබගේ

ඔය හදවත පතුලේ......

අම්මේ මා සැමදා සැණසෙනවා

රැඳී නුඹගේ තුරුලේ .......................

**ඩී.සී. ඉහලගේ**
**TAP Division**

**<u>දුවගේ ටීචර්</u>**

සුන්දර සිනා මුව කොනේ රන්දා උදෑසන අකුරට යන
නිවස එලිකල පහන වී නුඹ පියමනින ලෝකය තුල
උදයේ පිබිදෙන මල් කැකුළු මෙන් දවස අපගේ හැඩකල
දුවත් එක්කල යනෙන ගමනෙදි රස කතා ගොඩ නැංවෙන

අලුත් ටීචර් හරි හොදයි රස කතා කියමින් හැමදින
පන්තියේ හැම ළමයි එක්කල ආදරෙන් කල් ගෙවමින
ඉන්න බව මට කියයි ඈ තව ටීචර් ගැන රස කර කර
අප්පච්චි ඇවිදින් බලන්නකෝ කියා ඉල්ලීමක් එන

කල් ගෙවී ටික ටිකම මේ ලෙස ඔෆිසියේ වැඩ අතරෙම
දිනක් මා එන්නම්ම කීවේ ඇගෙන් බේරුම් නැති තැන
පාසලේ ඉදිරියේ සිටිමින් දෝණී එන මග බල බල
දුවගේ අතකින් අල්ලගෙන ඈ පෙරට එයි සිනහවීගෙන.

හුරු පුරුදු නෙත් දෙකකි වසගෙට ගත්ත මාගේ ඉස්සර
සිනහ මැද නෙත් අදුරු වූයේ මගෙයි අද ඈටත් පෙර
අප්පච්චි මේ තමයි මා කියූ ටීචර් කියමින් උඩපැන
දුවගේ අත්දෙක රැඳී තිබුනා අපේ අත් වල කෙලවර

දෙපස බාධක මැදකදී මා නුඹව දවසක තනිකර
හැරී ආපසු ගියේ එදවස නුබේ සතුට ගැන සිහිකර
කවමදාවත් හමුනොවේ යැයි ගෙවුනු ඒ හෝරා වල
මට වඩා දුක නුඹ විදින්නැති ගෙවූ ඒ මතකය තුල.

**තරිඳු ශ්‍රීනාත් ද සිල්වා**
**රජයේ විගණන අංශය**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**මනුස්සකම.....**

තලා පොඩිකර සැහැල්ලුව
යොමා මනනෙත අකුරු තුලටම
හඹායන වෙත ඉලක්කයටම
ගිලිහිලා අද මනුස්සකම.....

උණුවෙනා ලය මෘදු සුමුදු
හසුවෙලා ඉඩෝරයකට
ඉරිතලා ඇත වර්තමානය
සැගවිලා අද මනුස්සකම.....

එකමුතුව එකට සිටි
ජන කැලක අතීතය
තනිවෙලා අද සිහින ලොවතුල
කොනට විසි වී ඇත මනුස්සකම.....

රැවුම් ගෙරවුම් ඔහීසිය තුල
එකකු අනෙකා පරයමින්
තනිව දිනුමට සැරසෙනා අද
පැනගොසින් අපේ මනුස්සකම........

**ජී.ඒ.එන්.සී.ප්‍රේමරත්න**
**ගිණුම් අංශය**

**මට ඔබ නැති ලොව**

මල් වට්ටියක් මැද මලකි නුඹ

සුවඳ මුසු වූ පිණි පොදේ......

දෝනි නුඹ සුරගනකි මට නම්

සැබෑ වූ සුබ සිහිනේ....

දරන්නට බැරි තරම්

වෙහෙසකර මේ ජීවිතේ....

වාසනාව මට ගෙනාව,

නුඹයි මගේ අමිල සතුට.....

ඈත තුරුපත් ලපළු අතරින්

ඇදෙන සඳ සේලය දිගේ

චන්ද්‍ර මණ්ඩලෙන් පාවුණාදෝ...

පුංචි සඳ සාවිය මගේ...

**ටී. ජී. පවිත්‍රා නෙරංජිකා කරුණාතිලක**
**ZOAA**

**අප්පච්චියේ....**

අඬ අඬා මා උන්නු දවසක

ලඟට ඇවිදින් උරට හිසගෙන

සනස සනසා කියා දුන්නේ

ජීවිතේමයි අප්පච්චි නුඹ ......

විදී ගැහැට දුක් මතක් කර කර

හිමින් අත ගෙන කඳුළු පිස පිස

නුඹේ ඇස්වල කඳුලු ගිල ගිල

මුමුණ මුමුණා කියා දුන්නේ

නිවන් මගමයි අප්පච්චි නුඹ.....

ටිකෙන් ටික නුඹ බැහැරි බැහැරි

තිබූ වාරුව අහිමි වෙද්දී

ලෙඩ ඇඳට වී සනස සනසා

හිතින් අඬ අඬා කියා දුන්නේ

නිවන් මගමයි අප්පච්චියේ නුඹ.....

කඳුළු කැට මගේ රූර රූරා

නවත්තන්නට බැරිම දවසක

නිසොල්මනෙ නුඹ සුදු වතින් අඳ

නිදි ඉද්දී කියා දුන්නේ

මරණෙ නොවෙදැයි අප්පච්චි නුඹ.....

ඇවිලි ඇවිලී තිබුණු පහනක්

නිවී නාවී කළුවර වැටෙද්දී

අඳුර බිඳ මං එළිය වෙන්නට

උර මඩළෙ හිස හොවා ඉන්නට

වරක් එනයවද අප්පච්චි නුඹ......

**සොනාලි අතුකෝරල**
**S - 2**

**අඳුරෙන් එළිය දුටුවෙමි**

පිහිට පතා ආවෙමි දුර කතර ගෙවා
පිහිට වෙන්න සමිඳුනි මා දෙසම බලා
දෝතට ගත් මල් ටික පුදසුනේ තබා
වඳ‍ිනෙමි බෝ සමිඳු නලලේ දෙඅත තබා...

දෙනෙතින් වැටෙන කඳුළු කැට
මගේ කොපුල් සිබියි
වරදක් කලායැයි මගෙ සිත
මටම කියයි...
මව්පියනට එරෙහි වූ බව
ලොවද දනියි
සමිඳුනේ අහන්නකෝ වැරදුනේ
එතැන තමයි...

සමිඳුනේ පිහිට වනු මැන මට
නොකර පමා
ඔහු හැර ගියා මගේ ජීවිතේ අඳුරේ දම‍ා
අඳුරුයි ජීවිතේ මගේ දැන් දිවිය පුරා ...

බෝපත් සිසිල ජීවිතයට දැනෙන විට
අඳුරෙන් එළිය දුටුවෙමි මම නිසැකවම
ජීවත් වෙන්න සිතුනා මට පෙර ලෙසම
කසාවතින් බෝසමිඳුගේ සෙවන යට.......

**ඉමල්කා රූපසිංහ**
**(SPA)**

**යදින සෙනෙහස**

කතරගම සුරිඳුනේ
ලොව දෙස බලමිනේ
කියනු මැන මා හට
ඔහු  කොතැන සැඟවුනේ.........

රකුසු නෙත් ඇති නොමිනිසුන්
රැගෙන ගියේ ඔහු තරහින්
වරද කිමෙක්දැයි නොකියමින්
මටද කුරිරු කම් කරමින්......

වන පස් මල් තැබුවා
කොඩිවැල්ද බැන්දා
පලතුරු වලින් පිදුවා
පලක් නැත මට
මගේ හිමි නැතුවා.....

සොයා දෙනු මැන මා හට
මගේ හිමියන් හනිකට
බලනු මැන දෙනෙත් හැර
පොඩි එවුන් හඬනා තරම...

මම මොනවා කියන්නද
අසරණයි මම මෙලෙස
සුරිඳුනි කතරගම
රැක දෙන්න යලි මගේ සෙනෙහස....

**ඉමල්කා රූපසිංහ**

**දිගැසියේ දිගු නීල නයන**

නෙත රසඳුන මෘදු මදහස

දැක ගන්නට ඇත්නම්...

සරා සඳට අභිමුව සිට

මන්දහාස නගන නයන

සියුමැලි වූ නුඹ සඳකොපුල්

සිපගන්නට ඇත්නම්...

අරුණැල්ලේ පවන් රොදක

පිපි හිනැහෙන කඩුපුල් මල

නුඹම උනානම්....

සැනසෙන්නට සදාතනික

දිගැසියේ දිගු නීල නයන

සතපා නුඹෙ දෙකොපුල් මත

සනසාලන්නම්......

**ගමගේ පුෂ්පසිරි**
**ප්‍රවාහන අංශය**

**සුදු නෙළුමක් පිපිලා**

දිය ගලා ගිය
දිය සිඳුනු මුඩු පොළවේ
සුදු නෙළුමක් පිපිලා......

ඉර මුවාකර සඳ එළිය දැවෙමින්
ගත වෙහෙසකර පැටවුන්ගෙ නාමෙන්
අතුපැලේ නොයිදෙන
රූප කොළවල රස අහර බුදිනා
සුදු නෙළුම පිපිලා......

ගත වාරුකර ගන්නට නොහැකිව
දෙව් බබුන් වැඩි බිමක පොර බදින
කඳුළු දියකර පුතුට පොවනා
නුඹයි අම්මා පුතුගෙ දිවි යදිනා
සුදු නෙළුමක් පිපිලා......

**ගමගේ පුෂ්පසිරි**
**ප්‍රවාහන අංශය**

# කාටූන් චිත්‍ර

# Cartoon








The battle between print and electronic books wages on





Prathibha Vol' 3 – 2024

ISSN 2961-5224

**National Audit Office**
**Battaramulla**